# 1

# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ

රජය සහ මහ බැංකුව විසින් සිදු කරන ලද සුවිශේෂී ප්‍රතිපත්තිමය මැදිහත්වීම් තුළින්, 2020 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සංකීර්ණ අභියෝගයන්ට කාර්යක්ෂම ලෙස මුහුණ දුන්නේය. කොවිඩ්-19 වසංගතයෙන් පැන නැගුණු ගැටලු හේතුවෙන් සමාජ ආර්ථික බලපෑම් ඇති වීම සහ, එහි ප්‍රතිඵලයක් ලෙස කුටුම්භ ඒකක හා ව්‍යාපාර වෙත වූ බලපෑම අවම කිරීම සඳහා මෙම ප්‍රතිපත්තිමය මැදිහත්වීම් අත්‍යවශ්‍ය විය. එසේම, ආර්ථිකය තුළ විශ්වාසනීයත්වය තහවුරු කිරීමටත්, එමගින් සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව මත ඇති කෙරෙන දැඩි පීඩනය වළක්වාලීමටත් එවැනි මැදිහත්වීම් අවශ්‍ය විය.

වසංගතය හේතුවෙන් ගෝලීය ආර්ථිකයෙහි ඇති වූ පසුබෑම හා සමගාමීව, නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විශාලතම ආර්ථික අවපාතය වාර්තා කරමින්, 2020 වසරේ දී ආර්ථිකය මූර්ත වශයෙන් සියයට 3.6කින් සංකෝචනය විය. කොවිඩ්-19 ව්‍යාප්තිය වැළැක්වීමේ අරමුණ ඇතිව දේශීය හා ගෝලීය වශයෙන් පැනවූ සංචරණ සීමා සහ අනෙකුත් ක්‍රියාමාර්ග හේතුවෙන් ආර්ථිකයේ සෑම අංශයකම මූර්ත ආර්ථික කටයුතුවලට බාධා එල්ල විය. ඉදිකිරීම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස පසුබෑමකට ලක් වීම හේතුවෙන් වසර තුළ දී කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල තියුණු පහළ යෑමක් දක්නට ලැබුණි. වසංගතය හේතුවෙන් ප්‍රවාහන, වෙනත් පෞද්ගලික සේවා සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවාවල සිදු වූ පහළ යෑමත් සමඟ සේවා අංශයෙහි ක්‍රියාකාරකම්වල ද සැලකිය යුතු සංකෝචනයක් වාර්තා විය. කාලෝචිත ප්‍රතිපත්ති තුළින් ලද සහාය සහ හිතකර කාලගුණික තත්ත්වයන්හි ධනාත්මක බලපෑම ඉක්මවා වසංගතයෙහි බලපෑම ඉස්මතු වීම හේතුවෙන් කෘෂිකාර්මික අංශය ද වසර තුළ දී සංකෝචනය විය. ආයෝජක අපේක්ෂා මන්දගාමී වීම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී ආයෝජන වියදම් සංකෝචනය වූ අතර, පරිභෝජන වියදමෙහි සුළු වර්ධනයක් දක්නට ලැබුණි. ජාතික ඉතුරුම්වල පහළ යෑම ඉක්මවා ආයෝජන වියදම අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ දී ඉතුරුම්-ආයෝජන පරතරය අඩු විය. මේ අතර, වසංගතය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතා මධ්‍යයේ, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය පහත වැටුණු අතර, 2009 වසරින් පසුව ප්‍රථම වරට සේවා වියුක්ති අනුපාතිකය සියයට 5 ඉක්මවීය. පවත්නා වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පහළ යෑමේ සහ එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින්, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය පෙර වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 3,852 සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් 3,682ක් දක්වා පහළ ගියේය. සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය, 2019 වසරේ එ.ජ. ඩොලර් බිලියන 84.0ක සිට 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 80.7ක් දක්වා පහළ යෑමට ද වසංගතය හේතු විය. සමස්තයක් ලෙස ආර්ථිකය සංකෝචනය වුව ද, රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති යන දෙ අංශයම තුළින් ක්‍රියාවට නැංවූ

1

*වර්ධනාභිමුඛ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින්, 2020 වසරේ දෙවන භාගයේ දී ආර්ථිකය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළේය.*

*රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, විදේශීය අංශය 2020 වසර තුළ දී මුහුණ දීමට සිදු වූ ප්‍රබල බාධකයන්ට එරෙහිව ක්‍රියාත්මක විය. ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ගේ අවදානම්වලට මුහුණ දීමේ හැකියාව පිළිබිඹු කරමින්, සංචරණ සීමා පැනවීම සහ සමාජ ආර්ථික කටයුතු සීමා කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් අඩු වූ වෙළඳ භාණ්ඩ අපනයන කඩිනමින් යථා තත්ත්වයට පත්විය. ඒ අනුව, කෙටි කාලපරිච්ඡේදයක් තුළ දී අපනයන ඉපැයීම් වසංගතයට පෙර පැවති මට්ටමට නැවත ළඟා විය. අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ලෝක වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතීම, 2020 වසරේ ආනයන වියදම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. ගෝලීය වශයෙන් සංචරණ සීමා පැනවීම හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රය දැඩි බලපෑමකට ලක්විය. වසංගතය මධ්‍යයේ වැඩ කිරීම සම්බන්ධයෙන් නිර්මාණය වූ නව්‍ය වාතාවරණයේ සහාය ලබමින්, තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (IT/BPO) යන අංශයට අදාළ සේවා වෙළඳාම මත විදේශ විනිමය ඉපැයීම් සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. වසංගතය ආරම්භ වීමත් සමඟ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල පහළ යෑමක් දක්නට ලැබුණ ද, 2020 වසර තුළ දී ප්‍රේෂණ ලැබීම් සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත් විය. මෙම වර්ධනයන් සහ ප්‍රතිපත්ති ගැළපීම් සමඟ, විදේශීය ජංගම ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ වාර්තා වූ සියයට 2.2 සිට 2020 වසරේ දී සියයට 1.3ක් දක්වා අඩු විය. මේ අතර, ගෝලීය අවිනිශ්චිතතා ඉහළ යෑම සහ විදේශීය ඍජු ආයෝජන හා විවිධ ආයෝජන සම්බන්ධයෙන් ආයෝජකයින් අනුගමනය කළ ආරක්ෂාකාරී ප්‍රවේශය හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු විය. 2020 මාර්තු-අප්‍රේල් කාලය තුළ හා 2020 වසර අවසාන කාලයේ දී පීඩනයක් පැවතිය ද, සුදුසු ක්‍රියාමාර්ග ඔස්සේ විනිමය අනුපාතිකයෙහි සැලකිය යුතු විචලතා වළක්වා ගැනුණු අතර, 2020 වසර තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීම සියයට 2.6කට සීමා විය. සමස්තයක් ලෙස, 2020 වසර තුළ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කළ අතර, 2020 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 5.7ක් වූ දළ නිල සංචිත ප්‍රමාණය මාස 4.2ක ආනයන සඳහා ප්‍රමාණවත් විය.*

*2020 වසර ආරම්භ වන විට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් මන්දගාමීව පැවති ආර්ථිකයට සහාය සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබිණි. කෙසේ වෙතත්, වසංගතයේ බලපෑම හේතුවෙන් 2020 වසර තුළ දී රාජ්‍ය මූල්‍ය කටයුතු සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දීමේ ප්‍රතිඵලයක් ලෙස ආදායම් රැස් කිරීම අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පැවති අතර, පුනරාවර්තන වියදම් ඉහළ ගියේය. වසංගතය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් මත ඇති වූ බලපෑම මෙන්ම, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය හේතුවෙන් ප්‍රාග්ධන වියදම අඩු විය. රාජ්‍ය මූල්‍ය කටයුතු මත වූ දැඩි පීඩනය පිළිබිඹු කරමින්, 2020 වසරේ දී වර්තන ගිණුමේ හා ප්‍රාථමික ශේෂයන්හි හිඟයයන් ඉහළ යෑමත්, සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.1ක් ලෙස වාර්තා වීමත් සමඟ සමස්ත රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය අපේක්ෂා කළ මට්ටමට වඩා දුර්වල විය. ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිය පහත හෙළීම සහ අහිතකර ගෝලීය මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ විදේශීය මූල්‍යනය සඳහා වූ සීමිත ප්‍රවේශය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අංශය මත වූ පීඩනය දැඩි විය. විදේශීය මූලාශ්‍රවලින් අරමුදල් ලබාගැනීම සඳහා වන සීමිත ප්‍රවේශය සහ මැදි කාලීනව විදේශීය මූලාශ්‍ර මගින් කෙරෙන මූල්‍යනය අවම කිරීම සඳහා වූ රජයේ ප්‍රකාශිත මූල්‍යන උපායමාර්ගය පිළිබිඹු කරමින්, 2020 වසර තුළ දී අයවැය හිඟය දේශීය මූලාශ්‍ර තුළින් මූල්‍යනය කෙරිණි. අයවැය හිඟය ඉහළ යෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍යන අවශ්‍යතා ඉහළ යෑම මෙන්ම, ද.දේ.නි.ය සංකෝචනය වීම තුළින් මධ්‍යම රජයේ ණය සමස්තය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසර අවසානයේ පැවති සියයට 86.8 සිට 2020 වසර අවසානය වන විට සියයට 101.0ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, මධ්‍යම රජයේ සමස්ත නොපිය වූ ණය*

ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස නොපිය වූ විදේශීය ණය සමස්තය 2019 වසර අවසානයේ වාර්තා වූ සියයට 47.6 සිට 2020 වසර අවසානයේ දී සියයට 40.0ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. අහිතකර වෙළඳපොළ සමපේක්ෂණයන් මධ්‍යයේ වුව ද, රජය, සිය ණය සේවාකරණය සම්බන්ධයෙන් මෙතෙක් පවත්වා ගන්නා ලද නොබිඳුණු වාර්තාව අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කළේය. සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළ වුව ද, මහ බැංකුවෙහි සහ බැංකු අංශයෙහි මූල්‍ය සහයෝගය ඇතිව, වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් හට සහන සැලසීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කළේය.

මේ අතර, අඩු උද්ධමන පීඩන මෙන්ම මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා මගින් 2020 වසර තුළ දී සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස ලිහිල් කිරීම සඳහා අවශ්‍ය අවකාශය මහ බැංකුව වෙත ලැබිණි. ව්‍යාපාර හා පුද්ගලයන්ගේ අරමුදල් පිරිවැය අඩු කිරීම, මුදල් වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පැවතීම තහවුරු කිරීම සහ වසංගතය මගින් නිර්මාණය කරන ලද අභියෝගාත්මක තත්ත්වයන් යටතේ මූල්‍ය පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වයක් තහවුරු කිරීම මෙම ක්‍රියාමාර්ගවල අරමුණු විය. ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉතිහාසයේ වූ අවම මට්ටම් දක්වා පදනම් අංක 250කින් අඩු කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පදනම් අංක 300කින් පහත දැමීම මෙන්ම, බැංකු අනුපාතිකය පදනම් අංක 650කින් අඩු කිරීම තුළින් මහ බැංකුව විසින් 2020 වසර තුළ දී අතිශයින්ම ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවන ලදී. මීට අමතරව, වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධනය සැපයීම ඉලක්ක කරගනිමින් මහ බැංකුව විසින් සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙනු ලැබීය. තවද, තෝරා ගත් මූල්‍ය උපකරණවලට අදාළ ණය අනුපාතික පහළ යෑම වේගවත් කිරීම සඳහා මහ බැංකුව විසින් ඍජු ක්‍රියාමාර්ග මෙන්ම ශිෂ්ට ප්‍රයෝග ද යොදා ගන්නා ලදී. ඒ අනුව, 2020 වසරේ දෙවන භාගයේ සිට පෞද්ගලික අංශයට සපයන ලද ණය යථා තත්ත්වයට පත්වීම ආරම්භ විය. මේ අතර, මහ බැංකුව සහ බැංකු අංශය විසින් වසංගතය මධ්‍යයේ අවහිරතාවකින් තොරව රාජ්‍ය මූල්‍ය කටයුතු පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය මූල්‍යන පහසුකම් සපයන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, අනෙකුත් අංශ සඳහා වූ ණය ප්‍රසාරණයට අමතරව, බැංකු අංශය විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය 2020 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එමගින් පුළුල් මුදල් සැපයුමෙහි සැලකිය යුතු ප්‍රසාරණයක් ඇති විය. මේ අතර, වසංගතය හේතුවෙන් ආර්ථිකයට අවශ්‍ය වන සුවිශේෂී සහාය සැපයීම සඳහා මූල්‍ය අංශය සවිබල ගන්වන අතරම, මූල්‍ය ආයතනවල අභිප්‍රායයන් සුරක්ෂිත කිරීම මෙන්ම, එම ආයතනවල තැන්පත්කරුවන් ආරක්ෂා කරගැනීම ඉලක්කකර ගනිමින් විවිධ ක්‍රියාමාර්ග හඳුන්වාදීම හරහා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව පවත්වා ගැනීම තහවුරු කරන ලදී.

වසංගතය තුළින් පැන නැගුණු කෙටි කාලීන අභියෝග සඳහා විසඳුම් සෙවීම කඩිනම් සහ ප්‍රමුඛ කාර්යයක් වශයෙන් පවතින අතර, ඉදිරියේ දී රටේ දිගුකාලීන වර්ධන ප්‍රවණතාවට බාධා පමුණුවමින් දීර්ඝ කාලයක් පුරා පවතින ව්‍යුහාත්මක ගැටලු විසඳාලීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. රජයේ නව්‍ය ආර්ථික ප්‍රතිපත්ති රාමුව මගින් ආර්ථික වර්ධනය සඳහා වන බාධාවන්ට විසඳුම් ලබා දීමට අපේක්ෂා කෙරෙන අතර, ණය බර ඇති නොකරන විදේශ විනිමය ලැබීම් වර්ධනය කරමින්, විශේෂයෙන් ම, කෘෂිකාර්මික අංශය සහ හඳුනාගත් නිෂ්පාදන හා අපනයන කර්මාන්ත හරහා දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. වසංගතය තුළින් ඇති වූ අභියෝග මගින්, තිරසාර වර්ධනය, සංවර්ධනය හා දිගු කාලීන ස්ථායීතාව අත් කර ගැනීම සඳහා වූ නව්‍ය ප්‍රවේශයක අවශ්‍යතාව අවධාරණය විය. මැදි කාලීනව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව තහවුරු කිරීමට කැපවෙන අතරම, ඉහත ප්‍රතිපත්ති රාමුව සඳහා සහාය දක්වමින්, සිය වර්ධන හිතකර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගැනීමට සහ ඵලදායීතාව ඉහළ නංවන ප්‍රතිසංස්කරණ සක්‍රීයව ක්‍රියාවට නැංවීමට රජය අපේක්ෂා කරයි. මේ අතර, මහ බැංකුව තවදුරටත් ආර්ථික, මිල හා මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යෑම සඳහා කැප වනු ඇති අතර, එමගින් මැදි කාලීනව ඉහළ වර්ධන විභවතාවක් අත්කර ගැනීම සඳහා ආර්ථිකයට සහාය සැපයෙනු ඇත.

1

### 1.1 සංඛ්‍යා සටහන
### සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2016-2020)

| දර්ශකය | ඒකකය | 2016 | 2017 | 2018 | 2019 (අ) | 2020 (ආ) |
|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය (ඇ)** | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 4.5 | 3.6 | 3.3 (අ) | 2.3 (ආ) | -3.6 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 11,996 | 13,328 | 14,291 (අ) | 15,013 (ආ) | 14,973 |
| ඒක පුද්ගල ද.දේ.නි. (ඈ) | එ.ජ. ඩොලර් | 3,886 | 4,077 | 4,057 (අ) | 3,852 (ආ) | 3,682 |
| **විදේශීය අංශය** | | | | | | |
| වෙළඳ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -10.8 | -11.0 | -11.8 (අ) | -9.5 | -7.4 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -2.1 | -2.6 | -3.2 | -2.2 | -1.3 |
| සමස්ත ශේෂය | එ.ජ. ඩොලර් මිලියන | -500 | 2,068 | -1,103 | 377 | -2,328 |
| විදේශීය නිල සංචිත | එ.ජ. ඩොලර් මිලියන | 6,019 | 7,959 | 6,919 | 7,642 | 5,664 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)** | | | | | | |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -0.6 | -0.7 | -1.2 | -3.6 (ඊ) | -7.9 |
| ප්‍රාථමික ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -0.2 | 0.02 | 0.6 | -3.6 (ඊ) | -4.6 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.3 | -5.5 | -5.3 | -9.6 (ඊ) | -11.1 |
| මධ්‍යම රජයේ ණය (උ) | ද.දේ.නි.යේ % වශයෙන් | 79.0 | 77.9 | 84.2 | 86.8 | 101.0 |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (ඌ) | සියයට | 18.4 | 16.7 | 13.0 | 7.0 | 23.4 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (ඌ) | සියයට | 21.6 | 14.7 | 15.9 | 4.2 | 6.5 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (එ) | සියයට | 4.0 | 6.6 | 4.3 | 4.3 | 4.6 |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ඈ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.

(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද 2018 සහ 2019 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ඊ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.

(උ) 2013 මාර්තු මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරුණි) සහ 2012 ජනවාරි මාසයේ දී රජයේ ආයතන විසින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662කි) ඇතුළත් වේ.

(ඌ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

(එ) කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

## 1.2 2020 වසරේ සාර්ව ආර්ථික ප්‍රවණතා[1]

### මූර්ත අංශයේ ප්‍රවණතා සහ උද්ධමනය

**කොවිඩ්-19 වසංගතයේ බලපෑම පිළිබිඹු කරමින් 2020 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය පසුබෑමට ලක් විය.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ජාතික ගිණුම් ඇස්තමේන්තුවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය, පසුගිය වසරේ වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 3.6කින් සංකෝචනය විය. කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා දිවයින පුරා සමාජ ආර්ථික කටයුතු සීමා කිරීම හේතුවෙන් වසරේ දෙවන කාර්තුවේ දී ආර්ථිකය වාර්ෂික ලක්ෂ්‍යමය

### 1.1 රූප සටහන
### ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා ආංශික දායකත්වය




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ මැද භාගයේ දී ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වසර වෙනස් කර ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. 2015 වසර නව පදනම් වසර වන බැවින්, එසේ පදනම් වසර වෙනස් කිරීම හේතුවෙන් 2015 වසරේ සිට ජාතික ගිණුම් සහ ඒ හා සම්බන්ධ අනුපාතික නැවත නිර්වචනය කිරීම අවශ්‍ය වනු ඇත.

පදනම මත සියයට 16.4කින් සංකෝචනය වීම, 2020 වසරේ දී ආර්ථිකයේ සමස්ත සංකෝචනයක් වාර්තා වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඔක්තෝබර්-නොවැම්බර් මාසවල දී වසංගතයේ දෙවන රැල්ලත් සමඟ ඇති වූ බාධා මධ්‍යයේ වුව ද, වසරේ දෙවන භාගයේ දී ආර්ථිකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 1.3ක මූර්ත වර්ධනයක් වාර්තා කරමින් නැවත යථා තත්ත්වයට පත් විය. පෙර වසරට සාපේක්ෂව, 2020 වසරේ දී කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය සියයට 2.4කින් ද, කාර්මික අංශය සියයට 6.9කින් ද, සේවා අංශය සියයට 1.5කින් ද වශයෙන් ආර්ථිකයේ සියලුම අංශ සංකෝචනය විය. කෘෂිකාර්මික අංශයෙහි, මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී වගාව, වන වගාව හා දැව කැපීම යන උප අංශ වසංගතය නිසා ඇති වූ බාධා හේතුවෙන් සැලකිය යුතු ලෙස සංකෝචනය වූ අතර, 2019 වසරේ පැවති වියළි කාලගුණික තත්ත්වයන්හි පසු බලපෑම් හේතුවෙන් තෙල් සහිත පලතුරු බෝග වගා කිරීමේ කටයුතුවල ද සංකෝචනයක් සිදු විය. දේශීය වශයෙන් කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම හේතුවෙන් එළවළු, සහල්, පලතුරු සහ සහල් හැර වෙනත් ධාන්‍ය වර්ග වගා යන උප අංශ 2020 වසරේ දී හිතකර කාර්ය සාධනයක් වාර්තා කළේය. කර්මාන්ත අංශය තුළ, ආහාර, බීම වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය 2020 වසරේ දී වර්ධනයක් පෙන්නුම් කළ ද, ඉදිකිරීම්, රෙදිපිළි, ඇඟලුම්, සම් සහ සම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය මෙන්ම, පතල් හා කැණීම් යන අංශවල ක්‍රියාකාරකම් කර්මාන්ත අංශයේ කටයුතුවල පසුබෑම සඳහා දායක විය. සේවා අංශය සැලකීමේ දී, මූල්‍ය සහ මූල්‍ය අතරමැදි සේවා, විදුලි සංදේශ හා තොග හා සිල්ලර වෙළඳ කටයුතු 2020 වසර තුළ දී වර්ධනයක් පෙන්නුම් කළ අතර, එමගින් වසර තුළ දී සංචරණ සීමා, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ අවශ්‍යතා සහ දේශ සීමා වසා තැබීම

**1.2 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2010) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)**

| ආර්ථික කටයුතු | රු. මිලියන | | දදේනි. යෙහි ප්‍රතිශතයක් ලෙස (%) | | වර්ධනය (%) | | වර්ධනය සඳහා දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **686,412** | **669,802** | **6.9** | **7.0** | **1.0** | **-2.4** | **0.1** | **-0.2** |
| කෘෂිකර්මාන්තය සහ වන වගාව | 573,026 | 575,280 | 5.8 | 6.0 | 2.1 | 0.4 | 0.1 | 0.0 |
| ධීවර කර්මාන්තය | 113,386 | 94,522 | 1.1 | 1.0 | -4.3 | -16.6 | -0.1 | -0.2 |
| **කර්මාන්ත** | **2,608,211** | **2,427,844** | **26.4** | **25.5** | **2.6** | **-6.9** | **0.7** | **-1.8** |
| පතල් සහ කැණීම් කර්මාන්ත | 231,893 | 202,873 | 2.3 | 2.1 | 2.8 | -12.5 | 0.1 | -0.3 |
| නිෂ්පාදන කර්මාන්ත | 1,540,969 | 1,481,305 | 15.6 | 15.5 | 1.8 | -3.9 | 0.3 | -0.6 |
| විදුලිය, ගෑස්, ජලය සහ කසළ කළමනාකරණය | 151,978 | 150,702 | 1.5 | 1.6 | 4.9 | -0.8 | 0.1 | -0.0 |
| ඉදිකිරීම් | 683,371 | 592,963 | 6.9 | 6.2 | 4.0 | -13.2 | 0.3 | -0.9 |
| **සේවාවන්** | **5,678,485** | **5,595,469** | **57.5** | **58.7** | **2.2** | **-1.5** | **1.3** | **-0.8** |
| තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම සහ නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 2,273,094 | 2,159,819 | 23.0 | 22.7 | 1.7 | -5.0 | 0.4 | -1.1 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 73,378 | 83,444 | 0.7 | 0.9 | 15.7 | 13.7 | 0.1 | 0.1 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 1,398,938 | 1,469,191 | 14.2 | 15.4 | 2.4 | 5.0 | 0.3 | 0.7 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 1,128,115 | 1,061,637 | 11.4 | 11.1 | 2.2 | -5.9 | 0.2 | -0.7 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 804,959 | 821,377 | 8.1 | 8.6 | 2.3 | 2.0 | 0.2 | 0.2 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **8,973,108** | **8,693,114** | **90.8** | **91.2** | **2.2** | **-3.1** | **2.0** | **-2.8** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු-සහනාධාර | 910,242 | 837,491 | 9.2 | 8.8 | 2.4 | -8.0 | 0.2 | -0.7 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | **9,883,350** | **9,530,606** | **100.0** | **100.0** | **2.3** | **-3.6** | **2.3** | **-3.6** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -281,083 | -405,185 | | | -6.3 | -44.2 | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | **9,602,267** | **9,125,421** | | | **2.1** | **-5.0** | | |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද දදේනි. ඇස්තමේන්තු පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1

හේතුවෙන් බලපෑමට ලක් වූ ගබඩා පහසුකම් සැපයීම ද ඇතුළු මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා, වෙනත් පුද්ගලික සේවා සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ආශ්‍රිත සේවා යන උප අංශ මගින් ඇති වූ බලපෑම තුනී විය. වසර තුළ දී බදු ආදායම අඩු වීමේ සහ නිෂ්පාදන සහනාධාර වැඩි වීමේ බලපෑම නිරූපණය කරමින්, 2020 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.යේ) බදු සහනාධාර අංශය සියයට 8.0කින් පහළ ගියේය.

**නාමික අගයයන් සැලකූ විට, ශ්‍රී ලංකා ආර්ථිකය පෙර වසරේ දී වාර්තා කළ සියයට 5.1ක වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී සියයට 0.3කින් සංකෝචනය විය.** මෙය, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමත් සමඟ, සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය පෙර වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 84.0ට සාපේක්ෂව, 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 80.7ක් දක්වාත්, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2019 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 3,852ට සාපේක්ෂව 2020 වසරේ දී එ.ජ. ඩොලර් 3,682ක් දක්වාත් අඩු වීමට හේතු විය. වියදම් අංශය සැලකීමේ දී, පවත්නා මිල ගණන් යටතේ පරිභෝජන වියදම 2019 වසරේ දී දක්නට ලැබුණු සියයට 7.4ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 2.1ක මන්දගාමී වර්ධනයක් වාර්තා කර තිබේ. විශේෂයෙන්ම, පෙර වසරේ දී සියයට 7.3ක වර්ධනයක් වාර්තා කළ ගෘහස්ත පරිභෝජනය 2020 වසරේ දී සියයට 1.0ක සුළු වර්ධනයක් වාර්තා කළේය. නාමික අගයයන් සැලකීමේ දී රජයේ පරිභෝජන වියදම, 2019 වසරේ දී වාර්තා කළ සියයට 8.1ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 9.8ක වර්ධනයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පවත්නා මිල ගණන් යටතේ ද.දේ.නි. සඳහා පරිභෝජන වියදම්වල දායකත්වය, 2019 වසරේ දී වාර්තා වූ සියයට 79.3ක සිට 2020 වසරේ දී සියයට 81.1ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2019 වසරේ දී සියයට 5.5ක සංකෝචනයක් වාර්තා කළ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, 2020 වසරේ දී, පවත්නා මිල ගණන් යටතේ, සියයට 6.2කින් තවදුරටත් පහළ ගියේය. නාමික ද.දේ.නි. සඳහා දළ දේශීය

**1.3 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් - ආයෝජන පරතරය (අ)(ආ)**


| ශීර්ෂය | රුපියල් බිලියන | | වර්ධනය (%) | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|---|---|
| | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 | 2019 (ඇ) | 2020 |
| **1. දේශීය ඉල්ලුම** | **15,932.4** | **15,924.7** | **3.8** | **0.0** | **106.1** | **106.4** |
| 1.1 පරිභෝජනය | 11,902.2 | 12,146.2 | 7.4 | 2.1 | 79.3 | 81.1 |
| පෞද්ගලික | 10,485.2 | 10,589.7 | 7.3 | 1.0 | 69.8 | 70.7 |
| රාජ්‍ය | 1,417.0 | 1,556.5 | 8.1 | 9.8 | 9.4 | 10.4 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 4,030.2 | 3,778.5 | -5.5 | -6.2 | 26.8 | 25.2 |
| **2. ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-919.4** | **-951.7** | **13.4** | **-3.5** | **-6.1** | **-6.4** |
| භාණ්ඩ හා සේවා අපනයන | 3,472.3 | 2,483.1 | 5.5 | -28.5 | 23.1 | 16.6 |
| භාණ්ඩ හා සේවා ආනයන | 4,391.7 | 3,434.8 | 0.9 | -21.8 | 29.3 | 22.9 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)** | **15,013.0** | **14,973.0** | **5.1** | **-0.3** | **100.0** | **100.0** |
| **4. දේශීය ඉතුරුම් (3-1.1)** | **3,110.8** | **2,826.8** | **-2.9** | **-9.1** | **20.7** | **18.9** |
| පෞද්ගලික | 3,644.5 | 4,007.2 | 8.0 | 10.0 | 24.3 | 26.8 |
| රාජ්‍ය | -533.7 | -1,180.4 | -214.4 | -121.2 | -3.6 | -7.9 |
| **5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඈ)** | **-432.2** | **-405.2** | **-10.9** | **6.3** | **-2.9** | **-2.7** |
| **6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඈ)** | **1,030.7** | **1,154.4** | **3.1** | **12.0** | **6.9** | **7.7** |
| **7. ජාතික ඉතුරුම් (4+5+6)** | **3,709.2** | **3,576.0** | **-2.7** | **-3.6** | **24.7** | **23.9** |
| **8. ඉතුරුම්-ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2) | -919.4 | -951.7 | | | -6.1 | -6.4 |
| ජාතික ඉතුරුම්-ආයෝජන (7-1.2) | -321.0 | -202.5 | | | -2.1 | -1.4 |
| **9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඈ)** | **-321.0** | **-202.5** | | | **-2.1** | **-1.4** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


ප්‍රාග්ධන සම්පාදනයේ දායකත්වය, 2019 වසරේ දී සියයට 26.8ක සිට 2020 වසරේ දී සියයට 25.2ක් දක්වා පහළ ගියේය. ජාත්‍යන්තර ඉල්ලුම මන්දගාමී වීම, දේශ සීමා වසා දැමීම හේතුවෙන් සංචාරක කර්මාන්තයට දැඩි ලෙස බලපෑමක් ඇති වීම මෙන්ම, විදේශීය අංශය වෙත එල්ල වී ඇති පීඩනය අවම කිරීම අරමුණු කරගනිමින් ආනයන සීමා පැනවීම ඇතුළු සියලු කරුණුවල ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින්, 2019 වසරේ දී සියයට 13.4කින් වර්ධනය වූ පවත්නා මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවා සඳහා වන ශුද්ධ විදේශ ඉල්ලුම, 2020 වසරේ දී සියයට 3.5කින් සංකෝචනය විය. පුද්ගලික ඉතුරුම් ඉහළ ගිය ද, රජයේ නිර්-ඉතුරුම් හමුවේ නාමික අගයයන් යටතේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්, 2019 වසරේ දී වාර්තා වූ සියයට 20.7ක සිට 2020 වසරේ දී සියයට 18.9ක් දක්වා පහළ ගියේය. 2020 වසරේ දී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පහළ යෑම ඉක්මවා දේශීය ඉතුරුම් අඩු වීම පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය, 2019 වසරේ දී වාර්තා වූ සියයට -6.1ක සිට 2020 වසරේ දී -6.4ක් දක්වා පුළුල් විය. කෙසේ වෙතත්, විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම සහ විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම යහපත් තත්ත්වයට පත් වීම හේතුවෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම්, 2019 වසරේ දී වාර්තා වූ සියයට 24.7ක සිට 2020 වසරේ දී සියයට 23.9ක් දක්වා පමණක් අඩු විය. දේශීය ආයෝජන තීව්‍ර ලෙස පහළ යෑම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය 2019 වසරේ දී වාර්තා වූ සියයට -2.1ක සිට 2020 වසරේ දී සියයට -1.4ක් දක්වා වර්ධනය වීමට හේතු විය.

**1.2 රූප සටහන**
**ඉතිරිකිරීම්, ආයෝජන සහ ඉතුරුම්-ආයෝජන පරතරය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**1.3 රූප සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
(අ) 2020 කාර්තු හතරේ සාමාන්‍යය


**වසංගතයේ බලපෑම සේවා වියුක්ති අනුපාතිකය මෙන්ම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය තුළින් නිරූපණය විය.** ඒ අනුව, පෙර වසරේ සියයට 4.8ක් වූ සේවා වියුක්ති අනුපාතිකය 2020 වසරේ දී සියයට 5.5ක් දක්වා ඉහළ ගියේය. 2019 වසරේ දී, පිළිවෙළින්, සියයට 3.3ක් සහ සියයට 7.4ක් වූ පුරුෂ හා ස්ත්‍රී සේවා වියුක්තිය, 2020 වසරේ දී, පිළිවෙළින්, සියයට 4.0ක් සහ සියයට 8.4ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, කොවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා සංචරණ සීමා පැනවීමත් සමඟ, ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය, පෙර වසරේ වාර්තා වූ සියයට 52.3ක සිට 2020 වසරේ දී සියයට 50.6ක් දක්වා පහළ ගියේය. 2019 වසරේ දී, පිළිවෙළින්, සියයට 73.0ක් සහ සියයට 34.5ක් වූ පුරුෂ සහ ස්ත්‍රී දෙපාර්ශ්වයේ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2020 වසරේ දී, පිළිවෙළින්, සියයට 71.9ක් සහ සියයට 32.1ක් දක්වා පහළ ගියේය. කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශ සමස්ත සේවා නියුක්තියෙන්, පිළිවෙලින්, සියයට 27.1කට, 26.9කට සහ 46.0කට දායකත්වය ලබා දී ඇත.

**2020 වසර පුරා මතුපිට උද්ධමනය සමස්තයක් වශයෙන් සියයට 4-6 අතර අපේක්ෂිත පරාසය තුළ රැඳී පැවති අතර, මූලික උද්ධමනය පහළ මට්ටමක පැවතුණි.** වසංගතය හේතුවෙන් ඇති වූ සැපයුම් අවහිරතා සහ විශේෂයෙන් ම, ඇතැම් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ආහාර කාණ්ඩයේ උද්ධමන පීඩනය ඉහළ යෑම මධ්‍යයේ වුව ද, අඩු ඉල්ලුම් තත්ත්වයන්, මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා[2] සහ පහළ දැමූ පරිපාලිත මිල ගණන්, උද්ධමනය ඉලක්කගත මට්ටමෙහි පවත්වා ගැනීමට උපකාරී විය.

2 ව්‍යාපාර අංශය හා කුටුම්භ අංශය ආවරණය වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කෙරෙන උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මත පදනම් වේ.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2013 = 100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2020 වසරේ මුල් කාලයේ දී අපේක්ෂිත පරාසයේ ඉහළ සීමාව ආසන්නයේ විචලනය වූ අතර, 2020 පෙබරවාරි මාසයේ දී එය සියයට 6.2ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, ආහාර හා ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය පහළ යෑමත් සමඟ, වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය අඩු වූ අතර, එය 2019 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 4.8ට සාපේක්ෂව, 2020 වසර අවසානයේ දී සියයට 4.2ක් ලෙස වාර්තා විය. ආහාර අයිතම සඳහා වැඩි බර තැබීමක් සිදු කරන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013 = 100) මත පදනම් වූ මතුපිට උද්ධමනය ද, සමස්තයක් වශයෙන් කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනයේ ප්‍රවණතාවය පෙන්නුම් කළේය. ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2019 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 6.2කට සාපේක්ෂව, 2020 පෙබරවාරි මාසයේ දී සියයට 8.1ක උපරිම අගයක සිට 2020 වසර අවසානයේ දී සියයට 4.6ක් දක්වා ක්‍රමයෙන් පහත වැටුණි. තවද, ආහාර හා ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම උද්ධමනය පහළ යෑම සහ පසුගිය වසරේ අනුරූප කාල සීමාව තුළ පැවති ඉහළ පදනම් අගයේ සංඛ්‍යානමය බලපෑම හේතුවෙන්, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 වසරේ පළමු මාස දෙක තුළ දී ඉලක්කගත උද්ධමන පරාසයේ පහළ සීමාව ඉක්මවා පහත වැටුණු අතර, 2021 මාර්තු මාසයේ දී සියයට 4.1ක අගයක් වාර්තා කරමින් යළි ඉලක්කගත පරාසයට

**1.4 රූප සටහන**
**මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


පැමිණියේය. කො.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනයේ හැසිරීම හා සමාන හැසිරීමක් පෙන්නුම් කරමින්, ජා.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 මාර්තු මාසයේ දී සියයට 5.1ක අගයක් කරා ළඟා විය. මේ අතර, මතුපිට උද්ධමනයෙහි අන්තර්ගත, මිල උච්චාවචනයන්ට නිතර ලක් වන ආහාර, බලශක්ති සහ ප්‍රවාහන යන උප කාණ්ඩ ඉවත් කිරීම මගින් ඍතුමය මිල උච්චාවචනයන් සහ මූලික භාණ්ඩවල පරිපාලිත මිල ගණන්වල බලපෑම ඉවත් කරමින් ගණනය කරනු ලබන මූලික උද්ධමනය, කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන මිල දර්ශක දෙකම අනුව, 2020 වසර පුරාවට පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, කො.පා.මි.ද සහ ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මූලික උද්ධමනය, 2019 වසර අවසානයේ දී, පිළිවෙළින් වාර්තා කළ, සියයට 4.8ක් හා සියයට 5.2ක් වූ අගයන්ට සාපේක්ෂව, 2020 වසර අවසානයේ දී, පිළිවෙළින්, සියයට 3.5ක් හා 4.7ක් දක්වා පහත වැටුණි. තවද, 2021 මාර්තු මාසයේ දී කො.පා.මි.ද. පදනම් කර ගත් වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මූලික උද්ධමනය, සියයට 3.1ක් ලෙස වාර්තා වූ අතර, ජා.පා.මි.ද. පදනම් කර ගත් වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මූලික උද්ධමනය 2021 මාර්තු මාසයේ දී සියයට 4.3ක් ලෙස වාර්තා විය.

## විදේශීය අංශයේ ප්‍රවණතා

**කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ පෙර නොවූ විරූ ආකාරයේ අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද, රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල සහායෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2020 වසර තුළ දී කම්පනයන්ට ඔරොත්තු දුන්නේය.** 2020 වසරේ දෙවන කාර්තුවේ දී සැලකිය යුතු ලෙස අඩු වූ වෙළඳ භාණ්ඩ අපනයන, අපේක්ෂිත කාලයට පෙර යථා තත්ත්වයට පත් වූ අතර, 2020 වසර අවසානයේ දී වසංගතයට පෙර පැවති මට්ටම කරා ළඟා විය. ප්‍රධාන වශයෙන් අත්‍යවශ්‍ය නොවන ආනයන පාලනය කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ වසර තුළ ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් සිදු වූ බලපෑම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී වෙළඳ භාණ්ඩ ආනයන සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, වෙළඳ ගිණුමේ හිඟය පෙර වසරට සාපේක්ෂව, 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,008ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 1,989කින් අඩු විය. ප්‍රධාන වශයෙන් වසංගතය හේතුවෙන් සංචාරක

ඉපැයීම් මත ඇති වූ බලපෑම පිළිබිඹු කරමින් සේවා ගිණුමේ අතිරික්තය 2019 වසරට සාපේක්ෂව 2020 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා අඛණ්ඩව ක්‍රියාත්මක වීමත් සමඟ පරිගණක සේවා අංශය 2020 වසරේ දී හිතකර වර්ධනයක් වාර්තා කළේය. සමස්තයක් ලෙස, සේවා ගිණුමේ අතිරික්තය 2019 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,849ට සාපේක්ෂව, 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 819ක් දක්වා අඩු විය. ප්‍රධාන වශයෙන් සෘජු ආයෝජන ව්‍යාපාරවල ලාභාංශ ගෙවීම් හා ප්‍රතිආයෝජිත ඉපැයීම් අඩු වීම මෙන්ම, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළේ විදේශීය ආයෝජන සඳහා පොලී ගෙවීම් අඩු වීම හේතුවෙන්, 2019 වසරේ එ.ජ. ඩොලර් මිලියන 2,462ක් වූ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,101ක් දක්වා අඩු විය. වසංගතය ආරම්භක අවධියේ දී පසුබෑමක් වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, හිතකර වර්ධනයක් වාර්තා කරමින් වසරේ දෙවන භාගයේ දී ස්ථාවර ලෙස යළි යථා තත්ත්වයට පත් වීම හමුවේ, 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,766ක් වූ ද්විතියික ආදායම් ගිණුමේ අතිරික්තය, 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,207ක් දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනයන් සමඟ, 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,843ක් (ද.දේ.නි.යෙන් සියයට 2.2) වූ විදේශීය ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,083ක් (ද.දේ.නි.යෙන් සියයට 1.3) දක්වා අඩු විය. 2020 වසරේ දී මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් පහළ මට්ටමක පැවතුණි. වසර තුළ දී මූල්‍ය ගිණුම වෙත ලැබුණු ප්‍රධාන ලැබීම් අතරට චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 500ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම සහ 2020 ජූලි මාසයේ දී ඉන්දියානු සංචිත බැංකුව ඔස්සේ ලද එ.ජ. ඩොලර් මිලියන 400ක දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත් විය. සෘජු ආයෝජන ව්‍යාපාර ලබා ගත් විදේශ ණය ද ඇතුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2019 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,189ට සාපේක්ෂව, 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 670ක පහළ මට්ටමක පැවතුණි.

**1.5 රූප සටහන**
**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**විදේශීය මූල්‍යකරණය සම්බන්ධයෙන් ඇති අභියෝග මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකාව ණය සේවාකරණය සම්බන්ධයෙන් වන සිය නොබිඳුණු වාර්තාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය.** ශ්‍රී ලංකාව 2020 ඔක්තෝම්බර් මාසයේ දී කල් පිරුණු එ. ජ. ඩොලර් බිලියන 1ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව පියවීය. ප්‍රධාන වශයෙන් වසර තුළ දී ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටීම, 2020 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් කල්පිරීම, නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නේවාසිකයන් සතු කොටස ඉහළ යෑම සහ අනේවාසිකයින් සතු රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන අඩු වීම හේතුවෙන්, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන වැඩි අවධානයක් යොමු කරන කරුණක් වන, රටේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 54.8ක සිට 2020 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 49.2ක් දක්වා අඩු විය.

**වසංගතය ආරම්භයේ දී සහ වසර අවසානයේ දී වරින් වර ඇති වූ විචලනයන් මධ්‍යයේ වුව ද, විනිමය අනුපාතිකය 2020 වසර තුළ දී සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි.** ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහළ හෙළීම සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතාව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ඇති වූ සමපේක්ෂණ වෙළඳපොළ හැසිරීම, 2020 වසරේ අවසාන කාල පරිච්ඡේදයේ සිට විනිමය අනුපාතිකයෙහි විචලනයන් නැවත ඉස්මතු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විදේශීය අංශයේ තරගකාරිත්වය පිළිබිඹු කරමින්, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක පදනම් වසරට (2017 = 100) වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි. විදේශ ණය සේවාකරණය සහ විදේශ විනිමය ලැබීම් සීමිත වීම මධ්‍යයේ

1

1.6 රූප සටහන

විනිමය අනුපාතිකය හා දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


දළ නිල සංචිත ප්‍රමාණය 2019 වසර අවසානයේ දී වාර්තා වූ එ. ජ. ඩොලර් බිලියන 7.6ට සාපේක්ෂව, 2020 අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 5.7ක් දක්වා අඩු විය. සමස්තයක් ලෙස, 2020 වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට මහ බැංකුවට හැකි විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් සහ අපනයන ආදායම්වලින් කොටසක් වාණිජ බැංකු විසින් මහ බැංකුවට විකිණීම සඳහා හඳුන්වා දී ඇති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, 2021 වසරේ මුල් කාලයේ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් තවදුරටත් විදේශ විනිමය අවශෝෂණය කර ගන්නා ලදී.

## රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

**කාලයක් මුළුල්ලේ විශේෂ ප්‍රගතියක් නොපෙන්වූ ආර්ථිකයෙහි උත්තේජනයක් ඇති කිරීමේ අරමුණු ඇතිව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් වසර ආරම්භයේදී ම දැඩි තීරණයක් ගනු ලැබූ නමුත්, වසංගතය හේතුවෙන් සමස්ත රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය දැඩි බලපෑමට ලක් විය.** විවිධ අභියෝග මධ්‍යයේ වුව ද, ආර්ථික ක්‍රියාකාරකම් කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම සහ ආර්ථිකය ඉහළ වර්ධන මාවතක් කරා යොමු කිරීම තහවුරු කිරීම සඳහා, වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයින් හට රජය අඛණ්ඩව සහාය විය. වාර්ෂික අයවැය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම 2020 නොවැම්බර් මාසය දක්වා ප්‍රමාද වූ හෙයින්, 2020 වසරේ දී රාජ්‍ය මූල්‍ය මෙහෙයුම්, අතුරු සම්මත

1.7 රූප සටහන

රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)




මූලය: මුදල් අමාත්‍යාංශය


ගිණුම් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව අතිගරු ජනාධිපතිතුමාගේ බලතලවලට යටත්ව සිදු කෙරිණි. ප්‍රධාන වශයෙන්ම, ආර්ථික කටයුතු සංකෝචනය වීම නිසා ආදායම් ලැබීමේ මාර්ග දුර්වල වීම මෙන්ම, 2019 වසරේ අවසන් භාගයේ සිට බදු සංශෝධන හරහා ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය උත්තේජන ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 වසරේ දී රාජ්‍ය ආදායම පහළ ගියේය. බදු ආදායම් රැස් කිරීම ශීඝ්‍රයෙන් පහත වැටීම පිළිබිඹු කරමින්, 2019 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.6ක් වූ රාජ්‍ය ආදායම 2020 වසරේ දී සියයට 9.1ක් දක්වා අඩු විය. වියදම් අංශය සැලකූ විට, රුපියල් බිලියන 422.6ක් වූ නොපියවූ හිඟ මුදල් ගෙවීම හා සම්බන්ධ වියදම 2020 වසරේ සිට 2019 වසරට විතැන් කරමින් මුදල් අමාත්‍යාංශය රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා ලේඛනවලට ගැළපුමක් සිදු කළේය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී සියයට 22.2ක් වූ මුළු වියදම් සහ ශුද්ධ ණය දීම් 2020 වසරේ දී සියයට 20.3ක අගයක් වාර්තා කළේය. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන් වැටුප් සහ වේතන, සහනාධාර සහ පැවරුම් මෙන්ම, පොලී ගෙවීම් සඳහා දැරීමට සිදු වූ වියදම් ඉහළ යෑම හේතුවෙන්, 2019 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 16.1ක් වූ පුනරාවර්තන වියදම්, 2020 වසරේ දී සියයට 17.0ක් දක්වා ඉහළ ගියේය. පුනරාවර්තන වියදම්වල ඉහළ යෑමේ බලපෑම අභිභවා යමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම් 2019 වසරේ වාර්තා වූ සියයට 6.1ට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 3.3ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**2020 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ සැලකිය යුතු ලෙස පහත වැටීම සඳහා වසංගතයේ බලපෑම් හේතු විය.** 2019 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 9.6ක් වූ සමස්ත අයවැය හිඟය, 2020 වසරේ දී සියයට 11.1ක් දක්වා ඉහළ ගියේය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසරේ දී වාර්තා වූ සියයට 3.6 සිට 2020 වසරේ දී සියයට 7.9ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තුළ අභිමතානුසාරී ක්‍රියාමාර්ග පිළිබිඹු කෙරෙන, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම් ඉවත් කොට ගණනය කෙරෙන ප්‍රාථමික ශේෂය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී වාර්තා වූ සියයට 3.6ක හිඟයට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 4.6ක හිඟයක් වාර්තා කළේය. නොපියවා ඉතිරිව ඇති ණය තොගයේ ඉහළ යෑම මෙන්ම, වසර තුළ දී ද.දේ.නි.යෙහි සිදු වූ සංකෝචනයේ සමස්ත බලපෑම පිළිබිඹු කරමින්, 2019 වසර අවසානයේ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 86.8ක් (රුපියල් බිලියන 13,031.5) වූ මධ්‍යම රජයේ නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය 2020 වසර අවසාන වන විට සියයට 101.0ක් (රුපියල් බිලියන 15,117.2) දක්වා ඉහළ ගියේය. 2020 වසර තුළ දී විදේශීය මූලාශ්‍රවලට වඩා දේශීය මූලාශ්‍ර ඔස්සේ අයවැය මූල්‍යනය කිරීමට රජය යොමු වීම මෙන්ම, අහිතකර ගෝලීය වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ විදේශීය මූල්‍යනය සඳහා වූ සීමිත ප්‍රවේශය පිළිබිඹු කරමින්, මුළු ණය ප්‍රමාණයට සාපේක්ෂව විදේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානයේ දී පැවති සියයට 47.6ක සිට 2020 වසර අවසානය වන විට සියයට 40.0ක් දක්වා පහත වැටුණි. ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනවල අහිතකර සමපේක්ෂණයන් හමුවේ වුව ද, 2020 ඔක්තෝබර් මාසයේ දී සිදු කරන ලද එ.ජ. ඩොලර් බිලියන 1ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම් ද ඇතුළුව, 2020 වසරේ දී සියලු ණය සේවාකරණ වගකීම් රජය විසින් පියවන ලදී.


## මුදල් අංශයේ ප්‍රවණතා

**උද්ධමනය අඩු මට්ටමක පැවතීම හමුවේ කොවිඩ්-19 වසංගතයේ බලපෑමෙන් යථා තත්ත්වයට පත්වීම සහ වර්ධන ප්‍රවණතාව නැවත ළඟා කර ගැනීම සඳහා ආර්ථිකයට සහාය වීමේ අරමුණින්, මහ බැංකුව 2020 වසර තුළ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය.** ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයන්හි (SLFR), ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ අවම මට්ටම් වන, පිළිවෙළින්, සියයට 4.50ක් සහ සියයට 5.50ක් දක්වා අවස්ථා පහක දී පදනම් අංක 250කින් 2020 වසරේ දී අඩු කරන ලදී. මූල්‍ය ආයතනවල මුදල් ප්‍රවාහ ලැබීම්වලට බාධා ඇති වීම සහ හදිසි අරමුදල් අවශ්‍යතා හේතුවෙන් ඇති වූ ඉහළ අවිනිශ්චිතතා මධ්‍යයේ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2020 වසර තුළ දී අවස්ථා දෙකක දී සියයට 2.00 දක්වා ප්‍රතිශතාංක 3කින්

**1.8 රූප සටහන**
**මධ්‍යම රජයේ ණය**
**(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**





**1.9 රූප සටහන**
**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික**




1

**1.10 රූප සටහන**
**වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**1.11 රූප සටහන**
**පුළුල් මුදල් වර්ධනය හා තුඩුදුන් සාධක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු කළ අතර, එමගින් දේශීය මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතාව ඉහළ නැංවුණි. මේ අතර, මූල්‍ය අංශයට හදිසි අරමුදල් අඩු පිරිවැයක් යටතේ ලබා ගත හැකි බව පෙන්වා දෙමින්, මහ බැංකුව 2020 වසර තුළ දී බැංකු අනුපාතිකය සියයට 8.50 දක්වා පදනම් අංක 650කින් අඩු කළ අතර, එය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට වඩා පදනම් අංක 300ක ආන්තිකයක් සහිතව ස්වයංක්‍රීයව ගැළපීමට ඉඩ සලසන ලදී. තවද, ණය කාඩ්පත් සහ උකස් ණය ඇතුළු ඇතැම් මූල්‍ය උපකරණ මත අය කරන ලද ඉතා ඉහළ පොලී අනුපාතික පහළ දැමීම සඳහා මහ බැංකුව විසින් නියාමන ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, එම ක්‍රියාමාර්ග මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය කඩිනම් කිරීමටත්, ආන්තික ණය ගැනුම්කරුවන්ට සහාය වීමටත් ඉවහල් විය. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයේම වැටුප්ලාභී සේවා නියුක්තිකයන් ලබා ගන්නා දේපළ ඇපකර සහිත නිවාස ණය වෙනුවෙන් අවම වශයෙන් වසර පහක කාලයක් සඳහා වසරකට සියයට 7ක උපරිම පොලී අනුපාතිකයක් පනවන ලදී. මෙම ප්‍රතිපත්ති, මෙහෙයුම් සහ නියාමන ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, සමස්ත වෙළඳපොළ ණය අනුපාතික මෙතෙක් වාර්තා වූ අවම අගයයන් දක්වා අඩු වූ අතර, නව ණය අනුපාතික සාමාන්‍යයක් ලෙස තනි ඉලක්කමක අගයක් දක්වා අඩු විය. උද්ධමනය අඩු මට්ටමක පැවතුණ ද, වෙළඳපොළ තැන්පතු අනුපාතික ද සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් ඇතැම් තැන්පතු උපකරණ සඳහා සෘණ මූර්ත ප්‍රතිලාභ හිමි විය. මේ අතර, වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවලට සියයට 4ක සහනදායී අනුපාතිකයක් යටතේ කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට හැකි වන පරිදි, මහ බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම යටතේ සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ලදී. වසංගතය මධ්‍යයේ රජයේ මුදල් ප්‍රවාහවලට ඇති වූ බාධා සැලකිල්ලට ගනිමින්, මහ බැංකුව ප්‍රධාන වශයෙන් ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම හරහා රජයට මූල්‍ය සහාය සැපයීය. මෙය අතිරික්ත වෙළඳපොළ ද්‍රවශීලතාවක් පවත්වා ගැනීමට දායක වූ අතර, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මධ්‍යයේ, 2020 වසර තුළ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීමට ද හේතු විය. වෙළඳපොළ අපේක්ෂා ඉහළ නැගීමත්, ණය පොලී අනුපාතික අඩු වීමත් සමඟ, 2020 වසරේ අග භාගය වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කළේය. 2020 වසර අවසානය වන විට සියයට 6.5ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය වසර තුළ දී රුපියල් බිලියන 374.1කින් ඉහළ ගියේය. 2021 අප්‍රේල් මාසයේ දී, මහ බැංකුව විසින් බැංකු සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දෙනු ලැබීය. මේ අතර, මූලිකවම රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම පිළිබිඹු කරමින් රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය වසර තුළ දී සැලකිය යුතු ලෙස වර්ධනය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස පුළුල් මුදල් සැපයුම ශීඝ්‍ර ලෙස ඉහළ ගියේය. පවතින සෘණ නිමැවුම් පරතරය සහ අත්‍යවශ්‍ය නොවන ආනයන හා වෙනත් විදේශ විනිමය ගෙවීම් මත පනවන ලද සීමා හමුවේ මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ

රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ අතර, එය එක් අතකින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීමටත්, අනෙක් අතට ආර්ථික පුනර්ජීවයක් ඇති කිරීමටත් සහාය විය.

### මූල්‍ය අංශයේ ප්‍රවණතා

**කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැන නැඟුණු අවිනිශ්චිතතා සහ අභියෝග මධ්‍යයේ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව මැනවින් පවත්වා ගෙන යනු ලැබිණි.** වසංගතයේ බලපෑම් නිසා ඇති වූ අභියෝගාත්මක ආර්ථික වාතාවරණය තුළින් හටගත් අවදානම් පැවතිය ද, බැංකු අංශය මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය. ණයවල ගුණාත්මකභාවය පිරිහීම සහ වසංගතය හේතුවෙන් විදේශ විනිමය ගලා ඒම් මන්දගාමී වීම බැංකු අංශයේ මෙහෙයුම් හා සම්බන්ධව පැවති ප්‍රධානතම සාර්ව විචක්ෂණතා ගැටලු විය. මේ අතර, ප්‍රධාන වශයෙන් වසංගතය ආශ්‍රිත අවහිරතා සහ මහජන විශ්වාසය බිඳ වැටීම හේතුවෙන් බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ විශේෂිත කල්බදු සමාගම්වල ඇති වූ මන්දගාමී කාර්යසාධනය, වත්කම් පදනම, ණය හා තැන්පතු, ලාභදායීත්වය පහළ යෑම සහ වසර තුළ දී අක්‍රීය ණය ඉහළ යෑම තුළින් පිළිබිඹු විය. මහ බැංකුව විසින් වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාරවලට සහ පුද්ගලයන්ට සහන සැපයීමට සුවිශේෂී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර, බැංකු අංශය සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හා විශේෂිත කල්බදු සමාගම් අංශය මත ඇති වන අහිතකර බලපෑම කළමනාකරණය කිරීමේ අරමුණින් නියාමන ලිහිල් කිරීම් ගණනාවක් හඳුන්වා දෙන ලදී. රක්ෂණ සහ අර්ථසාධක අරමුදල් වැනි මූල්‍ය පද්ධතියේ පවතින අනෙකුත් ආයතනික අංශ මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කළේය. විශේෂයෙන්ම, මූල්‍ය පද්ධතියට සහාය ලබා දීමේ අවශ්‍යතාව සලකා බලමින්, මහ බැංකුව විසින් මුදල් වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පැවතීම සහතික කරන ලද අතර, එමගින් වසංගතය මධ්‍යයේ ආර්ථික කටයුතුවලට පහසුකම් සැලසුණි. ප්‍රධාන වශයෙන් විදේශ විනිමය රටින් පිටතට ගලායෑම් මත පැනවූ සීමාවන් තුළින් වසංගත තත්ත්වය යටතේ රට වෙත විදේශ විනිමය ගලා ඒම් මන්දගාමී වීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත එල්ල වූ පීඩනය පාලනය කෙරිණි. වසංගතය ව්‍යාප්ත වීමත් සමඟ සැලකිය යුතු පසුබෑමක් වාර්තා කළ කොළඹ කොටස් හුවමාරුව 2020 වසර තුළ දී ශුද්ධ විදේශ ආයෝජන පිටතට ගලා යෑමක් වාර්තා කළ ද, කොටස් ආයෝජනය සඳහා දේශීය ආයෝජකයින්ගේ රුචිය ඉහළ යෑම හේතුවෙන් 2020 ජූලි මස මැද සිට කැපී පෙනෙන ප්‍රගතියක් වාර්තා කළේය.

## 1.3 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

**ගෝලීය ආර්ථිකය, දශක ගණනාවකින් පසුව වාර්තා වූ විශාලතම ආර්ථික පසුබෑම 2020 වසරේ දී වාර්තා කළේය.** ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2021 අප්‍රේල් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook) අනුව, 2019 වසරේ දී සියයට 2.8ක් වූ වර්ධනයට සාපේක්ෂව 2020 වසරේ දී ගෝලීය ආර්ථිකය සියයට 3.3කින් සංකෝචනය විය. 2020 වසර තුළ දී, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික සියයට 2.2කින් සහ දියුණු ආර්ථික සියයට 4.7කින් සංකෝචනය වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. මේ අතර, කොවිඩ්-19 වසංගතය පළමුව ව්‍යාප්ත වූ චීනය, 2020 වසරේ දී සියයට 2.3ක ආර්ථික වර්ධනයක් වාර්තා කළේය. සෞඛ්‍යය, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ සමාජයීය ඇතුළු ප්‍රධාන අංශ ගණනාවක් ඔස්සේ ලබා දුන් අද්විතීය ප්‍රතිපත්තිමය සහාය, බොහෝ ආර්ථිකවල වර්ධනය 2020 වසරේ දෙවන භාගයේ දී ඉහළ යෑම සඳහා හේතු විය.

**ජාතික සහ බහුපාර්ශ්වික මට්ටම්වලින් දක්වන ලද ඉහළ ප්‍රතිපත්තිමය සහාය සහ කොවිඩ්-19 හා සම්බන්ධ එන්නත්කරණ වැඩසටහන සාර්ථකව ක්‍රියාවට නැංවීම මගින්, අවිනිශ්චිතතා හමුවේ වුව ද, ගෝලීය ආර්ථික කටයුතු වේගවත් ලෙස යථා තත්ත්වයට පත් වීම පිළිබඳව සුබවාදී අපේක්ෂා ඇති කර තිබේ.** ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉදිරි වසර කිහිපය සඳහා වූ ගෝලීය ආර්ථික වර්ධන පුරෝකථන ඉහළ නංවමින් සංශෝධනය කරනු ලැබ ඇති අතර, ඒ අනුව, වසංගතයෙන් අනතුරුව අපේක්ෂා කළ මට්ටමට වඩා ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින්, ගෝලීය ආර්ථික වර්ධනය 2021 වසරේ දී සියයට 6.0ක් සහ 2022 වසරේ දී සියයට 4.4ක් වනු ඇත. කෙසේ වෙතත්, සිදු වූ බලපෑමේ විශාලත්වය, ප්‍රතිපත්තිවල ප්‍රමාණය සහ සඵලදායීත්වය, පූර්ව - වසංගත කාලය තුළ රාජ්‍ය මූල්‍ය සහ සමාජ ආර්ථික තත්ත්වයන් මෙන්ම, එන්නත්කරණ වැඩපිළිවෙල මගින් ආවරණය වන ජනගහන ප්‍රමාණය යන සාධකවල වෙනස්කම් මත පදනම්ව, ගෝලීය ආර්ථිකයේ යථා තත්ත්වයට පත් වීම කලාප තුළත්, කලාප අතරත් වෙනස් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එන්නත් ලබා ගැනීම සඳහා ඇති ඉහළ ප්‍රවේශය මෙන්ම, ලිහිල් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති දිගු කාලපරිච්ඡේදයක් පුරා පවත්වා ගෙන යෑම සඳහා පවතින විශාල ප්‍රතිපත්තිමය අවකාශය හේතුවෙන්, නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් බොහොමයකට

**1.4 සංඛ්‍යා සටහන**

**ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)**

| ශීර්ෂය | 2019 (ආ) | 2020 (ඇ) | 2021 (පුරෝකථන) | 2022 (පුරෝකථන) |
|---|---|---|---|---|
| **ලෝක නිෂ්පාදිතය** | **2.8** | **-3.3** | **6.0** | **4.4** |
| සංවර්ධිත ආර්ථික | 1.6 | -4.7 | 5.1 | 3.6 |
| ඇමරිකා එක්සත් ජනපදය | 2.2 | -3.5 | 6.4 | 3.5 |
| යුරෝ කලාපය | 1.3 | -6.6 | 4.4 | 3.8 |
| එක්සත් රාජධානිය | 1.4 | -9.9 | 5.3 | 5.1 |
| ජපානය | 0.3 | -4.8 | 3.3 | 2.5 |
| නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 3.6 | -2.2 | 6.7 | 5.0 |
| නැගී එන සහ සංවර්ධනය වන ආසියාව | 5.3 | -1.0 | 8.6 | 6.0 |
| චීනය | 5.8 | 2.3 | 8.4 | 5.6 |
| ඉන්දියාව | 4.0 | -8.0 | 12.5 | 6.9 |
| **ලෝක වෙළඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **0.9** | **-8.5** | **8.4** | **6.5** |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථික | 1.4 | 0.7 | 1.6 | 1.7 |
| නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික | 5.1 | 5.1 | 4.9 | 4.4 |
| වෙළඳ භාණ්ඩ මිල (එ.ජ. ඩොලර්) | | | | |
| ඉන්ධන | -10.2 | -32.7 | 41.7 | -6.3 |
| ඉන්ධන නොවන | 0.8 | 6.7 | 16.1 | -1.9 |
| **එ.ජ. ඩොලර් තැන්පතු මත සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය (සියයට)** | **2.3** | **0.7** | **0.3** | **0.4** |

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයː World Economic Outlook (2021 අප්‍රේල්), ජා.මූ. අරමුදල

සාපේක්ෂව දියුණු ආර්ථික ශීඝ්‍රයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. ඒ අනුව, දියුණු ආර්ථික 2021 සහ 2022 වසරවල දී, පිළිවෙළින්, සියයට 5.1කින් සහ සියයට 3.6කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ. විශාල රාජ්‍ය මූල්‍ය සහායයන් සහ අඛණ්ඩ මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණයන්හි සහාය සමඟ, එක්සත් ජනපද ආර්ථිකය, 2020 වසරේ දී වාර්තා කළ සියයට 3.5ක සංකෝචනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 6.4කින් සහ 2022 වසරේ දී සියයට 3.5කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරෙයි. යුරෝපා කලාපය 2020 වසරේ දී වාර්තා කළ සියයට 6.6ක සංකෝචනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 4.4කින් සහ 2022 වසරේ දී සියයට 3.8කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. එක්සත් රාජධානියේ ආර්ථික කටයුතු 2021 වසරේ දී සියයට 5.3ක වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික 2021 වසරේ දී සියයට 6.7ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කරනු ඇතැයි පුරෝකථනය කෙරෙයි. කෙසේ වෙතත්, මෙම ආර්ථිකයන්හි අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම, වසංගතයේ දරුණුකම, එම රටවල ආර්ථිකවල සහ සෞඛ්‍ය පද්ධතිවල පවතින ආවේණික ලක්ෂණ, වෙළඳ භාණ්ඩ අපනයන හෝ සංචාරක ක්ෂේත්‍රය මුහුණ දෙන කම්පන වැනි විශේෂිත කම්පනවලට නිරාවරණය වන ප්‍රමාණය සහ වසංගතයට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින ප්‍රතිපත්තිමය අවකාශය යනාදියෙහි කලාපීය වශයෙන් දක්නට ලැබෙන වෙනස්කම් මත රඳා පවතී. 2020 වසරේ දී සියයට 1.0කින් සංකෝචනය වූ නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව, චීනයේ සහ ඉන්දියාවේ අපේක්ෂිත ඉහළ වර්ධනය හේතුවෙන් 2021 වසරේ දී සියයට 8.6කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ දී චීන ආර්ථිකය සියයට 8.4කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත අතර, ඉන්දියාවේ ආර්ථික වර්ධන පුරෝකථනය සියයට 12.5ක් වේ. මේ අතර, ඉල්ලුම් - සැපයුම් නොගැළපීම් හේතුවෙන් ලෝක ඛනිජ තෙල් මිල ගණන් 2021 වසරේ දී ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එම මිල ගණන් පුරෝකථන ඉක්මවා තවදුරටත් ඉහළ යෑමේ අවදානම් පවතී. සමස්ත ඉල්ලුම විෂමාකාර ලෙස යථා තත්ත්වයට පත් වීම සහ වැටුප් වර්ධනය මන්දගාමී වීම පිළිබිඹු කරමින්, ගෝලීය උද්ධමනය කෙටි කාලීනව පහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. වැඩි දියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවලින් ලද සහාය සමඟ බොහෝ දියුණු සහ නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි උද්ධමන අපේක්ෂා සැලකිය යුතු ලෙස මනාව පාලනය වී ඇති බවක් දක්නට ලැබේ.

**මැදි කාලීනව ගෝලීය වර්ධන පුරෝකථන ඉහළ යෑමේ නැඹුරුතාවක් පෙන්නුම් කළ ද, වසංගතය ආශ්‍රිත අවිනිශ්චිතතා හේතුවෙන් එම වර්ධන පුරෝකථන සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමේ අවදානම් පවතී.** වර්ධන පුරෝකථන ඉහළ නැංවිය හැකි ප්‍රධාන කරුණු අතරට කඩිනම් එන්නත් නිෂ්පාදන සහ එන්නත්කරණ වැඩපිළිවෙළ, ශක්තිමත් රාජ්‍ය මූල්‍ය සහයෝගය මෙන්ම, ශක්තිමත් ජාත්‍යන්තර සහයෝගීතාව සමඟ මනා ලෙස සම්බන්ධීකරණය වූ රාජ්‍ය මූල්‍ය හා වෙනත් ආර්ථික ප්‍රතිපත්ති යනාදිය ඇතුළත් වේ. වසංගතය යළි පැන නැගීමේ හැකියාව, දැඩි මූල්‍ය තත්ත්වයන්, සැපයුම් විභවතාවට සිදු වූ සැලකිය යුතු හා කල් පවතින හානිය, ඉහළ ගිය සමාජ අසහනය, ස්වභාවික විපත් සහ භූ දේශපාලනික, වෙළඳ හා තාක්ෂණික අවදානම්, වර්ධන පුරෝකථන පහළ දැමිය හැකි අවදානම් සාධක අතර ප්‍රධාන වේ.

## 1.4 මැදි කාලීන සාර්ව ආර්ථික දැක්ම

**ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ දී වේගවත් ලෙස යථා තත්ත්වයට පත්වනු ඇතැයි ද, ආර්ථික වර්ධනය මූලික කරගත් ප්‍රතිපත්තිමය සහයෝගය තුළින් මැදි කාලීනව ඉහළ වර්ධන වේගයක් පවත්වා ගෙන යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.** පෙර වසරේ වාර්තා වූ අඩු වර්ධනය හේතුවෙන් වන පදනම් බලපෑම මෙන්ම, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා වූ රජයේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, 2021 වසරේ දී ආර්ථික වර්ධන වේගය ශක්තිමත් වීම සඳහා හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. කොවිඩ්-19 වසංගතය හා සම්බන්ධව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දීමේ වැඩසටහන් සහ බොහෝ ආර්ථික කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත් වීම 2021 වසරේ දී ඉහළ ආර්ථික වර්ධන වේගයක් ළඟා කර ගැනීමට උපකාරී වනු ඇත. අපේක්ෂා කරන ලෙස ගෝලීය ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වීම ඔස්සේ විදේශීය ඉල්ලුම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, විවිධ ආයෝජන සහ විදේශීය සෘජු ආයෝජන සඳහා ධනාත්මක බලපෑමක් ඇති කෙරෙනු ඇත. නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා රජය විසින් ගනු ලබන ප්‍රයත්නයන් දේශීය කෘෂි නිෂ්පාදන, කෘෂි හා ස්වභාවික සම්පත් පදනම් කරගත් කර්මාන්ත සහ අනෙකුත් නැගී එන කර්මාන්ත හා සේවා සඳහා උපකාරී වනු ඇති අතර, ආර්ථිකයේ සමස්ත ඵලදායීතාව ද වැඩි දියුණු කරනු ඇත. ප්‍රපාතනය හා වෙනත් අනිසි ක්‍රියාකාරකම්වලින් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සමඟ, ප්‍රධාන කෘෂි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත බව ඇති කිරීම සඳහා ගනු ලබන පියවර මගින් මහා පරිමාණ ගොවිතැන් වගා කටයුතු හා නිෂ්පාදනාගාර පහසුකම් සඳහා දිගු කාලීන ආයෝජන සිදු කිරීම සඳහා දේශීය නිෂ්පාදකයින් දිරිමත් කෙරෙනු ඇත. විශේෂයෙන්ම වෙන් වූ කාර්මික කලාප පිහිටුවීම මගින් අපනයනාභිමුඛ නිෂ්පාදන අංශ වෙත ලැබෙන සහයෝගය ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, විශේෂයෙන් ම, කොළඹ වරාය නගරය විදේශීය හා දේශීය ආයෝජන සඳහා විවෘත කිරීම තුළින් රටේ සේවා අංශය වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂිතය. තවද, රාජ්‍ය හා පෞද්ගලික පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවා ඇති කාර්ය සාධක බලකායන් මගින්, හඳුනාගෙන ඇති අංශවල අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා සහාය සැලසෙනු ඇත. බදු සහන සහ සහනාධාර ස්වරූපයෙන් සපයන ලද රාජ්‍ය මූල්‍ය සානුබල නුදුරු අනාගතයේ දී ප්‍රතිඵල අත්කර දෙනු ඇතැයි ද, එමගින් ආයතනවල ලාභදායිතාව වැඩි දියුණු වනු ඇතැයි ද, ආයෝජන ධාරිතාව ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරෙයි. සැලකිය යුතු ලෙස පොලී අනුපාතික අඩු කිරීම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ණය ලබා ගැනීමේ පිරිවැය අඩු වීම මගින් ඉදිරි කාල සීමාව තුළ දී පෞද්ගලික අංශයේ සක්‍රිය සහභාගීත්වය ඇතිව ඉහළ ආර්ථික වර්ධනයක් ඇති කර ගැනීම සඳහා වන මාවත සැකසීමට උපකාරී වනු ඇත. ආර්ථිකයේ නිෂ්පාදන හැකියා ප්‍රසාරණය කිරීම සහ ව්‍යාපාර සිදු කරගෙන යෑමේදී මුහුණ දීමට සිදුවන අපහසුතා ඇතුළු ආර්ථිකයේ ව්‍යුහාත්මක සීමා සහ අවහිරතා විසඳීමට ගන්නා කඩිනම් ක්‍රියාමාර්ගවල සහායයෙන් මෙන්ම, ප්‍රතිපත්ති ස්ථාවරත්වය හා සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම සහ භාණ්ඩ හා සේවා අපනයන සහ මූල්‍ය ප්‍රවාහ ගලා ඒම් යළි නඟා සිටු වීම තුළින් විදේශීය අංශයේ අපේක්ෂිත දියුණුව ඔස්සේ ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව මැදි කාලය පුරාවට අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

**සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා නුදුරු අනාගතයේ විදේශීය අංශය මත ඇතිවන පීඩන සුපරික්ෂාකාරීව කළමනාකරණය කිරීම ඉතා වැදගත් වන අතරම, ණය බර ඇති නොකරන විදේශ විනිමය ලැබීම් ආකර්ෂණය කර ගැනීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් මැදි කාලීනව මෙම අංශයෙහි අභියෝග සඳහා මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ගෝලීය ඉල්ලුම අපේක්ෂිත පරිදි යථා තත්ත්වයට පත් වීම සහ වෙළඳ අංශ වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය පියවර සමඟ ඉදිරි කාලය තුළ දී අපනයන ආදායම ඉහළ යනු ඇත. ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යෑම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් වසර තුළ දී ආනයන වියදම යම් ප්‍රමාණයකට වැඩි වීමේ හැකියාවක් පැවතිය ද, විදේශීය අංශය මත කෙටි කාලීනව ඇති වන පීඩන කළමනාකරණය කිරීම සඳහා 2021 වසරේ දී ආනයන වියදම දැඩි අවධානයකින් යුතුව කළමනාකරණය කෙරෙනු ඇතැයි අපේක්ෂිතය. දේශීය ඉල්ලුම සහ අපනයන වැඩි දියුණුවීමත් සමඟ ආනයන වියදම මැදි කාලීනව වැඩි වනු ඇතැයි අපේක්ෂා කළ ද, පාරිභෝගික සහ අතරමැදි භාණ්ඩවල දේශීය සැපයුමේ අපේක්ෂිත වැඩි දියුණු වීමත් සමඟ එවැනි ආනයන සඳහා ඇති ඉල්ලුම අඩු වනු ඇත. අපනයන ආදායමෙහි අපේක්ෂිත වැඩිවීම හේතුවෙන් මැදි කාලීනව වෙළඳ හිඟය අඩු වනු ඇතැයි පුරෝකථනය කෙරේ. රටේ දේශ සීමා විදේශීය සංචාරකයින් සඳහා නැවත විවෘත කිරීමත් අපේක්ෂිත පරිදි ගෝලීය සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟ සංචාරක කර්මාන්තය නැවත

1

### 1.5 සංඛ්‍යා සටහන
### මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව (අ)

| දර්ශකය | ඒකකය | 2019 (ආ) | 2020 (ඇ) | පුරෝකථන | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
| **මූර්ත අංශය (ඈ)** | | | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 2.3 (ඇ) | -3.6 | 6.0 | 5.2 | 5.8 | 6.5 | 7.0 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් ට්‍රිලියන | 15.0 (ඇ) | 15.0 | 16.6 | 18.4 | 20.7 | 23.2 | 26.1 |
| ඒක පුද්ගල ද.දේ.නි. | එ.ජ. ඩොලර් | 3,852 (ඇ)(ඉ) | 3,682 | 3,873 | 4,092 | 4,420 | 4,784 | 5,178 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 26.8 (ඇ)(ඊ) | 25.2 | 27.5 | 28.0 | 28.5 | 29.0 | 29.5 |
| දේශීය ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 20.7 (ඇ)(ඊ) | 18.9 | 23.1 | 24.6 | 26.2 | 27.4 | 28.5 |
| ජාතික ඉතුරුම් | ද.දේ.නි.යේ % වශයෙන් | 24.7 (ඇ)(ඊ) | 23.9 | 27.3 | 28.2 | 29.0 | 29.8 | 30.5 |
| **විදේශීය අංශය** | | | | | | | | |
| වෙළඳ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -9.5 | -7.4 | -6.2 | -5.5 | -4.6 | -3.7 | -3.5 |
| අපනයන | එ.ජ. ඩොලර් බිලියන | 11.9 | 10.0 | 12.5 | 14.0 | 15.5 | 17.0 | 18.9 |
| ආනයන | එ.ජ. ඩොලර් බිලියන | 19.9 | 16.1 | 17.8 | 19.0 | 20.0 | 21.0 | 23.0 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -2.2 | -1.3 | -0.2 | 0.2 | 0.5 | 0.8 | 1.0 |
| විදේශීය නිල සංචිත | ආනයනික මාස වශයෙන් | 4.6 | 4.2 | 3.2 | 3.7 | 4.3 | 4.7 | 5.0 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (උ)** | | | | | | | | |
| සමස්ත ආදායම් සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 12.6 (ඌ)(එ) | 9.2 | 11.8 | 13.0 | 13.5 | 14.3 | 15.1 |
| වියදම හා ශුද්ධ ණය දීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 22.2 (ඌ)(එ) | 20.3 | 21.2 | 20.4 | 19.1 | 19.0 | 19.2 |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -3.6 (ඌ)(එ) | -7.9 | -3.1 | -1.3 | 0.0 | 1.2 | 2.3 |
| ප්‍රාථමික ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -3.6 (ඌ)(එ) | -4.6 | -4.2 | -2.3 | -0.6 | 0.2 | 0.9 |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ % වශයෙන් | -9.6 (ඌ)(එ) | -11.1 | -9.4 | -7.5 | -5.6 | -4.7 | -4.0 |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 86.8 (ඌ) | 101.0 | 98.0 | 95.0 | 91.0 | 86.0 | 80.0 |
| **මුදල් අංශය සහ උද්ධමනය** | | | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) (ඒ) | සියයට | 7.0 | 23.4 | 21.0 | 12.5 | 12.5 | 12.5 | 12.5 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය ($M_{2b}$ හි) (ඒ) | සියයට | 4.2 | 6.5 | 12.2 | 11.6 | 11.7 | 12.0 | 12.0 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (ඔ) | සියයට | 4.3 | 4.6 | 4.3 | 5.8 | 6.0 | 5.5 | 5.0 |

(අ) මුද්‍රණයට යන අවස්ථාව දක්වා පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) 2019 වසර සඳහා ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින්, 27.4%, 21.3% සහ 25.3%ක් වූ මුළු ආයෝජන, දේශිය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී.
(උ) රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ පුරෝකථන මුදල් අමාත්‍යාංශයෙහි දත්ත මත පදනම් වේ.
(ඌ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද 2019 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(එ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(ඒ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය.
(ඔ) කො.පා.මි. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් සේවා ගිණුමේ අතිරික්තය වර්ධනය වනු ඇතැයි බලාපොරොත්තු වේ. තවද, ප්‍රවාහන සේවා ක්‍රියාකාරකම් යළි වර්ධනය වීම සහ තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (IT/BPO) යන සේවා අංශවල අපේක්ෂිත ඉහළ වර්ධනය මැදි කාලීනව සේවා වෙළඳාමට සහාය වනු ඇත. ගෝලීය ක්‍රියාකාරකම් අපේක්ෂිත පරිදි යථා තත්ත්වයට පත්වීම සහ රැකියා සඳහා විදේශගතවන්නන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන දිරිගැන්වීමේ රාමුව ද සමග නිපුණතා සහිත ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා දිරිගැන්වීමට රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන සහ විදේශීය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල අපේක්ෂිත වර්ධනයන් සමඟ, විදේශීය ජංගම ගිණුම 2021 වසරේ දී සුළු හිඟයක් වාර්තා කරමින් වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එම අපේක්ෂාවන් වසරේ දෙවන භාගයේ දී අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා වන වියදම් තව දුරටත් සමීපව කළමනාකරණය කිරීම සහ සංචාරක අංශය වෙත වූ ප්‍රවාහයන් යථා තත්ත්වයට පත් වීම

යන කොන්දේසි මත දැඩි ලෙස රඳා පවතියි. ශක්තිමත් ආයතනික සහාය සමග වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ප්‍රවර්ධනය සඳහා රජය විසින් ගෙන ඇති පියවර හමුවේ, විදේශීය ජංගම ගිණුම මැදි කාලයේ දී අතිරික්තයන් වාර්තා කිරීම දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සැලසුම් කර ඇති පරිදි බලශක්ති උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මත රඳා පැවතීම ඉහළ නැංවීම සහ පොදු ප්‍රවාහන පද්ධති වැඩි දියුණු කිරීම ද අනාගතයේ දී සමස්ත බලශක්ති ආනයන වියදම කළමනාකරණය කිරීමට දායක වනු ඇත. ඉදිරි කාලපරිච්ඡේදය තුළ වසංගතයේ බලපෑම තුරන් වීමත් සමඟම ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීම, විදේශීය සෘජු ආයෝජන ලැබීම්, කොළඹ කොටස් හුවමාරුව තුළ විවිධ ආයෝජන සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ ආයෝජන ඇතුළු මූල්‍ය ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීම සඳහා සහාය වනු ඇත. අනෙකුත් ආයෝජන ප්‍රවාහයන්ට අමතරව, කොළඹ වරාය නගරය සහ කාර්මික කලාපීය ව්‍යාපෘති සඳහා විදේශ ආයෝජන ප්‍රධාන වශයෙන් ගලා එනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජංගම ගිණුමේ ශේෂයෙහි වර්ධනය සහ ණය බර ඇති නොකරන මූල්‍ය ප්‍රවාහ වැඩි වීම මගින් මැදි කාලීනව දළ නිල සංචිත ශක්තිමත් වනු ඇතැයි ද, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මත වන පීඩනය ලිහිල් වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. විදේශීය ණය කළඹෙහි සිදු වෙමින් පවතින වෙනස්වීම් සහ ණය නොවන විදේශ විනිමය ලැබීම් වැඩි කිරීම සඳහා දරන ප්‍රයත්නයන් මගින් ඉදිරි කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ විදේශීය ණයෙහි තිරසාර බව සහතික කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සඳහා වන කෙටි කාලීන අවශ්‍යතාව ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික මූල්‍ය ප්‍රභවයන්ගේ සහාය ඇතිව සපුරා ගැනෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**රජයේ ප්‍රතිපත්ති න්‍යායපත්‍රයට අනුකූලව, ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වර්ධනයෙහි බලපෑම තුළින් රාජ්‍ය මූල්‍ය අංශය මැදි කාලීනව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2019 වසර අවසානයේ සිට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර කටයුතු සඳහා හිතකාමී බදු ක්‍රමය මැදි කාලය පුරාවට ද අඛණ්ඩව පවත්වාගෙන යෑමට අපේක්ෂිත අතර, ව්‍යාපාර සහ අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව පුළුල් වන බැවින්, එමගින් රජයේ ආදායම ක්‍රමයෙන් ඉහළ නැංවීමට පහසුකම් සැපයෙනු ඇත. බදු ගෙවීම සඳහා යටත් වන පිරිස ඉහළ නංවා ගැනීම සඳහා බදු ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම ද රජයේ ආදායම අපේක්ෂිත ලෙස වර්ධනය කර ගැනීම සඳහා පහසුකම් සලසනු ඇත. ඉදිරි කාල සීමාව තුළ දී, පුනරාවර්තන වියදම තාර්කිකරණය කිරීම සහ ප්‍රාග්ධන වියදම්වල කාර්යක්ෂමතාව ඉහළ නැවීම ආධාරයෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය වියදමේ මධ්‍යස්ථ වර්ධනයක් අපේක්ෂා කෙරේ. ඵලදායීතාව ඉහළ නැංවීම සහ කළමනාකරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් දුර්වල කාර්යසාධනයක් පිළිබිඹු කරන රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් රාජ්‍ය මූල්‍ය මත ඇති කරනු ලබන පීඩනය අඩු කෙරෙනු ඇත. කොවිඩ්-19 වසංගතයේ බලපෑම්වලින් යථා තත්ත්වයට පත් වීම සඳහා ආර්ථික කටයුතුවලට රාජ්‍ය මූල්‍ය සානුබල ලබා දීමේ අවශ්‍යතාව හේතුවෙන් අයවැය හිඟය කෙටි කාලයේ දී සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතිය හැකි වුව ද, අපේක්ෂිත අන්දමට රජයේ ආදායම් සහ වියදම් පාර්ශ්වයන් වැඩිදියුණු කිරීමත් සමඟ අයවැය හිඟය මැදි කාලීනව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.0ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, විදේශ වගකීම්වලට නිරාවරණය වීම අඩු කිරීම සම්බන්ධයෙන් රජයේ දැක්මට අනුකූලව අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා විදේශීය මූලාශ්‍ර මත රඳා පැවතීම අවම කෙරෙනු ඇත. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයන් දිරිගන්වන අතරම, විදේශීය අරමුදල්වලින් මූල්‍යනය කෙරෙන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රමවත් කිරීම සඳහා දැනටමත් පියවර ගෙන ඇති අතර, මෙවැනි පියවර රජයේ ණය බර අඩු කිරීමට උපකාරී වනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2025 වසර වන විට මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය, දැනට පවත්නා ඉහළ මට්ටමේ සිට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 80ක් දක්වා ක්‍රමයෙන් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අයවැය හිඟය මූල්‍යනය කිරීමේ උපාය මාර්ගය වෙනස් වීමට අනුකූලව, රජයේ විදේශීය ණය සේවාකරණය ද මැදි කාලීනව පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තිරසාර සාර්ව ආර්ථික ස්ථායීතාව සහතික කිරීම සඳහා සහ අපේක්ෂා කෙරෙන පරිදි ඉහළ වර්ධන මාවතක් වෙත ගමන් කිරීමේ දී ඇති වන අවහිරතා වැළැක්වීම සඳහා මැදි කාලීනව රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම පිණිස කැපවීම අපේක්ෂා කෙරේ.

**සමස්ත ඉල්ලුම යථා තත්ත්වයට පත්වන විට අතිරික්ත ප්‍රතිපත්ති උත්තේජනයන් කාලානුරූපිව අඩු කරගැනීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමඟ, උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත පරාසය**

**තුළ පවත්වා ගැනෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ආර්ථික ක්‍රියාකාරකම්වල මන්දගාමී බව පිළිබිඹු කරමින්, 2021 වසරේ වැඩි කාලසීමාවක් තුළ උද්ධමනය පහළ තනි අගයන්හි පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. වසංගතයෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම අරමුණු කරගත් ලිහිල් මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම හේතුවෙන් සමස්ත ඉල්ලුම ක්‍රමයෙන් ඉහළ යෑමක් හා ඉල්ලුම මගින් උද්ධමනය මත ඇති කරනු ලබන පීඩනයෙහි ඉහළ යෑමක් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නැවත ඉහළ යන ගෝලීය බලශක්ති සහ ආහාර මිල ගණන්, ලොව පුරා ඍජුව හා වක්‍රව උද්ධමනකාරී පීඩන ඇති කිරීමට හේතු විය හැකිය. මේ අතර, නිෂ්පාදන ඉහළ නැංවීම තුළින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහ ජීවන වියදම පාලනය කිරීම ඉලක්ක කර ගනිමින් රජය විසින් ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ඒ සඳහා වන අඛණ්ඩ කැපවීම තුළින් ලැබෙන ප්‍රතිලාභ හේතුවෙන් මැදි කාලීනව උද්ධමනය මත සැපයුම් අංශය වෙතින් එතරම් පීඩනයක් එල්ල නොවනු ඇතැයි බලාපොරොත්තු වේ. කෙසේ වෙතත්, කාලගුණික විපර්යාස ආශ්‍රිතව සිදු විය හැකි අවහිරතා මගින් ආහාර මිල ගණන්වල තාවකාලික විචලන ඇති වීමට ඉඩ ඇති අතර, එවැනි ගැටලු සැපයුම් දාම කළමනාකරණය ශක්තිමත් කිරීම මගින් විසඳිය යුතුය. රජය විසින් අනුගත වීමට අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රතිපත්තීන් මෙන්ම, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ ඉදිරි දැක්මකින් යුතුව ගනු ලබන සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා මැදි කාලීනව සියයට 4-6 අතර පරාසයක ස්ථාවරව පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

**අපේක්ෂිත පරිදි අඩු උද්ධමන වාතාවරණයක් පවත්වාගැනීම, අඩු පොලී අනුපාතික ව්‍යුහය පවත්වාගෙන යෑම සඳහා උපකාරී වනු ඇති අතර, ඉතිරි කරන්නන් හට ප්‍රමාණවත් මූර්ත ප්‍රතිලාභ ලබා දෙන අතරම, අඩු පිරිවැයකින් පෞද්ගලික අංශය වෙත ණය ප්‍රවාහයට පහසුකම් සලසමින් අපේක්ෂිත පරිදි ආර්ථික වර්ධනය ඉහළ නංවා ගැනීමට සහාය සැලසෙනු ඇත.** ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම්වල පවතින වෙළඳපොළ ණය පොලී අනුපාතික, රාජ්‍ය මූල්‍ය හා මුදල් උත්තේජකයන්ගේ සහායයෙන් ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට සහාය වීම සඳහා ගත් ක්‍රියාමාර්ගවල උපකාරයෙන් පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනය වේගවත් වනු ඇතැයි පුරෝකථනය කෙරේ. පෞද්ගලික අංශයට ණය ලබා දීම ඉහළ යෑම මෙන්ම, බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශයට ලබා දුන් ණය ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2021 වසරේ දී ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඉන්පසුව ආර්ථික වර්ධනය වේගවත් වීමත් සමඟ මූල්‍ය උත්තේජක සැපයීම ක්‍රමානුකූලව අඩු කර ගැනීමට හැකිවී මැදි කාලීනව පුළුල් මුදල් සැපයුමේ වර්ධනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඵලදායීතාව වැඩිදියුණු කිරීම සහ ආර්ථික වර්ධනයට ඇති ව්‍යුහාත්මක බාධා හා සීමා ඉවත් කිරීම මගින් මැදි කාලීනව ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට අපේක්ෂා කරන බැවින්, රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රසාරණයෙහි එවැනි අඩු වීම් මගින් අපේක්ෂිත වර්ධන මාවතට බාධා ඇති නොවනු ඇත. විදේශ විනිමය ගලායාම් සහ රාජ්‍ය මූල්‍ය අංශයේ ඇතිවිය හැකි දුර්වලතාවන්ට ප්‍රතිචාර දක්වන අතරම, මහ බැංකුව මුදල් හා සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳව සමීපව අධීක්ෂණය කරමින් අධික මුදල් වර්ධනයක් තුළින් ජනිත වන සමස්ත ඉල්ලුමේ අනිසි ඉහළ යෑම් වැළැක්වීම සඳහා ක්‍රියාකාරී ලෙස ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සිදු කරනු ඇත. මේ අතර, මහ බැංකුව ආර්ථිකයේ ප්‍රමුඛ අංශ සඳහා, විශේෂයෙන්ම දේශීය ආර්ථික වර්ධනය සහ අපනයන ඉපැයීම් සඳහා ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අංශ වෙත, ණය ලබා දීමට අඛණ්ඩව පියවර ගනු ඇත. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහෝ දුරට ඇතුළත් වන මෙම අංශ සඳහා අඩු පිරිවැයකට ණය ලබා දීම ඉහළ නැංවීම මගින් ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් වර්ධනය කිරීමට සහ තිරසාර මෙන්ම, ආර්ථිකයේ සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනයක් ඇති කිරීමට සහාය වනු ඇත. දැනට පවතින අඩු පොලී අනුපාතික ව්‍යුහය මගින් නව සහ පවතින ව්‍යාපාර සඳහා අනර්ඝ අවස්ථා ලබා දෙන අතරම, තැන්පතු පොලී ආදායම් මත යැපෙන ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා එමගින් සැලකිය යුතු අභියෝග ද එල්ල කරයි. සාධාරණ ඉහළ ප්‍රතිලාභ ලබා දෙන සුරක්ෂිත සහ විකල්ප මූල්‍ය උපකරණ හඳුන්වාදීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම තුළින් අඩු පොලී අනුපාතික මගින් දැඩි ලෙස බලපෑමට ලක් වූ ඉතිරි කරන්නන් හට ප්‍රතිලාභ හිමි වනු ඇත. මෙම වාතාවරණය තුළ, සමස්තයක් වශයෙන් මූල්‍ය අංශය, ණය ගැනුම්කරුවන්ගේ මෙන්ම ඉතිරි කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා නව මූල්‍ය උපකරණ හඳුන්වා දීම තුළින් කාර්යක්ෂම මූල්‍ය අතරමැදිකරණ කාර්යභාරයක් සක්‍රීය ලෙස ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 1.5 ගැටලු සහ ප්‍රතිපත්ති

**දිගු කාලීනව පවතින සාර්ව ආර්ථික අසමතුලිතතාවන්ට පිළියම් යෙදීම සහ සාධාරණ, සැමට ප්‍රතිලාභ හිමිවන සහ තිරසාර ආර්ථික වර්ධනයක් සහතික කිරීම අරමුණු කරගත් රජයේ නව ආර්ථික ප්‍රතිපත්ති රාමුව වන *සෞභාග්‍යයේ දැක්ම* ක්‍රියාවට නැංවීම තුළින්, මැදි කාලීනව ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයක් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ වර්ධන ප්‍රවණතාව පුනර්ජීවනය කිරීම සහතික කිරීම මුදල් හා මූල්‍ය ක්‍රියාමාර්ගවලට පමණක් සිදු කළ නොහැකි අතර, ඒ සඳහා රටේ අඛණ්ඩ ප්‍රගතිය වෙනුවෙන්, රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන පුළුල් පරාසයක විහිදුණු ආර්ථික ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකා ආර්ථිකය, ආර්ථික වර්ධනය හා සාර්ව ආර්ථික ස්ථායීතාවය ළඟා කර ගැනීමට බාධා පමුණුවන ව්‍යුහාත්මක බාධක රාශියකට මුහුණ දෙමින් සිටී. ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් සහ විශ්ලේෂකයින් අතර පුළුල් පිළිගැනීමක් තිබියදී වුව ද, අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම නැවත නැවතත් කල් දැමීමකට ලක් වී ඇත. මෙය රටෙහි රාජ්‍ය මූල්‍ය හා විදේශීය අංශවල අඛණ්ඩව වාර්තාවන ද්විත්ව හිඟයයන් මගින් පිළිබිඹු වේ. එක් අතකින්, වෙළඳ අංශයේ නිෂ්පාදන පදනම, නිෂ්පාදන හා වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම, ගෝලීය හා කලාපීය අගය දාමයන් සමඟ ඒකාබද්ධ වීම සහ සේවා අපනයනවල විභවයන් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් ප්‍රගතිය මද වීම හේතුවෙන් අපනයන ඉපැයීම් වසර ගණනාවක් තිස්සේ එකම මට්ටමක රැඳී තිබේ. අනෙක් අතට, කාර්මික අපනයන, ආනයනික අමුද්‍රව්‍ය මත යැපීම නිසා, එම අමුද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුමේ පවත්නා අනම්‍ය ස්වභාවය, වර්ධනය වන මධ්‍යම පාංතික කාණ්ඩය විසින් ආනයනික භාණ්ඩ සඳහා කරන ඉල්ලුම වැඩිවීම සහ විදුලිබල උත්පාදනය හා ප්‍රවාහන කටයුතු සඳහා ඛනිජ තෙල් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම යනාදිය හේතුවෙන් ආනයන වියදම් අඛණ්ඩව ඉහළ ගොස් තිබේ. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මගින් විදේශීය ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු පමණකට පියවා ඇති අතර, විදේශීය ඍජු ආයෝජන ප්‍රවාහයන් අඩු මට්ටමේ පැවතීම හේතුවෙන් ඉතිරිකිරීම් සහ ආයෝජන අතර පරතරය පියවීම සඳහා විදේශීය ණය මූලාශ්‍ර මත අධික ලෙස රඳා පැවතීමට සිදු වී තිබේ. රාජ්‍ය මූල්‍ය අංශය සැලකූ විට, ඉහළ හා වෙනස් කිරීමට අසීරු වියදම් සහ බොහෝ දුරට බදු පදනමේ සැලකිය යුතු ප්‍රසාරණයක් නොමැති වීම සහ දුර්වල බදු පරිපාලනය හේතුවෙන් ආදායම් එක්රැස් කිරීම් අඛණ්ඩව පහළ මට්ටමක පැවතීම, ආර්ථිකයේ ප්‍රධාන ගැටලුවක්ව පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය මූල්‍ය හිඟය ප්‍රසාරණය වීම හේතුවෙන්, රාජ්‍ය ණය වඩාත් අභියෝගාත්මක මට්ටමක් කරා ශීඝ්‍රයෙන් ළඟා වී තිබේ. දිගු කාලයක් පුරා පවතින මෙම ආර්ථික ගැටලු, කොවිඩ්-19 වසංගතය මගින් වඩාත් උග්‍ර කර ඇත. කෙසේ වෙතත්, වසංගතය මගින් ආර්ථිකයේ දිශානතිය යළි සකස් කර ගැනීමටත්, මෙම දිගුකාලීන ව්‍යුහාත්මක දුර්වලතා විසඳීමටත්, නිෂ්පාදන මූලික කරගත්, ඵලදායිතාව මත පදනම් වූ ආර්ථිකයක් ස්ථාපිත කිරීමටත් අවස්ථාවක් උදාකර දී තිබේ. මෙම වාතාවරණය තුළ, අපනයනාභිමුඛ සහ වර්ධනය වන දේශීය ඉල්ලුම ඵලදායි ලෙස සපුරාලිය හැකි ශක්තිමත් දේශීය නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම කෙරෙහි රජයේ ප්‍රතිපත්ති අවධානය යොමු වීම සතුටුදායක පරිවර්තනයකි. මහ බැංකුව අඩු පොලී අනුපාතික වාතාවරණයක් පවත්වාගෙන යෑම, ආර්ථිකයේ ඵලදායි විභවතාව පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති, රජයේ වර්ධනය හිතකාමී ප්‍රතිපත්ති හරහා, දේශීය ව්‍යාපාරවලට ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පහසුකම් සලසයි. දේශීය නිෂ්පාදනය වැඩිදියුණු වීම, ඉදිරි කාල සීමාව තුළ බදු පදනම සහ ආදායම් එක්රැස් කිරීම පුළුල් කිරීමට ද උපකාරී වෙමින්, කුටුම්භ ආදායම ඉහළ නැංවිය හැකි අතර, එමගින් මැදි කාලීනව සැලසුම්ගත පරිදි රාජ්‍ය මූල්‍ය ඒකග්‍රතා මාවතට සහාය සැපයේ. අදාළ ක්ෂේත්‍රවල රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය සහභාගිත්වයෙන් යුතුව ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම සහ අපනයන ශක්‍යතාවන් සහිත අංශ වෙත ණය බර ඇති නොවන විදේශ විනිමය ලැබීම් ශක්තිමත් කිරීම, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රධාන වැඩසටහනක් වේ. ගැඹුරට මුල් බැස ඇති මෙම ව්‍යුහාත්මක ගැටලු ජාතික මට්ටමින් පිළිගැනීම සහ ඒවාට විසඳුම් සෙවීම සඳහා මෙතෙක් ගෙන ඇති පියවර අගය කළ යුතුය. මෙම ගැටලු විසඳීම සඳහා සුදුසු සහ අනුකූල ප්‍රතිපත්ති කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම, අපේක්ෂිත ඉහළ වර්ධන මාවත ඔස්සේ ආර්ථිකය තිරසාර ලෙස වේගයෙන් ඉදිරියට ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වේ.

**ඵලදායිතාවයේ මන්දගාමී ප්‍රගමනය ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික වර්ධනයක් අත් කර ගැනීම සඳහා ප්‍රධාන අභියෝගයක්ව පවතී.** ඉහළ ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට අවශ්‍යවන අයුරින්, ඵලදායිතාව වර්ධනයට ඇති බාධක ඉවත් කිරීම සඳහා සැලසුම් සහගත සහ තීරණාත්මක ප්‍රයත්න දැරීම රටට අත්‍යවශ්‍ය වේ. සැමට සමාන ප්‍රතිලාභ හිමිවන ආර්ථික වර්ධනයක්

1

සහ ආර්ථික සංවර්ධනයක් තහවුරු කිරීමේ දී, සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම ප්‍රමුඛස්ථානයක් ගනියි. ඵලදායිතාව සැලකිය යුතු පහළ මට්ටමක පැවතීම කෘෂිකාර්මික අංශයේ සේවයේ නියුතු ගොවීන් සහ අනිකුත් කම්කරුවන්ගේ ආදායමට අහිතකර බලපෑම් ඇති කරයි. වැඩි වන පරිමාණානුකූල ඵල, තාක්ෂණය පදනම් කරගත් කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය, යහපත් කෘෂිකාර්මික භාවිතයන් (Good Agricultural Practices) සහ භූගෝලීය තොරතුරු පද්ධති (Geographic Information Systems) ආදී වූ නවීන තාක්ෂණික ගොවිතැන් ක්‍රම උපයෝගී කර ගනිමින් සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම සහ සැපයුම් දාම හා ගොවීන් කාර්යක්ෂමව සම්බන්ධ කිරීම, කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව වැඩි දියුණු කළ හැකි සාධක අතර ප්‍රමුඛස්ථානයක් ගනියි. තවද, පසේ සාරවත් බව වැඩි දියුණු කිරීම සහ බෝගවල රෝග විනිශ්චය සඳහා නැනෝ තාක්ෂණය භාවිත කිරීම, ජල රෝපිත වගා කිරීමේ ක්‍රම (Hydroponics methods) ප්‍රවර්ධනය, දෙමුහුන් සහ ඉහළ අස්වැන්නක් ලබා දෙන බෝග තෝරා ගැනීම හා ඇසුරුම් කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා වැඩි දියුණු කරන ලද පසු අස්වනු තාක්ෂණයන් උපයෝගී කර ගැනීම ද කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂව කර්මාන්ත අංශයේ ඵලදායිතා වර්ධනයන් ද මන්දගාමී තත්ත්වයක පවතී. කර්මාන්ත අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමට බාධා පමුණුවන සාධක අතර, ඉහළ බලශක්ති සහ ශ්‍රම සූක්ෂමතාවක් පැවතීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ආරම්භ කිරීමට සහ දියුණු කිරීමට ඇති බාධක, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණයට ඇති ගැටලු සහ පර්යේෂණ හා සංවර්ධනයට වෙන් කෙරෙන ආයෝජන ප්‍රමාණවත් නොවීම යනාදිය ඇතුළත් වේ. ශ්‍රම බලකායේ තාක්ෂණික නිපුණතා වැඩි දියුණු කිරීම, කාර්මික කලාප ස්ථාපිත කිරීම, සාමූහික ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම සහ නවෝත්පාදන හැකියාවන් වැඩි දියුණු කිරීම යනාදිය කර්මාන්ත අංශයට ඉහළ කාර්යක්ෂමතා මට්ටම් වෙත ළඟා වීම සහ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම් තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම උදෙසා අවස්ථාවක් සලසා දෙන සාධක අතර ප්‍රමුඛස්ථානයක් ගනියි. සේවා අංශයේ ඵලදායිතාව වර්ධනය සඳහා ක්‍රියාවලි සහ නිෂ්පාදන නව්‍යකරණය සහ නව තාක්ෂණය යොදා ගැනීම අතිශය වැදගත් වේ. නවීන තාක්ෂණය යොදා ගැනීම සහ වඩා හොඳ කළමනාකරණ භාවිතාවන් අනුගමනය කිරීම, පවත්නා සම්පත් උපයෝගීතාව පහළ යෑම උදෙසා හේතුවන ඵලදායිතාව හා සම්බන්ධ ගැටලු විසඳා ගැනීමට සහාය වනු ඇත. මීට අමතරව, නව තාක්ෂණය යොදා ගැනීම, විශේෂයෙන් ම හතරවන කාර්මික විප්ලවය සිදුවන පසුබිමක, යාන්ත්‍ර ඉගෙනුම (Machine Learning), කෘතිම ස්නායුක ජාල (Artificial Neural Networks) සහ සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලය (Internet of Things) ආදී වූ දත්ත සහ තීරණ විශ්ලේෂණ තාක්ෂණය භාවිතය, ආර්ථිකයේ සියලු අංශවල ඵලදායිතාවය අනිවාර්යයෙන් වැඩි දියුණු කරනු ඇත. දැනුමින් පොහොසත් ශ්‍රම බලකාය යනු ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවට භාවිත කළ හැකි වැදගත් උත්තේජකයකි. එවැනි ශ්‍රම බලකායක්, දැනට පවතින සම්පත් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට සහ නව තාක්ෂණය යොදා ගැනීමට කර්මාන්ත සතු හැකියාව ඉහළ නංවා, ආර්ථිකයේ නවෝත්පාදන ධාරිතාව වැඩි කිරීමට දායක වන අතර, රැකියාවල ගුණාත්මකභාවය ද ඉහළ නංවයි. එබැවින්, කර්මාන්ත ආශ්‍රිත වෘත්තිය පුහුණු ප්‍රවර්ධනය සහ ශ්‍රමිකයින් යළි පුහුණු කිරීම සඳහා වන ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ඉදිරි කාලයේ දී ඉගැන්වීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ඉගෙනුම් විෂය පථය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ප්‍රතිසංස්කරණ තුළින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයේම ඵලදායිතා වර්ධනයන් සඳහා පහසුකම් සපයා දීම ද මෙයට ඇතුළත් වේ. මේ අතරතුර, සේවක නිපුණතා සංවර්ධනය සහ තාක්ෂණික උපයෝගීතාවය ඉහළ නැංවීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් රාජ්‍ය ආයතන තුළ දැනට ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික රැකියා උත්පාදනය සහ ජ්‍යොෂ්ඨත්වය පදනම් කරගත් උසස්වීම් ලබාදීමේ ප්‍රතිපත්තිවලින් උපායමාර්ගිකව ඉවත්වීම අවශ්‍ය වේ.

**අපනයන අංශය පුනර්ජීවනය කිරීම සඳහා සහ දීර්ඝ කාලීනව පවත්නා ගැටලු පිළිබඳ අවධානය යොමු කරමින් කලක සිට කළ යුතුව තිබූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා අතරතුර, හඳුනාගත් අපනයන අංශ ප්‍රවර්ධනයට ප්‍රමුඛතාව ලබා දීම ඉතා වැදගත් වේ.** වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසරේ දී අපනයන ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල වීමට පෙර, ශ්‍රී ලංකාව 2019 වසරේ දී ඉතිහාසයේ වාර්තා කරන ලද ඉහළම අපනයන ආදායම වාර්තා කළ ද, කලාපයේ අනෙකුත් සමාන ආර්ථිකයන් වාර්තා කළ අපනයන ආදායම් හා සැසඳීමේ දී, එම ඉපැයීම් බොහෝ පසුපසින් සිටියි. අනෙකුත් සමාන ආර්ථිකයන්ගේ ශක්‍යතා මට්ටම කරා ළඟා වන අතරතුර වසංගත තත්ත්වයේ බලපෑම මධ්‍යයේ අපනයන යහපත් මට්ටමකට රැගෙන ඒමත්, නව ගෝලීය පරිසරයේ ඇති තරගකාරීත්වයේ ප්‍රතිලාභ

ලබා ගැනීමත් අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධව, ශ්‍රී ලංකාවේ ඉහළ වර්ධන විභවතාවයක් ඇති කර්මාන්ත වැනි තෝරාගත් අංශවල අපනයන ප්‍රවර්ධනයට කෙටි කාලීනව ප්‍රමුඛතාව ලබා දීම තුළින් සමස්ත අපනයන ක්‍රියාකාරිත්වය ඉදිරියට රැගෙන යනු ඇති අතර, එමගින් දේශීය නිෂ්පාදනය දිරි ගැන්වෙනු ඇත. අපනයන අංශය පිළිබඳ සමස්තයක් වශයෙන් අවධානය යොමු කිරීම වෙනුවට වඩා ඉලක්කගත උප අංශ වෙත අවධානය යොමු කිරීමෙන් වේගවත් ප්‍රතිඵල ලබා ගත හැකි වනු ඇත. විදේශ අංශයට සහාය වීම උදෙසා අපනයන ආදායම වර්ධනය කිරීමට ඇති කඩිනම් අවශ්‍යතාව හේතුවෙන් එවැනි වේගවත් ප්‍රතිඵල ලබා ගැනීම ඉතාමත් වැදගත් වේ. ජාතික අපනයන ක්‍රමෝපාය සහ ආර්ථික පුනර්ජීවනය සහ දිළිඳුකම පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් හඳුනා ගනු ලැබූ ඉලක්කගත අංශ, ඒ සඳහා මූලාරම්භයක් වේ. ඖෂධීය නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත, පොල් ආශ්‍රිත නිෂ්පාදිත, කුළුබඩු, විද්‍යුත් සහ විදුලි උපාංග, නැව් සහ බෝට්ටු නිෂ්පාදනය, ආහාර සහ පාන වර්ග, ආලේපන වර්ග, සෙල්ලම් බඩු, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ සහ පිඟන් මැටි නිෂ්පාදිත ඇතුළු තවත් බොහෝ දෑ ඉහළ වර්ධන විභවතාවයක් සහිත කර්මාන්ත අතරට අයත් වේ. මීට අමතරව, ආනයන තීරු බදු ක්‍රමය සහ සංස්ථාපිත බදු ආදී වූ අනිකුත් බදු සඳහා සුදුසු සංශෝධන හඳුන්වා දීම, තෝරාගත් ආර්ථික අංශයන් දිරිමත් කිරීමට මෙන්ම, දේශීය වශයෙන් අගය එකතු කිරීම අඩු මට්ටමක පවතින, වැදගත්කමින් අඩු යැයි හැඟෙන අංශ අධෛර්යමත් කිරීම සඳහා ද භාවිත කළ හැකිය. තවද, රට ආවරණය වන පරිදි පමණක් නොව ඉලක්කගත අපනයන නිෂ්පාදන ද සන්නාමකරණය සඳහා සියලු පාර්ශ්වයන්ගේ සහයෝගය අත්‍යවශ්‍ය වේ. මැදි කාලීනව, නිෂ්පාදන සහ වෙළඳපොළ යන දෙ අංශයම සඳහා අපනයන විවිධාංගීකරණය සඳහා සුදුසු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ අපනයන පදනම, ඉහළ එකතු කළ අගයක් සහිත තාක්ෂණික වශයෙන් වැදගත් අපනයන කරා වැඩි දියුණු කිරීම සඳහා නව අපනයන අවස්ථා සොයා බැලීම තවදුරටත් වැදගත් වේ. අපනයනාභිමුඛ කර්මාන්ත සඳහා විදේශීය ඍජු ආයෝජන ලැබීම අවම වීම ද අපනයන අංශයේ වර්ධනය සඳහා බාධාවක් වේ. අපනයන අංශය පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වසනීයත්වය ඉහළ නංවමින්, අපනයනාභිමුඛ, ඉහළ ශක්‍යතාවයක් ඇති කර්මාන්ත වෙත විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම මෙන්ම, විදේශීය අංශය මුහුණ පා ඇති බොහොමයක් දිගු කාලීන ගැටලු විසඳීම සඳහා ස්ථාවර ආර්ථික ප්‍රතිපත්ති, සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ ස්ථායීතාව, තරගකාරී විනිමය අනුපාතික, අඩු සහ ස්ථාවර පොලී අනුපාතිකය, ව්‍යාපාර පවත්වාගෙන යෑමේ වාතාවරණය සහ විදේශ සබඳතා සුදුසු පරිදි කළමණාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

**සේවා අපනයනයන්හි භාවිතයට නොගත් විභවතාවන් ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින් සේවා අපනයනය වැඩි දියුණු කිරීම, ශ්‍රී ලංකාවේ විදේශීය ජංගම ගිණුම වෙත ලැබීම් වර්ධනය කිරීම සඳහා හේතු වන ප්‍රමුඛ උපාය මාර්ගයක් වේ.** අනපේක්ෂිත දේශීය සහ ගෝලීය බාධාවන් මගින් සංචාරක ඉපැයීම්වලට ඇති වී තිබෙන අවදානම් සහගත තත්ත්වය, සංචාරක අංශයේ ඉහළ ම විභවතාව අත් කර ගැනීමට උත්සාහ දරන අතරතුර, ඉහළ විභවතාවයකින් යුතු අනෙකුත් සේවා අපනයනය විවිධාංගීකරණය කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි. තිරසර පදනමක් මත විදේශ විනිමය ඉපැයීම් වැඩි දියුණු කිරීම සඳහා සංචාරක කර්මාන්තය හැරුණු විට, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, ප්‍රවාහන සේවා, මූල්‍ය සේවා සහ අනෙකුත් වෘත්තීය සේවා යන අංශ අවධානයට ලක් කළ හැකි සහ එසේ කළ යුතු ප්‍රධාන සේවා අපනයන අංශ වේ. දැනට සිදු වෙමින් පවතින ගෝලීය ඩිජිටල්කරණ ක්‍රියාදාමය, වාණිජමය වශයෙන් එහි ආකර්ෂණය, නිපුණතා සහිත ශ්‍රමිකයින්ට ප්‍රවේශ වීමට ඇති හැකියාව සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් ප්‍රතිලාභ ලබමින්, ගෝලීය වශයෙන් සේවා සපයන කර්මාන්තයක් වීම සඳහා අවශ්‍ය නමුත් මෙතෙක් හඳුනා නොගත් සුවිසල් විභවතාවයක් තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශය සතු වේ. ලොව පුරා තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන අංශ වසංගත තත්ත්වය තුළ දී මනා ක්‍රියාකාරීත්වයක් පිළිබිඹු කළේය. කෙසේ වුවත්, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව ඩිජිටල්කරණයට ලක් වූ රාජ්‍යයක් ලෙස ප්‍රවර්ධනය සහ සන්නාමකරණය කිරීම ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, ශ්‍රී ලංකාව හා සමාන හැකියාවක් ඇති අනෙකුත් කලාපීය රටවල් සමඟ සැසඳීමේ දී, මෙම අංශයේ ඉපැයීම් සැලකිය යුතු ඉහළ මට්ටමක් කරා තවමත් ළඟා වී නොමැති අතර, එවැනි ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීම තුළින් විදේශීය ඍජු ආයෝජන ප්‍රවර්ධනයට සහ ගෝලීය තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රධාන සමාගම්වල කලාපීය මූලස්ථාන ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම සඳහා ආකර්ෂණය කර ගැනීමට උපකාරී

වනු ඇත. එමගින් රට වෙත ලැබෙන විදේශ විනිමය ලැබීම් සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇත. ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකයේ අහිතකර ශ්‍රේණිගත වීම් ද විදේශීය සෘජු ආයෝජන කෙරෙහි මෙන්ම, මෙම අංශයේ වෙනත් නව ව්‍යාපාරවල ආයෝජන සඳහා ද අහිතකර බලපෑම් ඇති කරයි. තවද, විදේශීය විනිමය ලැබීම් සඳහා ජාත්‍යන්තර ගෙවීම් ද්වාරයක් (Payment Gateway) නොමැති වීම මෙම අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට අයහපත් බලපෑම් ඇති කරයි. රටට විදේශ විනිමය ආකර්ෂණය කර ගැනීමට අමතරව මෙම අංශය, ඉහළ වැටුප් ලැබීමේ හැකියාවක් සහ වැඩ කිරීම සඳහා නම්‍යශීලී වාතාවරණයක් ඇති කරමින් විශේෂයෙන් ම, තරුණ ශ්‍රම බලකායට සහ කාන්තාවන්ට රැකියා අවස්ථා විවර කරයි. ශ්‍රී ලංකාවේ දක්ෂ තරුණ ශ්‍රම බලකායක් සිටිය ද, කර්මාන්තයෙන් ඇති වන ඉල්ලුම සැපිරීමට එය ප්‍රමාණවත් නොවේ. කලාපය තුළ ප්‍රසිද්ධ අනෙකුත් තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන හා තරග කරන අතර ම, ඉහළ වැටුප් ලබාගන්නා තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සහ ඩිජිටල් නොමැඩිවරුන් (digital nomads) සඳහා රැකියා කිරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව සක්‍රීයව ප්‍රවර්ධනය කළ හැකිය. මේ අතර, ඉන්දියානු සාගරයේ ශ්‍රී ලංකාවේ මූලෝපායික පිහිටීම, ආසියාවේ සමුද්‍රීය සහ සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ඉස්මතු වීම සඳහා සුවිසල් අවස්ථාවක් සලසා දෙයි. නැගෙනහිර බහාලුම් පර්යන්තය සේවා සැපයීම සඳහා එක් කිරීම මෙන්ම, බටහිර බහාලුම් පර්යන්තය කඩිනමින් සංවර්ධනය කිරීම මගින් බහලු, ප්‍රතිනැව්ගත කිරීම් සහ භාණ්ඩ හැසිරවීම් පරිමා ඉහළ යෑම තුළින් වරාය සේවා ඉපැයීම් ඉහළ නැංවෙනු ඇත. මූල්‍ය සේවා අපනයන වැඩි දියුණු කිරීම ද ශ්‍රී ලංකාවට ඇති විකල්පයකි. කොළඹ වරාය නගරය මූල්‍ය කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම තුළින් මූල්‍ය සේවා අපනයන ඉහළ නැංවීම ඔස්සේ අපනයන ආදායම වර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**කොවිඩ්-19 වසංගතය හමුවේ නිර්මාණය වූ නව සාමාන්‍ය තත්ත්වය යටතේ සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා විදේශීය මෙන්ම දේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සංචාරක අංශය තුළ නව්‍ය උපායමාර්ග ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.** මාස 10ක් පුරා මෙරට දේශ සීමා සංචාරකයින් සඳහා වසා තැබීමෙන් අනතුරුව, 2021 වසරේ ජනවාරි මාසයේ දී 'ජෛව බුබුළු' යන නව්‍ය සංකල්පය යටතේ ශ්‍රී ලංකාව විදේශ සංචාරකයින් සඳහා රට විවෘත කළ අතර, එහිදී සංචාරකයින් සඳහා නිරෝධායන අවශ්‍යතා ඉවත් කරමින්, සමාජ දුරස්ථභාවය දැඩිව ක්‍රියාත්මක කිරීම තුළින් විදේශ සංචාරකයින්ගේ සහ දේශීය ප්‍රජාවගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව, තහවුරු කෙරිණි. වසංගතය දිගින් දිගටම පවතින තත්ත්වයක් යටතේ, විවිධ රටවල්වලින් සංචාරකයින් ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය කර ගැනීම සඳහා කටයුතු කරන අතරතුර, බලයලත් නවාතැන් සපයන්නන් සහ සංචාරක ආකර්ෂණ ස්ථාන ඇතුළත් කරමින් ජෛව බුබුළු සංකල්පය තව දුරටත් පුළුල් කළ හැකිය. තවද, සංචාරකයින් සඳහා විවෘත කළ තවත් රටක් වන මාලදිවයින ආදී වූ රටවල් සමග කලාපීය ජෛව බුබුළු නිර්මාණය කිරීම හෝ අනිකුත් රටවල් සමග සංචාරක කොරිඩෝ නිර්මාණය කිරීම පිළිබඳව සාකච්ඡා කළ හැකිය. එසේම, කොවිඩ්-19 සඳහා එන්නත ලබා ගෙන ඇති පුද්ගලයින් සඳහා පරීක්ෂා කිරීම් සහ නිරෝධායන අවශ්‍යතාවලින් තොරව සංචාරය කිරීම සඳහා අවස්ථා ඉහළ නැංවීමේ හැකියාව පිළිබඳව සොයා බැලිය යුතු ය. මේ අතර, ජෛව බුබුළු සංකල්පය යටතේ ක්‍රියාත්මක වීමට ප්‍රධාන වශයෙන් හැකියාව ඇත්තේ විධිමත් අංශය වීම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ සංචාරක අංශයට සහාය වීම සඳහා විශේෂයෙන්ම, අවිධිමත් අංශයේ දේශීය සංචාරක කර්මාන්තය තවදුරටත් දියුණු කිරීමට අවකාශය ඇත. මීට අමතරව, දේශීය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම තුළින්, ශ්‍රී ලාංකිකයන් විවේකය වෙනුවෙන් විදේශ සංචාර සඳහා යොමු වීම අඩු කර ගත හැක අතර, ඉන් විදේශ විනිමය ගෙවීම් අවම කර ගත හැකිය. මේ සම්බන්ධයෙන්, සති අන්ත සඳහා සැලසුම් කරන ලද චාරිකා පැකේජ, විවිධ වයස් කාණ්ඩයන්ට ගැළපෙන පරිදි සකස් කළ චාරිකා, අධ්‍යාපනික චාරිකා, සාමාන්‍ය පරිසරයෙන් ඈත් වී සිටීමට සිදුකරන චාරිකා සහ විවිධ ආදායම් මට්ටම් සඳහා උචිත අයුරින් සකස් කරන චාරිකා ආදී වූ පියවර තුළින් දේශීය සංචාරක කර්මාන්තය තවදුරටත් දියුණු කිරීමට සංචාරක කටයුතු හා සම්බන්ධ ආයතන පෞද්ගලික අංශය සමග එක්ව කටයුතු කළ යුතුව ඇත. තවද, දේශීය ආකර්ෂණීය ස්ථාන සහ දේශීය සංචාරකයින් වෙනුවෙන් සංවිධානය කෙරෙන චාරිකා පිළිබඳ තොරතුරු ඇතුලත්, පරිශීලනයට පහසු සහ දේශීය වශයෙන් වූ තොරතුරු ද්වාරයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවක් පවතී. එසේම, නගරයේ සිට සංචාරක ආකර්ෂණ ස්ථාන කරා ප්‍රවාහන පහසුකම් සැපයීම තුළින් ස්ථාන අතර සම්බන්ධතාව ඉහළ නංවා ගත හැකිය. තවද, පුද්ගලික ආරක්ෂාව පිළිබඳ ගැටලු, සංචාරක ස්ථානයන්හි පහසුකම් අවම වීම, සංචාරක

ආකර්ෂණ ස්ථානවල දී මිල අධික ප්‍රවේශපත්‍ර ලබා ගැනීමට සිදු වීම, ශබ්ද දූෂණය සහ අධික තදබදය ආදී වූ අතීතයේ සංචාරකයින්ගේ පැමිණීම අඩු වීමට හේතු වූ ගැටලු පිළිබඳ අවධානය යොමු කිරීමට මෙම වසංගතය විසින් නිර්මාණය කරන ලද තත්ත්වය අවස්ථාවක් කර ගත යුතුව ඇත. විදේශීය වශයෙන් හෝ දේශීය වශයෙන් පැන නගින අනපේක්ෂිත අභියෝග හමුවේ සංචාරක අංශයේ අවදානම්වලට මුහුණ දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා, විශේෂයෙන් ම, මැදි කාලීනව සංචාරක අංශය තවදුරටත් පුළුල් වීමක් අපේක්ෂා කරන්නේ නම්, සංචාරක අංශයේ අවිධිමත්බව අවම කිරීම සහ සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන් සඳහා රක්ෂණ යෝජනා ක්‍රම සහ සමාජ ආරක්ෂණ යාන්ත්‍රණ හඳුන්වා දීම වැදගත් වේ. මීට අමතරව, නියාමනය නොකරන නවාතැන් සපයන්නන්ගෙන් සහ සංචාරක සේවාවන් යම් කිසි මුදලකට අලෙවිකරණයට යොමු කිරීම සඳහා වේදිකාව සපයන වෙබ් අඩවි ඇතුළු වෙනත් සේවා සපයන්නන්ගෙන් අය විය යුතු බදු අය කර ගැනීම සඳහා යාන්ත්‍රණ ඇති කළ යුතු අතර, එම යාන්ත්‍රණ දැඩිව ක්‍රියාත්මක කළ යුතු ය. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විදේශ විනිමය ඉපයීමේ අංශයක් වන, සංචාරක අංශයට තිරසාරව පැවතීම සඳහා, අවදානම් තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කර ගන්නා අතරතුර, වසංගතයේ සහ නව සාමාන්‍ය තත්ත්වයේ බලපෑමට ප්‍රතිචාර දක්වමින් එම අංශයේ ප්‍රගතිය උදෙසා ඉහත දැක් වූ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත.

**කොළඹ වරාය නගරය යනු දකුණු ආසියාවේ ඇති එම වර්ගයේ පළමු ව්‍යාපෘතිය වන අතර, ආයෝජකයින්ට හිතකර වාතාවරණයක් කඩිනමින් ලබා දීම තුළින් උපායමාර්ගික ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා රටෙහි ඇති හැකියාව මත එමගින් සමාජ ආර්ථික ප්‍රතිලාභ රාශියක් රටට අත්කර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මනාව ව්‍යුහගත කරන ලද සහ තරගකාරී නෛතික, බදු හා නියාමන සහ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් තුළින් ආයෝජකයින්, ව්‍යවසායකයින්, නවෝත්පාදකයින්, සමාගම් හා මූල්‍ය ආයතන ආකර්ෂණය කර ගැනීම සඳහා ඩුබායි, සිංගප්පූරුව සහ හොංකොං වැනි අනෙකුත් ලෝ පතල ආයෝජන කේන්ද්‍රස්ථාන සමඟ තරග කළ හැකි නවීන ව්‍යාපාරික වාතාවරණයක් සහිතව කොළඹ වරාය නගරය සංවර්ධනය වෙමින් පවතී. ලෝකයේ බොහෝ මූල්‍ය සේවා මධ්‍යස්ථාන පැවතිය ද, කොළඹ වරාය නගරය දකුණු ආසියාවේ සහ නැගෙනහිර ආසියාවේ ප්‍රධාන නගර ආසන්නයේ පිහිටීමේ වාසිය ඇත. කොළඹ වරාය නගරය වෙත ලැබෙනු ඇතැයි අපේක්ෂිත විදේශීය ආයෝජන ලැබීම්, මැදි කාලීනව රටේ ගෙවුම් තුලනය මූල්‍යකරණය කිරීම සඳහා ඉතා වැදගත් වේ. තවද, මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ රැකියා අවස්ථා උත්පාදනය කිරීම හරහා ආර්ථික වර්ධනයට හා රාජ්‍ය ආදායම සඳහා දායක වෙමින්, ජාතික ආර්ථිකයට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, දකුණු ආසියාවේ අනෙකුත් නගර හා සැසඳීමේ දී, හිතකර ජීවන තත්ත්වයන් සඳහා කොළඹ නගරය ප්‍රචලිත වීම සහ රටේ සිටින නිපුණතා සහිත ශ්‍රම බලකාය සමඟ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය මගින් උසස් තත්ත්වයේ රැකියා අවස්ථා නිර්මාණය කරනු ඇතැයි ද, ඒ තුළින් වර්තමානයේ මෙරට මුහුණ දෙමින් සිටින බුද්ධි ගලන ගැටලුව සමනය කෙරෙනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. මේ අතර, කොළඹ වරාය නගර කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟ ලෝකයේ අනෙකුත් මූල්‍ය කේන්ද්‍රස්ථාන සමඟ සාර්ථකව තරග කිරීමට ශ්‍රී ලංකාවට හැකි වනු පිණිස, සැලසුම් කර ඇති පරිදි විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා, ප්‍රතිපත්ති ස්ථාවරව පවත්වා ගැනීම, ව්‍යාපාර සිදු කර ගෙන යෑමේ වාතාවරණය වැඩිදියුණු කිරීම සහ අනුමැතිය ලබා දීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි කඩිනම් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී.

**සැලකිය යුතු ප්‍රමාණයක විදේශීය ඍජු ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට රට අඛණ්ඩව අසමත් වීම තුළින්, දිගු කාලීන දැක්මක් සහිතව ස්ථාවර ප්‍රතිපත්ති රාමුවක් පවත්වා ගෙන යන අතරම, ව්‍යුහාත්මක, අයතනික සහ ප්‍රතිපත්තිමය බාධාවන්වලට පිළියම් යෙදීමේ ඇති වැදගත්කම පෙන්වා දෙයි.** අනෙකුත් ප්‍රාග්ධන ප්‍රවාහ මෙන් නොව, විදේශීය ඍජු ආයෝජන තාක්ෂණය ලැබීම, විදේශ විනිමය ඉපැයුම් වර්ධනය කිරීම සහ තාක්ෂණික හා කළමනාකරණ දැනුම ඔස්සේ මානව ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම වැනි හිතකර ලක්ෂණ ගණනාවකින් සමන්විත වේ. තවද, විදේශීය ඍජු ආයෝජන තුළින් රැකියා අවස්ථා උත්පාදනය සහ නව වෙළඳපොළ වෙත පිවිසුම් හැකියාව වැඩි කරමින් කලාපීය සහ ගෝලීය අගය දාමයන් සමඟ ඒකාබද්ධ වීමට පහසුකම් සැලසීම, යටිතල පහසුකම් සංවර්ධනයට සහ තාක්ෂණික නව්‍යකරණයට පහසුකම් සැලසීමට පිටිවහලක් ලැබේ. පොදුවේ ගත් කල, විවිධ ආයෝජන සහ ණය ප්‍රවාහ

1

වැනි අනෙකුත් මූලාශ්‍රවලට සාපේක්ෂව විදේශීය සෘජු ආයෝජන ලැබීම් ආර්ථිකය වෙත දිගු කාලීන විදේශ විනිමය ලැබෙන මූලාශ්‍රයක් වේ. පසු ගිය දශකය මුළුල්ලේ විදේශීය සෘජු ආයෝජන සැලකිය යුතු ප්‍රමාණයක් ආකර්ෂණය කර ගත් බොහෝ රටවලට විදේශීය ණය කළමනාකරණය කළ හැකි මට්ටම්වල පවත්වා ගෙන යැමට හැකි වීම තුළින් විදේශීය ණය තිරසාර මට්ටම්වල පවත්වා ගෙන යාමට සමත් වී ඇත. ප්‍රධාන වශයෙන් වෙළඳාම් කළහැකි භාණ්ඩ හා සේවා නිපදවන අංශ සහ යටිතල පහසුකම් වෙත විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම අනාගතයේ දී ශ්‍රී ලංකාවට විදේශීය ණය තිරසාරත්වය වැඩි කර ගැනීමට මගක් වනු ඇත. කොළඹ වරාය නගර සංවර්ධනය කිරීම, කොළඹ සහ හම්බන්තොට වරායයන් භාණ්ඩ වෙළඳාමේ කේන්ද්‍රස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීමෙන් සහ දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින් සඳහා නවීන ආයෝජන කලාපයක් පිහිටුවීම ඔස්සේ ඉදිරි කාලයේ දී රටට සැලකිය යුතු විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පසුබිම තුළ, හඳුනා ගන්නා ලද මෙම ව්‍යාපෘති වෙත අපේක්ෂිත විදේශීය සෘජු ආයෝජන ලැබීම් ආකර්ෂණය කර ගැනීම වේගවත් කළ යුතු අතර, මෙම කලාපවලින් බැහැරව වෙනත් කලාපවලට ද ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ඔවුන් සමඟ අඛණ්ඩව සාකච්ඡා පවත්වා ගෙන යාමට ද ප්‍රමුඛතාව ලබා දිය යුතු වේ. මෑදි කාලීනව විදේශීය සෘජු ආයෝජනවල හිතකර වර්ධනයක් පවත්වා ගෙන යාම සඳහා පසු ගිය දශක කිහිපය පුරා විදේශීය සෘජු ආයෝජන ලැබීම් සඳහා බාධාවන් ඇති කළ ගැටලුවලට පිළියම් යෙදීම සඳහා ජාතික ප්‍රමුඛතාවක් ලෙස ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ දර්ශකයෙහි ශ්‍රේණිගත කිරීම් වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගණනාවක් ගනු ලැබුව ද, තවමත් ශ්‍රී ලංකාව එම ශ්‍රේණිගත කිරීමේ පහළ මට්ටමක රැඳී සිටියි. එබැවින්, ව්‍යාපාර පවත්වා ගෙන යෑම පහසු කිරීමේ පරිසරය වැඩි දියුණු කිරීම කඩිනම් කිරීම සහ ආයෝජනවලට අනුමැතිය ලබා දීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි තුළ ඇති වන අනවශ්‍ය රාජ්‍ය තාන්ත්‍රික ප්‍රමාදයන් ඉවත් කිරීම සඳහා සාමූහික ප්‍රයත්නයන් දැරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව විසින් අනාගතයේ දී විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සඳහා සංගත ආයෝජන ප්‍රතිපත්තියක් ඇති කිරීම, කාර්යක්ෂමතාව සහ වෙළඳපොළ පදනම් කරගත් විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම, ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත ක්‍රමවේදයන්ට අනුකූලව නිර්මාණය කරන ලද ආයෝජන නීති සම්පාදනය කිරීම, ශ්‍රම හා ඉඩම් වෙළඳපොළ ප්‍රතිසංස්කරණය, නියාමන සහ ඇගයීම් රාමුවක් වැඩි දියුණු කිරීම, වැඩි දියුණු කළ ආයෝජන ප්‍රවර්ධන කටයුතු, ආර්ථික කලාප ඵලදායී කළමනාකරණය සහ සංවර්ධනය, ආයෝජකයන්ගේ දුක්ගැනවිලිවලට පිළියම් යෙදීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් ඇති කිරීම සහ ආයෝජන දිරිගැන්වීම සඳහා වන ක්‍රියාමාර්ග ක්‍රමානුකූල ඇගයීමකට ලක් කිරීම ඇතුළු වැඩි දියුණු කර ගත යුතු ක්ෂේත්‍ර කිහිපයක් ඇත. ආයෝජකයින් හට ආයෝජනය කළ හැකි ක්ෂේත්‍ර සම්බන්ධව මෙන්ම, එවැනි ආයෝජන සඳහා අදාළ වන නෛතික රාමු පිළිබඳව යාවත්කාලීන වීමට විනිවිදභාවයකින් යුතු යාන්ත්‍රණයක් තිබිය යුතුය.

**සාර්ව ආර්ථික ස්ථායීතාවය තහවුරු කිරීමට සහ දිගු කාලීන ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ඇති බාධා වැළැක්වීම සඳහා, විදේශීය ණයෙහි ප්‍රසාරණය අඩු කර ගත යුතුව ඇති අතර, ඒ සඳහා දේශීය ජංගම ගිණුමේ ශේෂය සහ රාජ්‍ය මූල්‍ය ශේෂය වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ.** ශ්‍රී ලංකාව දශක ගණනාවක සිට රටෙහි රාජ්‍ය මූල්‍ය සහ විදේශීය අංශවල අසමතුලිතතාවන්ගෙන් හට ගන්නා රාජ්‍ය අයවැය හිඟය හා විදේශීය ජංගම ගිණුමේ හිඟය යන ද්විත්ත්ව හිඟයයන් අත්දකිමින් සිටියි. රාජ්‍ය වියදම අඩු කිරීමට අසීරු වීම සහ සාපේක්ෂව රාජ්‍ය ආදායම අඩු වර්ධනයන් වාර්තා කිරීම හේතුවෙන් ඉහළ අයවැය හිඟයයන් වාර්තා වේ. විශාල වෙළඳ හිඟයයන් හේතුවෙන් විදේශීය ජංගම ගිණුමේ හිඟයයන් වැඩි වී තිබේ. මෑත වසරවල දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම වෙළඳ භාණ්ඩ අපනයන අගය මෙන් දෙගුණයක් වාර්තා කිරීමත් සමඟ මෙම තත්ත්වය තවදුරටත් අහිතකර වී ඇත. වෙළඳ හිඟය ක්‍රමයෙන් වැඩි වීම ඕනෑම ආර්ථිකයකට අහිතකර වුවත්, පාලනය කර ගත හැකි මට්ටමක වෙළඳ හිඟයක් පැවතීම ශ්‍රී ලංකාව වැනි කුඩා නැගී එන වෙළඳපොළ ආර්ථිකයකට සාමාන්‍ය තත්ත්වයකි. ඉතුරුම් සහ ආයෝජන පරතරය තුළින් පිළිබිඹු කෙරෙන ජංගම ගිණුමේ හිඟය මගින් ශ්‍රී ලංකාවට එහි ආයෝජන කටයුතු මූල්‍යනය කිරීම සඳහා විදේශීය ප්‍රාග්ධනය ලබා ගැනීමේ අවශ්‍යතාව ඇති කර තිබේ. ද්විත්ත්ව හිඟයන් පැවතීම නොව සැබෑම ගැටලුව වන්නේ රටක් එවැනි හිඟයයන් මූල්‍යනය කරනුයේ කෙසේද යන්නයි. නිදසුනක් ලෙස, ද්විත්ත්ව හිඟයයන් පවතින බොහෝ ආර්ථික ණය නොවන ක්‍රම ඔස්සේ

එවැනි හිඟයයන් මූල්‍යනය කිරීම කළමනාකරණය කර ගනියි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව එවැනි හිඟයයන් බොහෝ විට මූල්‍යනය කර ඇත්තේ විදේශීය ණය ගැනීම් තුළින් වන අතර, එය විෂම චක්‍රයකට හේතු වී ඇත. සංචාරක ඉපැයීම් ඇතුළු බෙහෙවින් අවශ්‍යව පවතින විදේශීය ලැබීම් අඩු වීමට හේතු වූ කොවිඩ්-19 වසංගතයේ බලපෑම හමුවේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශයෙහි අවදානම් සහගත බව 2020 වසර තුළ දී තවදුරටත් ඉහළ ගොස් ඇති අතර, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට ඇති ප්‍රවේශය ද සීමා විය. රජය දැනටමත් හඳුනා ගෙන ඇති පරිදි, දේශීය නිෂ්පාදන ආර්ථිකය වැඩි දියුණු කිරීම සහ ණය බර ඇති නොකරන විදේශ විනිමය ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීම ශ්‍රී ලංකාවට මෙම විෂම චක්‍රය බිඳ දැමීම සඳහා අතිශය වැදගත් ය. මේ සඳහා රජය දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇති නමුත්, කෙටි කාලීනව අත්‍යවශ්‍ය නොවන ආනයන වියදම් සහ අනෙකුත් විදේශීය විනිමය ගෙවීම් අඩු කිරීම සඳහා පනවා ඇති සීමා කිරීම් අඛණ්ඩව පවත්වා ගෙන යෑම වැනි අතිරේක ක්‍රියාමාර්ග තවදුරටත් පවත්වා ගැනීම අවශ්‍ය වේ. අපනයනාභිමුඛ නිෂ්පාදන අංශය වෙත විදේශීය සෘජු ආයෝජන ලබා ගැනීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින්, රටට විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ වාතාවරණය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරමින් පහසුකම් සැලසීම අවශ්‍ය වේ. මේ අතර, රජයේ නිර්-ඉතුරුම් අවම කරන අතරතුර, පවත්නා අඩු පොලී අනුපාතික වාතාවරණය තුළ නව්‍ය මූල්‍ය උපකරණ හඳුන්වා දීම ඔස්සේ දේශීය ඉතුරුම් ඉහළ නැංවීම සඳහා උත්සාහ දැරිය යුතු ය.

**රජය විසින් ක්‍රියාමාර්ග ගත යුතුව පවතින ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අභියෝග ලෙස රාජ්‍ය ආදායම දිගින් දිගටම අඩු මට්ටමක පැවතීම, පුනරාවර්තන වියදම අඩු කිරීමට අපහසු වීම, අයවැය හිඟයයන් මූල්‍යනය කිරීමේ අවශ්‍යතා ඉහළ යෑම සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ණය මට්ටම ඉහළ යෑම මෙන්ම රාජ්‍ය ව්‍යවසායයන්ගේ මූල්‍ය කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව සඳහන් කළ හැකිය.** දශක කිහිපයක සිට පවත්නා විවිධ බදු නිදහස් කිරීම්/බදු විරාම, බදු පැහැර හැරීම සහ දුර්වල බදු පරිපාලනය යනාදිය හේතුවෙන් බදු ආදායම රැස් කිරීම කෙරෙහි බාධා එල්ල වී ඇත. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් කෙටි කාලීන පසුබෑමකට ලක් වුවද, රජය විසින් හඳුන්වා දී ඇති ප්‍රතිසංස්කරණවල අරමුණ වන්නේ මෙම ගැටලුවලට පිළියම් යෙදීමයි. රාජ්‍ය මූල්‍ය උත්තේජන ක්‍රියාමාර්ග හේතුවෙන් බදු ආදායම් රැස් කිරීම මත එල්ල වූ අහිතකර කෙටි කාලීන බලපෑම, ඉදිරියේ දී ආර්ථික කටයුතු අපේක්ෂිත පරිදි යළි යථා තත්ත්වයට පත්වීමත් සමඟ පහව යනු ඇතැයි අපේක්ෂා කෙරේ. සරල, කාර්යක්ෂම සහ සාධාරණ බදු පද්ධතියක් තුළ බදු අනුකූලතාව වැඩි දියුණු කිරීමට අවදානම් පදනම් කර ගත් ආදායම් පරිපාලනය සඳහා වන හැකියාව ශක්තිමත් කරන අතරතුර, බදු පදනම ඉහළ නංවමින් සහ බදු පද්ධතිය තුළ ලේඛන භාවිතයේ අවශ්‍යතා සරල කිරීම ඔස්සේ රාජ්‍ය ආදායම වර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. මේ අතර, පොලී ගෙවීම්, වැටුප් හා වේතන සහ විශ්‍රාම වැටුප් ගෙවීම් වැනි අනිවාර්යයෙන් සිදු කළ යුතු රාජ්‍ය මූල්‍ය වියදම් කාණ්ඩවල ඉහළ යෑම රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම් මත අඛණ්ඩව පීඩනයක් ඇති කරන අතර, එමගින් රජයේ වියදම් තාර්කිකරණ සැලසුම්වලට අභියෝග එල්ල කෙරෙයි. අඩු ආදායම් රැස් කිරීමේ සහ දැඩි මූල්‍ය තත්ත්වයන් යටතේ සාපේක්ෂව විශාල රාජ්‍ය වියදම, ඉහළ අයවැය හිඟයයන්ට හේතු වී ඇති අතර, එමගින් රජය විසින් කෙටි හා මැදි කාලීනව අතරතුර සිදු කළ යුතුව ඇති විශාල ණය සේවාකරණ වියදම් සහ ණය ගැනීමේ අවශ්‍යතා ඉහළ යෑම සමඟ, ඉදිරි කාලය තුළ ඇති විය හැකි සැලකිය යුතු පීඩනයන් මගහරවා ගැනීමට රාජ්‍ය වියදම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව මතු කෙරෙයි. ඉදිරි කාලය තුළ මුදල් ප්‍රසාරණයක් සිදු නොවන මූලාශ්‍රයන් මගින් අයවැය හිඟය මූල්‍යනය කිරීමේ අවශ්‍යතාව මින් පිළිබිඹු කෙරේ. සපේක්ෂ වශයෙන් ඉහළ රාජ්‍ය මූල්‍ය හිඟය සහ රාජ්‍ය ණය ක්‍රමයෙන් අඩු කර ගැනීමේ අපේක්ෂාවෙන් පසුගිය කාලයේ දී ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයන් කිසියම් දුරකට අසාර්ථක වී ඇත. මෙම පසුබිම හමුවේ, රජය විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව මනාව පවත්වා ගෙන යෑම සහ ඉදිරි කාලය තුළ දී අපේක්ෂිත ආර්ථික යථා තත්ත්වයට පත් වීම හා වර්ධනය සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කිරීම යන අරමුණු අතර මනා සමබරතාවක් පවත්වා ගත යුතුව ඇත.

**ඉදිරි කාලය තුළ දී ප්‍රතිපත්ති සකස් කරන විට, කොවිඩ්-19 වසංගතය මගින් ජනගහනයේ අඩු වරප්‍රසාදිත කොටස් කෙරෙහි විෂමානුපාතික බලපෑමක් එල්ල කර ඇති බව සහ ආදායම් සම්බන්ධයෙන් පමණක් නොව, කෙටි කාලීනව සමාජ ආර්ථික යහපැවැත්මට හා දිගු කාලීනව ඵලදායීතාවට බලපාන අනෙකුත් පැතිකඩවලට සම්බන්ධ විෂමතා ද උග්‍ර කර ඇති බව නිසි අවධානයට ලක් කළ යුතුය.** ලෝකය පුරා සහ ශ්‍රී ලංකාව තුළ නිරීක්ෂණය කොට ඇති පරිදි, කොවිඩ්-19 මගින් සෑම පුද්ගලයෙකු කෙරෙහිම එල්ල කර ඇති බලපෑම ඒකාකාර නොවේ. නිවසේ සිට රැකියා කිරීමේ විකල්ප සඳහා ඉඩක් නොමැති සහ කිසිදු

වැටුප් සහිත නිවාඩුවක් නොලැබෙන ස්වරූපයේ රැකියාවල නියුතු අඩු ආදායම්ලාභී පවුල්වල අඩු වේතන උපයන ශ්‍රමිකයන්, වැඩි වශයෙන් ම අවදානමට ලක් විය හැකි කොටස් වේ. ආදායම් විෂමතා පිළිබඳව සැලකීමේ දී, පසුගිය දශක කිහිපය පුරා දිළිඳුභාවයෙහි සැලකිය යුතු පහත වැටීමක් තිබුණ ද, ශ්‍රී ලංකාව තුළ ආදායම් විෂමතාවය සම්බන්ධයෙන් සිදු ව ඇත්තේ සුළු වෙනස් වීමක් පමණි. 1953 සිට 2016 දක්වා කාලය තුළ දී පවත්වන ලද ගෘහ ඒකක සමීක්ෂණවලට අනුව, සමස්ත ගෘහ ඒකක ආදායමින් දිළිඳුතම සියයට 20 වෙත හිමි වූ ආදායම් ප්‍රතිශතය වෙනස් වී ඇත්තේ ඉතා සුළු වශයෙන් පමණි. 1980/81 සිට 2016 දක්වා කාල සීමාව තුළ දී පවත්වන ලද ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණ වටයන් සලකා බැලීමේ දී, ගිනි සංගුණකය සැලකිය යුතු වෙනස්වීමක් නොපෙන්වමින් 0.43-0.48 අතර රැඳී පැවතුණි. රජය විසින් ලබා දී ඇති සහන ක්‍රියාමාර්ග කිහිපය එම ප්‍රතිලාභීන්ට මෙම දුෂ්කර තත්ත්ව යටතේ සිය ජීවන තත්ත්වය යම් තාක් දුරකට පවත්වා ගැනීමට උපකාරී වූව ද, වසංගතය අතරතුර ජීවනෝපායන් හා රැකියාවලින් ලැබෙන ආදායම අහිමිවීම සලකා බැලීමේ දී, ආදායම් විෂමතා වඩාත් තීව්‍ර වී තිබිය හැකිය. මෑත වසරවල දී, දරිද්‍රතාවය පිටුදැකීමේ රජයේ ප්‍රයත්නයන් සඳහා යොදවා ඇති සැලකිය යුතු තරම් වූ රාජ්‍ය මූල්‍ය වියදම සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, එම ප්‍රයත්නවල ඉලක්කගතභාවය හා ඒවායෙහි කාර්යක්ෂමතාවය පිළිබඳව පවතින ගැටලු සහගත බව ද අවධානයට ලක් වී ඇත. සුබසාධන වැඩසටහන් හා සම්බන්ධ තොරතුරු ගබඩා කිරීම සඳහා මේ වන විට සකස් කෙරෙමින් පවතින ලේඛනගත සමාජ තොරතුරු පද්ධතිය මගින් එම සුබසාධන වැඩසටහන්වලට පුද්ගලයන් ඇතුළත් කර ගැනීමේ සහ ඉන් ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිවල දැනට පවතින අපැහැදිලිතා සඳහා විසඳුම් ලබා දීමට ත්, ප්‍රතිලාභ සැපයීම විධිමත් කිරීමට ත් අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 වසංගතය මගින් අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශයේ විෂමතා ද ඉස්මතු කෙරිණි. අධ්‍යාපන කටයුතු ඩිජිටල් වේදිකා වෙතට වේගයෙන් සංක්‍රමණය වීම අගය කළ හැකි වුව ද, විශේෂයෙන් ම අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන් හා දුෂ්කර පළාත්වල ජීවත් වන ළමුන් පිළිබඳව සැලකූ විට, එවැනි නව ක්‍රමවේදවල කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ගැටලු මතු වී තිබේ. ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන සනත්වය ඉහළ මට්ටමක පැවතුණ ද, 2020 වසරේ පළමු භාගය සඳහා වූ පරිගණක සාක්ෂරතා සමීක්ෂණයට අනුව, පරිගණක සාක්ෂරතාව සියයට 32ක් වන අතර, ගෘහ ඒකක අතරින් ඩෙස්ක්ටොප් හෝ ලැප්ටොප් පරිගණකයක් හිමි ප්‍රතිශතය සියයට 22.2ක් පමණක් වීමෙන් මංගත අධ්‍යාපනයට ඇති ප්‍රවේශය සම්බන්ධ ගැටලු සහගතබව පෙන්නුම් කෙරේ. ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් පැවතුණ ද, ආදායම හා අධ්‍යාපනය සම්බන්ධව පවතින එවැනි විෂමතාවන් මගින් මැදි හා දිගු කාලීනව අවස්ථා හා ඉහළ සමාජ තල වෙත ගමන් කිරීම සම්බන්ධයෙන් අනාගතයේ දී විෂමතා ඇති කිරීමට ඉඩ ඇත. අනෙක් අතට, එවැනි විෂමතාවල දිගින් දිගටම පවත්නා ප්‍රතිවිපාක මගින් පරම්පරා ගණනනාවකට බලපෑම් ඇති විය හැකි අතර, ආර්ථික වර්ධනයට හා සමාජ ආර්ථික යහපැවැත්මට අහිතකර ලෙස බලපාමින් එවන් විෂමතා අඛණ්ඩව පවතිනු ඇත. වසංගතය පවතින කාල සීමාව අවිනිශ්චිත වුව ද, එයට සමාන අනපේක්ෂිත සිදුවීම් හෝ ඩිජිටල්කරණය වැනි දන්නා සංසිද්ධීන්වලින් පැන නගින වෙනත් ව්‍යුහාත්මක වෙනස්කම් නිසි ලෙස සැලසුම් නොකිරීමෙන්, එමගින් අනාගතයේ දී පවතින විෂමතාවන් උග්‍ර විය හැකිය. අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි ආදායම් විෂමතා ඇති නොවීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්ති සඳහා සාර්ව ප්‍රවේශයක් තිබුණ ද, ආර්ථිකයේ වෙනස්වන ස්වභාවය අනුව මෙම සේවාවන් හි ගුණාත්මකභාවය, ප්‍රමාණය සහ අදාළත්වය පිළිබඳව ඇගයීමේ අවශ්‍යතාවක් පවතියි. විෂමතා චක්‍රය බිඳ දැමීම සඳහා මෙම සේවාවන් හි සාර්ථකත්වයට එය ඉතා වැදගත් වේ. රජය විසින් ආදායම් විෂමතා ඇති නොවීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්ති දිගින් දිගටම ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කරන අතරම, රාජ්‍ය මූල්‍ය පීඩනය වැඩි නොවන ලෙස, ප්‍රජාව තුළ සාර්ව සහභාගීත්වය, සාධාරණත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා නව්‍යමය යාන්ත්‍රණ හඳුන්වා දිය යුතුය. ශ්‍රම බලකායෙන් සැලකිය යුතු කොටසක් අවිධිමත් අංශයේ රැකියාවල නියැලී සිටින හෙයින්, ඔවුන් රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් නොවේ. ශ්‍රම බලකායේ මෙම කොටස මුහුණ දෙන අවදානම සහ ජනගහනය වේගයෙන් වයස්ගත වීම ද සැලකිල්ලට ගනිමින්, ආරක්ෂිත යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක විය හැකි ජාතික මට්ටමේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම අත්‍යවශ්‍ය වේ. අවිධිමත් අංශයේ සේවකයින් සඳහා එවැනි විශ්‍රාම සැලසුමක් නොමැතිකම, අනාගතයේ දී ඔවුන් සමාජ ආරක්ෂණ ජාල යාන්ත්‍රණය මත යැපීම කෙරෙහි බලපෑ හැකිය. තවද, රජය විසින් මෙහෙයවනු ලබන සුබසාධන වැඩසටහන් සඳහා මහජන සහභාගීත්වයට අවකාශය සැලසීම, එම වැඩසටහන්වල ආවරණය වැඩි දියුණු කිරීමට සහ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උපකාරී වේ.

**කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ආර්ථික වර්ධනය වේගවත් කරන අතරතුර ආහාර සුරක්ෂිතතා ගැටලු විසඳීම සහ විදේශීය අංශයේ පීඩනයන් ලිහිල් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආහාර ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවීම අතිශය වැදගත් වේ.** මස් හා බිත්තර වැනි ඇතැම් ආහාර කාණ්ඩ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව, සාමාන්‍යයෙන් ස්වයංපෝෂිත වුව ද, ධාන්‍ය වර්ග, මාෂ බෝග, කිරි සහ කිරි නිෂ්පාදන, සීනි, පිෂ්ඨමය බෝග සහ ඇතැම් පලතුරු හා එළවළු වැනි ප්‍රධාන ආහාර කාණ්ඩ සඳහා ආනයන මත රඳා පවතියි. තවද, නියං කාලවල දී, රටේ ප්‍රධාන ආහාරය වන සහල් ආනයනය කිරීමට ශ්‍රී ලංකාවට සිදු වේ. ඒ අනුව, මෙරට සමස්ත ආනයනවලින් සියයට 8කට පමණ ආහාර හා පාන වර්ග දායකත්වය දක්වයි. වසංගතය තුළ දී වඩාත් අයහපත් අතට හැරුණු විදේශීය අංශයේ අසමතුලිතතා මධ්‍යයේ, රටේ වෙළඳ හිඟය අඩු කිරීම සඳහා දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීම අත්‍යවශ්‍ය වී තිබේ. තවද, මෑත වසරවල දී කෘෂිකාර්මික අංශයේ වර්ධනය මන්දගාමී වීම, සමස්ත ආර්ථික වර්ධනයේ පසුබෑමක් ඇති කර තිබෙන අතර, එය කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටින ගෘහ ඒකකවල ආදායම අඩු වීමට හේතු වී ඇත. මේ අතර, වසංගතය සමඟ දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් සැපයුම් හා නිෂ්පාදන අංශවල මතු වූ බාධා, ආහාර සුලභතාවය සහ ආහාර තෝරා ගැනීම කෙරෙහි බලපෑම් ඇති කළ අතර, වෙළෙඳපොළේ ආහාර මිල ගණන් ඉහළ යෑමට ද එය හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ගෘහ ඒකක මට්ටමින්, විශේෂයෙන් ආර්ථිකයේ දුප්පත්ම හා වඩාත්ම අවදානමට ලක්විය හැකි කොටස්වල, ආහාර සුරක්ෂිතතාවයට තර්ජනයක් එල්ල වී ඇත. එබැවින්, රටේ ආහාර ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවීම කෙරෙහි නවමු උනන්දුවක් ඇති වී තිබෙන අතර, විශේෂයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි ආහාර නිෂ්පාදන සම්බන්ධයෙන් වැඩි අවදනයක් පවතී. ආහාර ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවීමේ ප්‍රයත්නයත් සමඟ, ඇතැම් කෘෂිකාර්මික නිෂ්පාදන කාණ්ඩ ආනයනය කිරීම අධෛර්යමත් කිරීම තුළින් දේශීය කෘෂිකාර්මික නිෂ්පාදකයින් ආරක්ෂා කරන අතරම, වී නිෂ්පාදනය සඳහා පොහොර නොමිලේ ලබා දීමට සහ තවත් ප්‍රධාන බෝග කිහිපයකට පොහොර සහනාධාර ලබා දීමට රජය කැපවී සිටියි. මේවා දේශීය නිෂ්පාදනය දිරිගැන්වීම සහ ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා ගන්නා ලද අගය කළ යුතු පියවර වේ. කෙසේ වෙතත්, සහනාධාර මත ගොවීන් අධික ලෙස යැපීම, ඉදිරියේ දී රජයේ අයවැයට විශාල පීඩනයක් ඇති කළ හැකි බැවින් කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමෙන් ආහාර ස්වයංපෝෂිතභාවය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය විය හැකිය. තවද, දැඩි ලෙස සහනාධාර මත යැපෙන සහ තරගකාරීත්වයෙන් ආරක්ෂිත කෘෂිකාර්මික අංශය, මැදි හා දිගු කාලීනව ආර්ථිකයේ සම්පත් බෙදී යෑම අකාර්යක්ෂම වීමට තුඩු දෙනු ඇති අතර, අඩු වියදම් සහ පුළුල් පරාසයක ආහාර නිෂ්පාදන ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවයට තර්ජනයක් වීමට ද ඉඩ ඇත. එබැවින්, කෘෂිකාර්මික කටයුතුවල නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා තාක්ෂණය භාවිතය වැඩි කිරීමට සහ ඵලදායිතාව ඉහළ නැංවීමට ගොවි ප්‍රජාවට ආයතනික සහාය ලබා දිය යුතුය. මීට අමතරව, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය දිරිමත් කිරීම සහ එමගින් ආහාර ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවීම පිණිස කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වෙළඳපොළ සංවර්ධනය කිරීම, පසු අස්වනු හානි අවම කිරීම, ගබඩා හා කල්තබා ගැනීමේ පහසුකම් වැඩි දියුණු කිරීම සහ විශේෂයෙන් ආහාර නිෂ්පාදනයේ යෙදෙන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම හරහා අගය දාමයේ ඉදිරි සම්බන්ධතා ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. එවැනි ප්‍රතිපත්ති මගින් ගොවීන්ට වඩා හොඳ මිලක් සාක්ෂාත් කර ගැනීම සහතික කෙරෙනු ඇති අතර, එමගින්, ඔවුන්ගේ ගෘහ ඒකකවල ආදායම සහ ප්‍රතිආයෝජන හැකියාව ඉහළ නැංවෙනු ඇත. මීට අමතරව, ඉඩම් ඵලදායී ලෙස භාවිත කිරීමට සහ ඉඩම් කැබලි කිරීමේ ගැටලුව විසඳීමට ඉඩම් වෙළඳපොළ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන අතර, එමගින් කෘෂිකාර්මික කටයුතුවල දී තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ භාවිතය ද ප්‍රවර්ධනය කෙරෙනු ඇත. මෙවැනි ප්‍රතිසංස්කරණ, කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතුවල ආයෝජනය කිරීම සඳහා විධිමත් මූල්‍ය අංශය හරහා ණය ලබා ගැනීමට ද ගොවීන්ට සහාය වනු ඇත.

**ඉහළ ආදායම් ලබන ආර්ථිකයක් බවට රට පත් කිරීම සඳහා දායක විය හැකි පරිදි, කම්පනවලට ඔරොත්තු දෙන සහ අවශ්‍ය පරිදි වෙනස්වන ගතික ශ්‍රම බලකායක්, නිර්මාණය කිරීම සඳහා කඩිනම් ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවලට යොමු වීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ඇති අස්ථාවරතා සහ එය මුහුණ දෙන අවදානම් තත්ත්වයන් කොවිඩ්-19 වසංගතය මගින් ඉස්මතු කර දක්වීය.** ශ්‍රම බලකා සමීක්ෂණ හා මිනුම්වල තිබිය හැකි අඩුපාඩු ඉස්මතු කරමින්, කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතය සහ ශ්‍රම වෙළඳපොළ දර්ශක අතර සැලකිය යුතු නොගැලපීමක් වසර තුළ දී දක්නට

1

**විශේෂ සටහන 1**

## කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව

### ආහාර සුරක්ෂිතතාව

කොවිඩ්-19 වසංගත කාලපරිච්ඡේදය තුළ තීව්‍ර වූ ආර්ථික හා සමාජීය ගැටලු රැස අතරින්, ආහාර සුරක්ෂිතතාවට අදාළ ගැටලු පිළිබඳව දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් ද ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, විද්වතුන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ඉහළ අවධානයක් යොමු වී ඇත. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව, ආහාර සුරක්ෂිතතාව යනු ක්‍රියාශීලී හා නීරෝගී ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ආහාර අවශ්‍යතා සහ ආහාර රුචිකත්ව සපුරාලිය හැකි පරිදි, ප්‍රමාණවත්, සුරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර සඳහා සියලුම පුද්ගලයන්ට සෑම කල්හිම භෞතික, සමාජීය හා ආර්ථික වශයෙන් ප්‍රවේශ වීමේ හැකියාවක් පැවතීමයි. මෙම නිර්වචනය මගින් ආහාර සුරක්ෂිතතාවට අදාළ ප්‍රධාන පැතිකඩ හතරක් වන ආහාරවල සුලබතාවය, ආහාර සඳහා වූ ප්‍රවේශය, ආහාර උපයෝජනය සහ එහි ස්ථායීතාවය ආවරණය කෙරෙයි. එබැවින්, ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සංකල්පය ආහාර නිෂ්පාදනය සහ ප්‍රමාණවත් ආහාර සැපයුමක් සහතික කිරීම යන මූලික තත්ත්වය අභිබවා ගිය පුළුල් සංකල්පයක් වේ. ආහාර සුරක්ෂිතතාවයේ ප්‍රධාන පැතිකඩවලට අදාළ සාධක වන ආහාර නිෂ්පාදනය, බෙදා හැරීම සහ ගබඩා කිරීම, සියලු ප්‍රදේශවලට ප්‍රමාණවත් පරිදි අවශ්‍ය ආහාර ද්‍රව්‍ය පැවතීම, ප්‍රමාණවත් පෝෂණය, ආර්ථික හා සමාජීය වශයෙන් ආහාර සඳහා ඇති ප්‍රවේශය, ආහාර රුචිකත්ව සහ පුද්ගලයන්ගේ ආහාර පරිභෝජනය වැඩි දියුණු කෙරෙන පිරිසිදු ජලය, සනීපාරක්ෂාව සහ අනෙකුත් සෞඛ්‍ය සේවා පහසුකම් යනාදී ආහාරමය නොවන අංග මෙන්ම, වසංගත, යුද්ධමය හෝ සෘතු විපර්යාස, චක්‍රීය හෝ අනපේක්ෂිත සිදුවීම් වැනි කම්පන අවස්ථාවල දී පවා අඛණ්ඩව ප්‍රමාණවත් පරිදි ආහාර සුලබතාවක් පවත්වා ගැනීම වැනි කරුණු ආහාර සුරක්ෂිතතාවට ඇතුළත් වේ. ආහාර අනාරක්ෂිතභාවයේ කෙටි කාලීන ප්‍රතිඵලය කුසගින්න වන නමුත්, දීර්ඝ කාලීනව පවතින ආහාර අනාරක්ෂිතභාවය තුළින් අඩු බර, වයසට සරිලන උස නොතිබීම, කෘෂ බව සහ ක්ෂුද්‍ර පෝෂක ඌණතාව වැනි මන්දපෝෂණය ආශ්‍රිත ගැටලු ඇති කෙරෙන අතර, ආහාර අනාරක්ෂිතභාවයේ උග්‍ර අවස්ථාවන්හි දී මරණය පවා ඇති විය හැකිය. ආහාර අනාරක්ෂිතභාවය හේතුවෙන් ඇති වන අහිතකර ආහාර පුරුදු, උදාහරණයක් ලෙස කාබෝහයිඩ්‍රේට් අධික ආහාර පරිභෝජනය කිරීම, නිසා ස්ථුලතාවය මෙන්ම දියවැඩියාව හා අධි රුධිර පීඩනය වැනි බෝ නොවන රෝග ඇති විය හැකිය. සාමාන්‍යයෙන්, දිගු කල් පවතින ආහාර අනාරක්ෂිතභාවය තුළින් ළමුන් වැඩි වශයෙන් බලපෑමට ලක් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපනය තුළින් ඔවුන් අත් කර ගන්නා ප්‍රතිඵල අඩු වීමටත්, එය වැඩිහිටි වියේ දී ඔවුන්ගේ ආර්ථික අවස්ථා සීමා වීමටත් බල පෑ හැකිය. එමනිසා, තිරසාර සංවර්ධන ඉලක්කවලට සමගාමීව ශ්‍රී ලංකාවේ සාගින්න හා දරිද්‍රතාවය අවම කිරීම සඳහා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම ඉතා වැදගත් වන අතර, එය මහජනතාවගේ පොදු යහ පැවැත්ම සහ ශ්‍රම බලකායේ ඵලදායීතාව වැඩි දියුණු කිරීමට සහ දිගු කාලීනව පවතින සෞඛ්‍ය හා පෝෂණ ගැටලු අවම කිරීමට ඉවහල් වනු ඇත. පසුගිය දශක කිහිපය තුළ මහජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇතත්, කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය සමඟ ජාතික මට්ටමින් මෙන්ම ගෘහස්ථ මට්ටමින් ද ආහාර අනාරක්ෂිතතාව ඉහළ ගොස් ඇත.

### කොවිඩ්-19 වසංගතය මගින් ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇති කරන බලපෑම

ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව, ලෝක ජනගහනයෙන් සියයට 8.9ක්, එනම් මිලියන 690ක් පමණ ජනතාවක්, වසංගතයට පෙර මන්දපෝෂණයෙන් පෙළුණු බවට ඇස්තමේන්තු කර ඇත. ලොව මන්දපෝෂණයෙන් පෙළෙන මුළු ජනගහනයට කොවිඩ්-19 වසංගතය හේතුවෙන් තවත් මිලියන 83ත් 132ත් අතර ජනතාවක් එකතු විය හැකි බව ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් සිදු කරන ලද මූලික ඇස්තමේන්තුවලට අනුව පෙන්නුම් කෙරෙයි. වසංගතයට පෙර පැවති දත්ත මත පදනම්ව, ආහාර සුලබතාව, ආහාර මිලදී ගැනීමේ හැකියාව හා ආහාරවල ගුණාත්මකභාවය මෙන්ම සුරක්ෂිතතාව යන සාධක සලකා බලන, ගෝලීය ආහාර සුරක්ෂිතතා දර්ශකය 2019ට අනුව, රටවල් 113ක් අතුරින් ශ්‍රී ලංකාවට 66 වැනි ස්ථානය හිමි විය. මේ අතර, ළමා මන්දපෝෂණය ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීනව පවතින ගැටලුවක් වී තිබේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ සිදු කරන ලද ජන විකාශන හා සෞඛ්‍ය සමීක්ෂණයට අනුව, වයස අවුරුදු 5 හෝ ඊට අඩු ළමුන් අතර වයසට සරිලන උස නොමැති වීම, කෘෂ බවෙන් පෙළීම සහ අඩු බර, පිළිවෙළින්, සියයට 17.3ක්, සියයට 15.1ක් සහ සියයට 20.5ක් විය. වසංගත කාලපරිච්ඡේදය තුළ දී ආහාර නිෂ්පාදනය අඛණ්ඩව සිදු කිරීම හා බෙදා හැරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබුව ද, ගෝලීය හා දේශීය වශයෙන් ක්‍රියාත්මක වූ ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීම් සහ සංචරණ සීමා පැනවීම් වැනි පෙර නොවූ විරූ වසංගත නිවාරණ පියවර සමඟ රටේ ආර්ථික කටයුතු කෙරෙහි අවහිරතා ඇති වූ අතර, ඒ හේතුවෙන් සැපයුම් දාම සහ ජනතාවගේ ජීවනෝපායන් කෙරෙහි මෙන්ම, එමගින් ආහාර සුරක්ෂිතතාවට ද බලපෑම් එල්ල විය. කොවිඩ්-19 වසංගතය තුළින් ලද අත්දැකීම් මගින්, මෙවැනි පෙර නොවූ විරූ ආර්ථික කම්පනවල දී මහජනතාවගේ

ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ වැදගත්කම මෙන්ම, එවැනි ගැටලු නිසි ලෙස විසඳා නොගතහොත් රට තුළ දැනට පවතින ආහාර අනාරක්ෂිතතා ප්‍රශ්න තවදුරටත් උග්‍ර වීමට ඇති හැකියාව අවධාරණය කරයි.

**කොවිඩ්-19 වසංගතය හමුවේ ආහාර අනාරක්ෂිතභාවයේ අවදානමට ලක් වන කණ්ඩායම්**


කොවිඩ්-19 වසංගත තත්ත්වයට පෙර සිටම ආහාර අනාරක්ෂිතභාවය හේතුවෙන් අවදානමට මුහුණ දී සිටි ජන කණ්ඩායම් අතර ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් වසංගත කාලපරිච්ඡේදය තුළ දී මතු වූ ගැටලු විෂමාකාරව උග්‍ර විය. ඒ අනුව, සීමිත හෝ අක්‍රමවත් ආදායම් ලබන පුද්ගලයන්, හදිසි අවස්ථාවක දී භාවිතයට ගැනීම සඳහා සීමිත ආහාර සංචිත සහ ඉතුරුම් සහිත පුද්ගලයන්, මන්දපෝෂණ ගැටලු සහ නිදන්ගත රෝග වැනි දුර්වල සෞඛ්‍ය තත්ත්වයක් ඇති පුද්ගලයන්, විවිධ භාණ්ඩ වර්ග හා වෙළඳපොළ වෙත සීමිත ප්‍රවේශයක් සහිත දුර බැහැර ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයින්, ආහාර අවශ්‍යතා සඳහා වෙළඳපොළ මත මුළුමනින්ම යැපෙන නාගරික ජනගහනයේ ඇතැම් කාණ්ඩ, සීමිත සමාජ ජාල සම්බන්ධතා ඇති පුද්ගලයින්, ප්‍රවාහන පහසුකම් සීමිතව ඇති හෝ නොමැති පුද්ගලයින් සහ වැඩිහිටි, නිවාස අහිමි හෝ අවතැන් වූ වැනි කණ්ඩායම් සහ දරුවන් යන කාණ්ඩ වසංගත කාලපරිච්ඡේදය තුළ දී වඩාත් අවදානමට ලක් වූ කණ්ඩායම් විය. මේ අතර, වසංගතය හේතුවෙන් රැකියාවෙන් ඉවත් කිරීම් හා වැඩ කරන පැය ගණන සීමා කිරීම් හේතුවෙන් සංචාරක, ආහාරපාන, සාත්තු සේවා සැපයීම් සහ ප්‍රවාහනය වැනි වැඩි වශයෙන් බලපෑමට ලක් වූ අංශ තුළ පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන සේවා නියුක්තිය ඇතුළු සමස්ත සේවා නියුක්තිය කෙරෙහි දැඩි බලපෑමක් ඇති වූ අතර, එමගින් මෙම අංශවල රැකියාවල නිරත වී සිටින පුද්ගලයන්ගේ ආර්ථික අවදානම ඉහළ ගොස් ඇත.

**කොවිඩ්-19 වසංගතය මගින් ආහාර පද්ධති වෙත සිදු කෙරෙන බලපෑම**

කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම්, ඉල්ලුම් සහ සැපයුම් යන දෙ අංශයෙන්ම ආහාර පද්ධති වෙත සම්ප්‍රේෂණය වේ. ශ්‍රී ලංකාවේ බෝග වගා කටයුතු අවහිර කර නොතිබුණ ද, ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීමේ කාලපරිච්ඡේදය තුළ දී පනවා තිබූ සංචරණ සීමා හේතුවෙන් ශ්‍රමය වැඩි වශයෙන් යොදා ගන්නා බෝග වගා කටයුතු සහ ආහාර සැපයුම්දාමයේ අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කෙරෙන ශ්‍රම පිරිස්වල හිඟයක් ඇති විය. ඒ අනුව, විශේෂයෙන් ම, 2020 මාර්තු සිට අප්‍රේල් අග දක්වා කාලය තුළ දී දිවයින පුරා පනවා තිබූ සංචරණ සීමා හේතුවෙන් පැන නැගුණු ශ්‍රම හිඟය හේතුවෙන් පිරිසැකසුම් කිරීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම ඇතුළු ආහාර නිෂ්පාදනයේ අතරමැදි ක්‍රියාවලි සඳහා බලපෑම් ඇති විය. මේ අතර, ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ කාල සීමාව තුළ දී, ආහාර බෙදා හැරීමේ මාර්ග වෙත ඇති වූ බාධා සහ වෙළඳපොළ වසා දැමීම හේතුවෙන් කල් තබා ගත නොහැකි නිෂ්පාදනවල පසු අස්වනු හානි සැලකිය යුතු ලෙස වැඩි විය. එවැනි සැපයුම් පාර්ශ්වීය අවහිරතා හේතුවෙන් ඉහළ ගිය ආහාර මිල ගණන් මගින්, අඩු මට්ටමේ ක්‍රය ශක්තියක් ඇති, අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට අහිතකර බලපෑම් ඇති කළ අතර, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා විවිධ ක්‍රියාමාර්ග හරහා මැදිහත් වීමට රජයට සිදු විය. කෙසේ වෙතත්, වි.ස. 1.1 රූප සටහනෙහි දක්වා ඇති පරිදි, 2020 වසර පුරා ශ්‍රී ලංකාවේ ආහාර මිල උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් අඩු ආදායම්ලාභී පවුල්වලට ආහාර සඳහා වැය වන වියදම දැරීමට අපහසු තත්ත්වයක් ඇති කරමින් ඔවුන්ගේ ආහාර සුරක්ෂිතතාවට තර්ජනයක් එල්ල විය. තවද, වසංගතය හේතුවෙන් ජාත්‍යන්තර ආහාර වෙළඳාමට ඇති වූ බාධා බොහෝ රටවල ආහාර සුරක්ෂිතතාවට ගැටලුවක් විය. වසංගත තත්ත්වය උද්ගත වීමත් සමඟ ස්ථාවර දේශීය සැපයුමක් සහතික කිරීම සඳහා රටවල් කිහිපයක් ස්වකීය ආහාර ද්‍රව්‍ය අපනයනය සීමා කිරීම කළේය. වසංගත කාල සීමාව තුළ දී පනවන ලද එවැනි වෙළඳ සීමාවන් මගින් ශුද්ධ වශයෙන් ආහාර ආනයනය කරන රටවල ආහාර සුරක්ෂිතතාවට, එම රටේ ආහාර පරිභෝජන රටාව තුළ ආනයනය කරන ලද ආහාර ද්‍රව්‍යවල ඇති වැදගත්කමට අනුරූපීව, අභියෝග ඇති විය.

ඉල්ලුම් පාර්ශ්වයෙන් ගත් කළ, වසංගතය සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ ආර්ථික පසුබෑම හේතුවෙන් පුද්ගලයන්ගේ ජීවනෝපායන් අහිමි වීමෙන්, විශේෂයෙන් ම, දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයන්ට, පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා ගැනීම සඳහා ඇති ප්‍රවේශය සීමා වුවා විය හැකිය. වසංගතය ඉස්මතු වීමත් සමඟ, ලහිලහියේ ආහාර මිලදී ගැනීම් සහ ගබඩා කිරීම් හේතුවෙන්

**රූප සටහන වි.ස. 1.1**
**වසංගත කාලය තුළ දී ගෝලීය හා දේශීය ආහාර උද්ධමනය**




මූලයන්: එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා ඇති වූ ඉල්ලුම සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එමගින් අවදානමට ලක්විය හැකි ජන කණ්ඩායම්වලට අත්‍යවශ්‍ය ආහාර ලබා ගැනීමේ හැකියාව සීමා විය. තවද, වසංගත කාලපරිච්ඡේදය තුළ දී ආහාර සඳහා ඇති ඉල්ලුම කෙරෙහි රෝග ව්‍යාප්ති මාර්ග පිළිබඳව ජනතාවගේ මතය ද විශාල අයුරින් බලපෑ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රධාන ප්‍රෝටීන් මූලාශ්‍ර ආහාර වන මස් සහ මාළු සඳහා පැවති ඉල්ලුම 2020 වසර තුළ, විශේෂයෙන්ම, වසංගතයේ දෙවන රැල්ල අවධියේ දී පහළ ගියේය.

### කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති

ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව, ශ්‍රී ලංකා රජය විසින් වසංගතය ආශ්‍රිතව පැන නැගුණු සැපයුම් සහ ඉල්ලුම් සම්බන්ධ හදිසි ගැටලු විසඳීම සඳහා පියවර රැසක් ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, වසා දමා ඇති හෝ හුදෙකලා ප්‍රදේශවල වෙසෙන ජනතාව, අවදානමට ලක්විය හැකි ජන කණ්ඩායම් සහ ආර්ථිකයේ වඩාත්ම බලපෑමට ලක් වූ අංශවල සේවය කරන පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා ඔවුන් වෙත මුදල් සහ නොමිලේ භාණ්ඩ ප්‍රදානය කිරීම හරහා සමාජ ආරක්ෂණ වැඩසටහන් පුළුල් කිරීමට රජය කටයුතු කළේය. මීට අමතරව, ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තැබූ කාලපරිච්ඡේදය තුළ, නිවෙස් වෙත ආහාර ගෙන ගොස් ලබා දීමේ ක්‍රියාවලිය හරහා ළමුන්, ගර්භනී සහ කිරි දෙන මව්වරුන් ඉලක්ක කර ගනිමින් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන පෝෂණ ආධාරක වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. මේ අතර, 2020 ජූලි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළ ප්‍රාථමික පාසල් දරුවන්ගේ නිවෙස්වලට ආහාර සලාක ලබා දීම හරහා පාසල් වසා දැමීම හේතුවෙන් පාසල් ආහාර වැඩසටහනට ඇති වූ බාධා අවම කිරීමට ලෝක ආහාර වැඩසටහන ද උත්සාහ දරා ඇත. කෙසේ වෙතත්, දීර්ඝ කාලයක් මුළුල්ලේ පාසල් වසා තැබීම, පාසල් ආහාර වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අභියෝගයක්ව පැවතුණි. සැපයුම් පාර්ශ්වයෙන් ගත් කළ, සහනදායී ණය ලබා දීම, ණය ආපසු පියවීම සඳහා සහන කාලයක් ලබා දීම සහ ව්‍යාපාර අඛණ්ඩව කරගෙන යාම සඳහා ණය ලබා දීම් වැනි ඉලක්කගත පියවර මගින් ව්‍යාපාරවලට වසංගතයේ බලපෑමට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා සහාය වෙමින්, ආහාර සැපයුම් දාමයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස පහසුකම් සැපයීම අත්‍යාවශ්‍ය විය. මෙම ඉලක්කය අනුව යමින්, වෙළඳපොළ පොලී අනුපාතික ඉතිහාසයේ අඩුම මට්ටමක් දක්වා පහළ දමමින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස ලිහිල් කළේය. තවද, වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහාය සැපයීම සඳහා රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති රාමුවල සාමූහික ප්‍රයත්නයක් ලෙස පොලී සහනාධාර යෝජනා ක්‍රම, ප්‍රතිමූල්‍ය පහසුකම් මෙන්ම, ණය ඇපකර යෝජනා ක්‍රම ඇතුළු සහනදායී මූල්‍ය පහසුකම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, අතරමැදියන්ට වෙළඳපොළ තුළ වැඩි බලයක් ඇති විට, වසංගත තත්ත්වයක් තුළ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා නිෂ්පාදකයින්ගේ සහ පාරිභෝගිකයින්ගේ ද්‍රවශීලතා ගැටලුවලට සහන ලබා දීම පමණක් ප්‍රමාණවත් නොවේ. එවැනි පසුබිමක් හමුවේ, ආහාර සැපයුම් පද්ධතිය තුළ මනා ක්‍රියාකාරීත්වයක් සහතික කිරීම සහ ආහාර මිල උද්ධමනය වළක්වා ගැනීම සඳහා රජය විසින් ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සහ මහජනයා අතර ඒවා බෙදා හැරීම මෙන්ම, වෙළඳපොළ නිසි ලෙස අධීක්ෂණය සහ නියාමනය කිරීම අවශ්‍ය වේ. තවද, කුඩා ගෙවතු වගාව සහ නාගරික ගොවිතැන යන සංකල්ප නැවත හඳුන්වා දුන් සහ ප්‍රවර්ධනය කළ, දේශීය කෘෂිකර්මාන්තය දිරිගැන්වීමේ රජයේ ප්‍රතිපත්තිමය න්‍යාය පත්‍රය මගින් වසංගත තත්ත්වය තුළ ජනතාවගේ මූලික ආහාර අවශ්‍යතා යම් ප්‍රමාණයකට සපුරාලීමට සහාය සැලසිණි. ආහාර නිෂ්පාදනයට සහාය සැපයීම සඳහා රජය විසින් පොහොර සහනාධාර වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නැංවූ අතර, වී වගාව සඳහා පොහොර නොමිලේ ලබා දීම සිදු කළේය. මීට අමතරව, වසංගත කාලපරිච්ඡේදය තුළ දී, ආහාර පද්ධති හරහා රෝග පැතිරීම වැළැක්වීම සහ ආහාර සැපයුම් දාම අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහතික කිරීම සඳහා ආහාර සැපයුම් දාමයට සහභාගීවන්නන් විසින් සෞඛ්‍ය හා ආරක්ෂණ රෙගුලාසි දැඩි ලෙස පිළිපදින බව තහවුරු කිරීමට රජයේ සෞඛ්‍ය බලධාරීහු පියවර කිහිපයක් ගත්හ.

### ඉදිරි දැක්ම

කොවිඩ්-19 වසංගතය පෙර නොවූ විරූ තත්ත්වයක් වුව ද, එවැනි අනපේක්ෂිත කම්පනවලට මුහුණ දීම සහ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා රටේ ආහාර පද්ධතියෙහි සහ ගෘහ ඒකකවල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ වැදගත්කම එමගින් අවධාරණය වී ඇත. එබැවින්, අනාගතයේ ඇති විය හැකි කම්පනවලට මුහුණ දෙමින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ආහාර සුරක්ෂිතතාව හා සම්බන්ධ ගැටලු කෙටි කාලීන මෙන්ම දිගු කාලීන උපායමාර්ග ද සහිතව සියලු පැතිකඩ ආවරණය කෙරෙන ප්‍රතිපත්තිමය ප්‍රවේශයකින් විසඳිය යුතු වේ. කෘෂිකාර්මික අංශයේ ඵලදායිතා මට්ටම් වැඩිදියුණු කරන අතර, නිසි කලට කෘෂි කටයුතු සඳහා යෙදවුම් සහ ජලය සැපයීම මෙන්ම, විශේෂයෙන් ම, අතිශය දුෂ්කර අවස්ථාවක දී වුව ද ආහාර සඳහා ප්‍රවේශය ලබාදීම පිණිස ඩිජිටල් මාර්ගගත ක්‍රම සහ නිවාස වෙත ආහාර සේවා සපයන නව තාක්ෂණික ක්‍රමවේද යොදා ගනිමින් අලෙවිකරණය හා අගහිඟකම් ඇති පුද්ගලයන් ඉලක්ක කරගත් ආහාර බෙදා හැරීමේ ක්‍රම වැඩිදියුණු කිරීම

සඳහා ප්‍රතිපත්තිමය අවධානය යොමු විය යුතුය. තවද, වසංගත කාලපරිච්ඡේදයක් තුළ පුද්ගලික අංශය විසින් පාරිභෝගිකයින් සූරාකෑම් සහ අක්‍රමිකතා සිදු කිරීම් වැළැක්වීම සඳහා ජාතික මට්ටමේ අධිකාරී ආයතනවලට අමතරව, ප්‍රාදේශීය පාලන අධිකාරීන්ගේ ආයතනික සහාය ද ඇතිව, රාජ්‍ය අංශයේ බෙදා හැරීමේ මාර්ග මෙන්ම, ආහාර නිෂ්පාදන දත්ත ගොනු ශක්තිමත් කිරීම කළ යුතුව ඇත. එසේම, ආහාර ශේෂ පත්‍රයේ ප්‍රධාන ආහාර ද්‍රව්‍ය කිහිපයක් සඳහා ශ්‍රී ලංකාව තවමත් ආනයනය මත යැපෙන බැවින්, රටේ ආහාර සුරක්ෂිතතාවට ඇති අවදානම වළක්වා ගැනීම සඳහා කලාපීය වශයෙන් මෙන්ම රට තුළ ආහාර වෙළඳාමට පහසුකම් සැලසීම ඉතා වැදගත් වේ. රටේ දිගු කාලීන ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා මෙම ආහාර කාණ්ඩ දේශීයව නිෂ්පාදනය කිරීම දිරිමත් කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වන අතර, අදාළ හිතකර ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී කෙටි කාලීන අභියෝග ද කළමනාකරණය කර ගත යුතුය. තවද, පසු අස්වනු හානිය අවම කිරීම, ආහාර හිඟයයන් වැළැක්වීම සහ ආහාර මිල උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගැනීම සඳහා ශීතාගාර ද ඇතුළුව ගබඩාකරණ පහසුකම් සහ ප්‍රවාහන සේවා වැඩි දියුණු කිරීම මැදි කාලීනව හා දිගු කාලීනව වැදගත් වේ. මේ අතර, වන අලියන්, වඳුරන්, මොණරුන් සහ වල් ඌරන් වැනි වන සතුන් හේතුවෙන් සැලකිය යුතු තරමේ බෝග හානියක් සිදුවන අතර, ඉන් දේශීය ආහාර සුරක්ෂිතතාවට තර්ජනයක් ඇති කරයි. එම නිසා, සාධාරණ හා තිරසාර පදනමකින් මානව හා වන සතුන් අතර ගැටුම් විසඳීම සඳහා සියලු පැතිකඩ ආවරණය වන ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍යව ඇත. මේ අතර, ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි පුද්ගල කණ්ඩායම්වලට ආදායම් උත්පාදනය කිරීමේ අවස්ථා ඇති කිරීම තුළින් අනාගතයේ දී ඇති විය හැකි අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දීම සඳහා ඔවුන් තුළ හැකියාවක් වර්ධනය කිරීමට හැකි වේ. මීට අමතරව, පුද්ගලයන්ගේ සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු සහ සෞඛ්‍ය සම්පන්න ආහාර තේරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා, විශේෂයෙන් ම, පෝෂණය හා ආහාර සුරක්ෂිතතාව පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවිය යුතුය. රජයේ යෝජිත ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී මෙම කරුණු පිළිබඳව ද සැලකිල්ලට ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

---

මූලාශ්‍ර:

1. Asian Development Bank (June 2020). Food security in Asia and the Pacific amid the COVID-19 pandemic.
2. Food and Agriculture Organisation (2020). COVID-19: Channels of transmission to food and agriculture.
3. Food and Agriculture Organisation (2020). Food security under the COVID-19 pandemic.
4. Food and Agriculture Organisation (2020). The state of food security and nutrition in the world.
5. The Economist Intelligence Unit (2019). Global Food Security Index Report.
6. United Nations (June 2020). Policy Brief: The impact of COVID-19 on food security and nutrition.

ලැබුණු අතර, මෙම තත්ත්වය වසංගත කාලය තුළ ලොව පුරා නිරීක්ෂණය වූ, ශ්‍රී ලංකාවට පමණක් ආවේණික නොවන සංසිද්ධියක් විය. කාර්තුමය දත්ත සීමිත වීමට අමතරව, එයට වඩා වැඩි වාර ගණනකින් ප්‍රකාශයට පත් කෙරෙන සුදුසු දර්ශක ශ්‍රී ලංකාවේ නොමැති වීම හේතුවෙන් මෙවැනි අස්ථාවර කාලපරිච්ඡේදයන් තුළ ශ්‍රම බලකායේ ප්‍රවණතා පිළිබඳ තත්කාලීන විශ්ලේෂණ සිදු කිරීම දුෂ්කර වේ. ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් තිබුණ ද, පුද්ගල දුරස්ථභාවය පිළිබඳ සංකල්ප සහ පිළිපැදිය යුතු දැඩි සෞඛ්‍ය රෙගුලාසි මගින් ආර්ථිකයට කල් පවත්නා යම් බලපෑම් ඇති කරයි. එවැනි තත්ත්වයන් තුළ, වඩාත් අවදානමට ලක්විය හැකි පුද්ගලයින් වන්නේ අඩු ආදායම්ලාභී පවුල්වල අඩු වැටුප් සහිත ශ්‍රමිකයන්, එනම් පුළුල් වශයෙන් ගත් කළ අවිධිමත් අංශයේ සේවකයින් සහ විධිමත් අංශයේ පහළ මට්ටමේ වෘත්තීය කාණ්ඩයන් ය. 2019 වසර සඳහා වූ වාර්ෂික ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, රැකියාවල නියුතු වූවන්ගෙන් සියයට 57කට වැඩි ප්‍රමාණයක් අවිධිමත් අංශයේ සේවාවන්හි නියුක්ත වී ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, ඉන් සියයට 61ක් පමණ කෘෂිකාර්මික නොවන අංශවල නියැලී සිටිති. වෘත්තීය කාණ්ඩ පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විශ්ලේෂණයන් මගින් අලෙවිකරුවන්, කෘෂිකාර්මික අංශයේ නුපුහුණු ශ්‍රමිකයින්, ශිල්පීන්, යන්ත්‍රසූත්‍ර ක්‍රියාකරුවන් සහ ප්‍රාථමික වෘත්තීන්වල නියැලෙන්නන් වැනි වඩාත් අවදානමට ලක්විය හැකි සේවා අංශයේ වෘත්තීන්ගෙන් අවිධිමත් අංශයේ රැකියාවලින් සියයට 88ක් සහ මුළු සේවා නියුක්තියෙන් සියයට 50ක් සමන්විත වන බව පෙන්නුම් කෙරෙයි. මෙම අංශවල සේවකයින්ගේ නුපුහුණු ස්වභාවය නිසා ඔවුන් කොවිඩ්-19 වැනි අවහිරතා පවතින කාලවල දී පමණක් නොව, අනාගතයේ දී ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීයකරණය හේතුවෙන් ද අවදානමට ලක් විය හැකිය. මේ සම්බන්ධයෙන්, අඩු අධ්‍යාපන මට්ටමක් සහිත සහ අඩු ආදායම්ලාභී පවුල්වල පුද්ගලයන්ට ස්ථිර රැකියා අවස්ථා ලබා දීම සඳහා රජය ගෙන ඇති පියවර සමාජ දෘෂ්ටිකෝණයකින් සලකන විට පැසසුමට ලක්විය යුතු වන්නේ එම ගෘහ ඒකකවලට දරිද්‍රතාවයේ විෂම චක්‍රයෙන් මිදීමට ඉන් ඉඩ සැලසෙන බැවිනි. ආර්ථිකයේ ක්‍රමයෙන් ඇතිවන පරිවර්තනය සමඟම 'X පරම්පරාවේ' (එනම් 1960 හා 1970 දශකවල උපන්)

සහ 'Y පරම්පරාවේ' (එනම්, 1980 හා 1990 දශක තුළ දී උපන් නොහොත් සහශ්‍ර පරම්පරාවේ) ශ්‍රමිකයන් එකවර ශ්‍රම බලකාය තුළ සිටිය ද, රජයේ රැකියාවල සිට පෞද්ගලික අංශයේ රැකියා වෙත යොමු වීම ඔස්සේ රැකියා නියුක්ති රටාවන් වෙනස් වීමක් දක්නට නොලැබීම පුදුමයට කරුණකි. කාර්ය සාධනය මත පදනම් වූ වැටුප් ක්‍රමයක් නොමැතිකම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සමග කොන්දේසි විරහිතව රැකියාවල ස්ථිර ස්වභාවයක් පැවතීම හේතුකරගෙන රාජ්‍ය අංශයේ රැකියා 'යහපත්' ලෙස සැලකීමත්, පෞද්ගලික අංශයේ රැකියා 'අයහපත්' ලෙස සැලකීමත් නිසා මතුවන රැකියා අතර පරතරය මෙයට හේතු විය හැකිය. තවද, කාර්ය සාධනය මත පදනම් වූ කිසිදු නිර්ණායකයක් නොමැතිකම, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඉහළ යෑමත් සමඟ ඵලදායිතාව කෙරෙහි සෘණාත්මක ලෙස බලපෑ හැකි අතර, එමගින් ඌන සේවා නියුක්තිය සහ සැඟවුණු සේවා වියුක්තිය ද ඇති විය හැකිය. සියලු අධ්‍යාපන මට්ටම්වල සිටින ශ්‍රම බලකායේ සාමාජිකයන්ගේ කුසලතා ඉහළ නැංවීමටත්, ඔවුන් රටේ විවිධ අංශවල ඇති ප්‍රමුඛතා සමග පෙළගැස්වීමටත් සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතු වේ. විවිධ කර්මාන්ත අංශ සමඟ කෙරෙන සාකච්ඡාවලින් හෙළි වන පරිදි සියලුම ප්‍රධාන අංශයන්හි පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රමිකයන්ගේ පුළුල් හිඟයක් ඇත. මෙම තත්ත්වය, තරුණ විරැකියාව නිරන්තරයෙන් ඉහළ මට්ටමක පැවතීම සහ විරැකියාවෙන් පෙළෙන තරුණයන්ගෙන් විශාල කොටසක් අ.පො.ස. (උසස් පෙළ) සහ ඊට ඉහළින් අධ්‍යාපනය ලැබූවන් වීම සමඟ විශේෂ අවධානයකින් යුතුව සසඳා බැලිය යුතුය. ආර්ථිකයේ ශ්‍රම අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා අධ්‍යාපන අංශය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීමට මෙන්ම, කුසලතා ඉහළ නැංවීම හා නව කුසලතා ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, වහා සැපිරිය යුතු අවශ්‍යතාවන් වේ. රැකියාවේ කටයුතු පදනම් කරගත් අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියක් තුළින් අනාගතයටත් ගැළපෙන ආකාරයේ ඩිජිටල් කුසලතා වර්ධනය කිරීම ද මෙයට ඇතුළත් විය යුතුය. තවද, ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට ඔවුන් මුහුණ දෙන අවදානම් තත්ත්වයන් අවම කර ගනිමින් ගෞරවනීය රැකියාවක නියැළිය හැකි බව තහවුරු කරන අතරම, ආර්ථිකයේ ප්‍රගතියට ද ඵලදායී දායකත්වයක් ලබා දීමට හැකි වීම සඳහා, කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය අඩු වීම හා ආර්ථිකයේ අවිධිමත් රැකියා ඉහළ මට්ටමක පැවතීම වැනි දිගුකාලීනව පවතින ගැටලු විසඳීම සහ ක්‍රමයෙන් වැඩි වන 'ගිග්' කම්කරුවන් සංඛ්‍යාව සමඟ වෙනස්වන රැකියා ස්වභාවයන් සඳහා ගැළපෙන අන්දමින් කටයුතු කිරීමට සියලු පාර්ශ්වකරුවන්ගේ උපදෙස් ද ලබා ගනිමින් සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතුය. පෙර සඳහන් කළ පරිදි, ශ්‍රම වෙළඳපොළේ තවත් අවශ්‍ය තීරණාත්මක ප්‍රතිසංස්කරණයක් වන්නේ, සමාජ සුභසාධනය වෙනුවෙන් අනාගතයේ දැරීමට සිදුවන රාජ්‍ය මූල්‍ය පීඩනය අඩු කරමින් ශ්‍රම වෙළඳපොළේ නම්‍යශීලී බව ඉහළ නැංවීම සඳහා රට පුරා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමයි. සමස්තයක් ලෙස ගත් කළ, ශ්‍රම බලකායේ ගුණාත්මක පැතිකඩ පමණක් නොව, ශ්‍රම වෙළඳපොළේ නම්‍යශීලීභාවය සහ ආර්ථිකයේ ශක්‍යතාවය ඵලදායි ලෙස ඉහළ නැංවීමට බලපාන නීතිමය පැතිකඩ ද ඇතුළත් වූ බහු-අංශ ප්‍රවේශයකින් ශ්‍රම වෙළඳපොළේ ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුව ඇත.

**සමාජයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි සහ තිරසාරාත්මක වර්ධනයක් උදා කිරීම සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතිශය වැදගත් බවට පුළුල් පිළිගැනීමක් ඇති අතර, එමගින් මෙම අංශය නගා සිටුවීම සඳහා සුවිශේෂී ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සැලසුම් කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරෙයි.** රැකියා උත්පාදනය සහ ප්‍රාදේශීය වශයෙන් පවතින විෂමතා අවම කිරීමෙහි ලා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. දේශීය නිෂ්පාදන ආර්ථිකයක අවශ්‍යතාවය පිළිබඳව වන පිළිගැනීම ඉහළ යෑමත් සමඟ, තිරසාර නිෂ්පාදන ආර්ථිකයක කොඳු නාරටිය වන, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දෙන සහායේ අඩු ලුහුඬුකම් හඳුනා ගැනීමේ අවශ්‍යතාවක් පවතියි. මෙම අංශය මුහුණ දෙන ප්‍රධාන දුෂ්කරතා අතරින් එකක් වන්නේ මූල්‍ය පහසුකම් සඳහා ඇති ප්‍රවේශයයි. එක් අතකින්, ඇප සුරැකුම් නොමැති වීම, දුර්වල ව්‍යාපෘති කළමනාකරණය සහ මූල්‍ය සැලසුම්කරණය, අවදානම් පිළිබඳ අවබෝධය පහළ මට්ටමක පැවතීම, සමස්තයක් වශයෙන් එම ව්‍යාපාරවලට ඇති මූල්‍යන අවස්ථා සහ මූල්‍ය ආයතනවලින් සේවය ලබා ගත යුතු ආකාරය පිළිබඳ අනවබෝධය වැනි ගැටලු හේතුවෙන් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර පීඩාවට පත් වෙයි. අනෙක් අතට, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත අරමුදල් සැපයීම සඳහා රජයේ සහාය සහිත යෝජනා ක්‍රම කිහිපයක් පැවතුණ ද, මූල්‍ය අංශය මෙම ව්‍යාපාරවලට ණය දීම සම්බන්ධව පසුගාමීත්වයක් දක්වයි. ව්‍යාපෘති ඇගයීම සහ ශක්‍යතා තක්සේරුව සඳහා අත්‍යවශ්‍ය වන, සංවර්ධන කටයුතු මූල්‍යනය කිරීම පිළිබඳ ප්‍රවීණතාව සහ දැනුම සාමාන්‍යයෙන් දුර්වල මට්ටමක පැවතීමත්, සංවර්ධන මූල්‍යනය සම්ප්‍රදායික ණය දීමේ ක්‍රියාමාර්ගවලින් බෙහෙවින්

වෙනස් වීමත්, මෙම තත්ත්වයට යම් තරමකට බලපායි. ඒ අනුව, විධිමත් මූල්‍ය අංශය විසින් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ආවේණික වූ අවශ්‍යතා සහ ඒවා මුහුණ දෙන බාධක සැලකිල්ලට ගනිමින්, මෙම අංශය විශේෂයෙන්ම අරමුණු කරගත් නව්‍යමය බැංකු මූල්‍ය උපකරණ සහ සේවා හඳුන්වා දීමට ක්‍රියා කළ යුතු ය. විවිධ ණය ඇපකර යෝජනා ක්‍රම ශ්‍රී ලංකාව තුළ යම් සාර්ථකත්වයන් අත් කර ගෙන තිබුණ ද, චිලී සහ මැලේසියාව වැනි රටවල දක්නට ලැබෙන පරිදි, මනාව සැලසුම් කරන ලද සහ මනාව කළමනාකරණය කරන ලද ණය ඇපකරණ ආයතනයකට මෙම මූල්‍යන පරතරය අවම කිරීමට ප්‍රධාන කාර්යභාරයක් සිදු කළ හැකිය. එසේම, රජය මගින් යෝජනා කර ඇති පරිදි, ජාතික සංවර්ධන බැංකු සංස්ථාවක් ස්ථාපනය කිරීම කාලීන පියවරකි. ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා ගත හැකි ණය අරමුදල් ප්‍රමාණය වැඩි කිරීමට අමතරව, විධිමත් මූල්‍ය මාර්ග වෙත ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා බැංකුවලින් ණය ලබා ගැනීමට එම ආයතනවලට ඇති ශක්‍යතාව ඉහළ නැංවීම පිළිබඳ අවධානයක් යොමු කළ යුතු අතර, එමගින් එම ව්‍යාපාරවල ලාභදායීබව, ඵලදායීබව සහ මැදි කාලයේ සිට දිගු කාලය දක්වා එම ආයතනවල තිරසාර පැවැත්ම තහවුරු කෙරෙනු ඇත. ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට බැංකුවලින් ණය ලබා ගැනීමට ඇති ශක්‍යතාව පිළිබඳ ගැටලුවට පිළියම් යෙදිය හැකි තවත් එක් ක්‍රමයක් වන්නේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමඟ කටයුතු කරන විවිධ රාජ්‍ය ආයතන සහ වෙනත් සංවිධාන විසින් තාක්ෂණික දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබීමයි. එවැනි වැඩසටහන් මගින් මූල්‍ය විනය, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ආයතන සහ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට මූල්‍ය පහසුකම් සඳහා ඇති ප්‍රවේශය සහ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම ඔස්සේ එම ව්‍යාපාරවල කාර්යසාධනය සහ ප්‍රගතිය පිළිබඳ ධනාත්මක චක්‍රීය බලපෑමක් ඇති කළ හැකි අතර, ඒ හරහා ඔවුන්ගේ ලාභදායිත්වය සහ තිරසාරත්වය ඉහළ නංවමින්, නව්‍ය තාක්ෂණයන් යොදා ගැනීමට, ඵලදායිත්වය වැඩි කිරීමට සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ඉඩ සැලසෙනු ඇත. මෑතක දී දියත් කරන ලද ජාතික මූල්‍ය අන්තර්ගතතාව පිළිබඳ උපායමාර්ගය (NFIS) සහ දේශීය අගය දම සංවර්ධනය සඳහා වූ ප්‍රයත්න මගින් සර්ව සහභාගී මෙන්ම තිරසාර වර්ධනයක් හා සංවර්ධනයක් සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දායකත්වය ශක්තිමත් කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**දැනට පවත්නා අඩු උද්ධමන, අඩු පොලී අනුපාතික පරිසරය තුළ ආර්ථිකයේ ඇති වන අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය ශීඝ්‍ර වෙනස් වීමකට ලක් වීම අවශ්‍ය වේ.** එක අතකින්, අඩු පොලී අනුපාතික ව්‍යුහයක් මගින් ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට, විශේෂයෙන් ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට, ඔවුන්ගේ තැන්පතු මත ලැබෙන අඩු ප්‍රතිලාභ හේතුවෙන් සැලකිය යුතු අභියෝග ඇති කරයි. අනෙක් අතට, ආයෝජන වියදම් දිරිමත් කිරීම සඳහා ණය මත අය කෙරෙන පොලී අනුපාතික අඩු මට්ටමක පැවතිය යුතුය. කෙසේ වෙතත්, ශේෂ පත්‍රය දුර්වල වීම හේතුවෙන් මහා පරිමාණ ආයෝජන සහ ව්‍යාපාර සඳහා ඇති වන ඉල්ලුමට සරිලන ලෙස අරමුදල් සැපයීම මූල්‍ය ආයතනවලට බොහෝ විට අභියෝගාත්මක වේ. මේ අතර, මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති මූල්‍යනය කිරීමට විශේෂිත වූ මූල්‍ය ආයතන නොතිබීම ද මහා පරිමාණ ආයෝජකයින් සඳහා අරමුදල් සැපයීමේ මාර්ග සීමා කර ඇත. විශේෂයෙන් ම, මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දේශීය වශයෙන් මූල්‍යනය කෙරෙන ආයෝජන ප්‍රවර්ධනය කිරීමට රජය ප්‍රයත්න දරන පරිසරයක් තුළ, මෙම අඩුපාඩු හා අභියෝග ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය සංවර්ධනය කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාව පෙන්නුම් කරයි. අඩු තැන්පතු අනුපාතිකවලට අදාළ ගැටලුවලට පිළියම් යෙදීම සඳහා, විශේෂයෙන් ම, අඩු ප්‍රතිලාභ හේතුවෙන් දැඩි ලෙස බලපෑමට ලක් ව සිටින ඉතුරුකරන්නන් සඳහා මූල්‍ය ආයතන විසින් විකල්ප, නව්‍ය, ආරක්ෂාකාරී සහ ආකර්ෂණීය මූල්‍ය උපකරණ හඳුන්වා දීමට අවධානය යොමු කළ යුතුය. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා අඛණ්ඩව අතිරේක පොලියක් ලබා දීම හේතුවෙන් ඉහළ යන රජයේ පිරිවැය තුළින් ද විකල්ප මූල්‍ය උපකරණ හඳුන්වාදීමේ වැදගත්කම අවධාරණය කෙරෙයි. තවද, ජීවිත රක්ෂණ, වාර්ෂික දීමනා, ඒකක භාර, ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සහ කොටස් වැනි සාමාන්‍යයෙන් භාවිත නොවන සහ අඩු ප්‍රචාරණයක් සහිත මූල්‍ය උපකරණවල ප්‍රතිලාභ පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමට සහ මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. තවද, වර්තමානයේ දී මූල්‍ය ආයතන විසින් පිරිනමනු ලබන වත්කම් කළමනාකරණ සහ වෙනත් මූල්‍ය උපදේශන සේවා වැනි අතිරේක සේවා පිළිබඳව මහජනතාව වැඩි වශයෙන් දැනුම්වත් කළ යුතුව ඇත. වයස්ගත පුද්ගලයින් ඇතුළු ඉතුරුකරන්නන්ගෙන් සමන්විත ප්‍රජාව සඳහා එවැනි විකල්ප මගින් වඩා යහපත් ප්‍රතිලාභ ලබා දෙන මූල්‍ය උපකරණ සහ සේවා රැසක් සැපයෙනු ඇත. අපේක්ෂිත ඉහළ ආර්ථික වර්ධනය සහ අඩු පොලී

අනුපාතික පරිසරය තුළ මූල්‍ය ආයතනවල ණය ලබා දීමේ හැකියාව ඉහළ නැංවීමට අදාළව, මූල්‍ය අංශ ඒකාබද්ධ කිරීම පිළිබඳව පවතින හැකියාවන් පිළිබඳව යුහුසුළුව සොයා බැලිය යුතුය. එවැනි ඒකාබද්ධ කිරීම් මගින් දේශීය මූල්‍ය අංශය ශක්තිමත් කෙරෙනු ඇති අතර ම, විශාල ප්‍රාග්ධන පදනමක් නිර්මාණය කිරීම, මහා පරිමාණ ගනුදෙනු මූල්‍යනය කිරීමට සහ දේශීය ආයෝජන ආකර්ශනය කර ගැනීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම හා මූල්‍ය සේවාවල පරාසය පුළුල් කිරීම ඔස්සේ අංශය තුළ පවතින දුර්වලතාවලට ද පිළියම් යෙදීම මගින් ආර්ථිකයේ සමස්ත මූල්‍ය අංශයේ කාර්යක්ෂමතාව සහ ලාභදායිත්වය වර්ධනය වනු ඇත. විශේෂයෙන් ම, මූල්‍ය ආයතනවල වඩා ශක්තිමත් ශේෂ පත්‍ර මගින් අවශ්‍ය සහ ඵලදායී අංශ වෙත වැඩි වශයෙන් ණය ප්‍රවාහ ලබා දෙන අතරතුර, ආර්ථිකයේ ඉහළ යමින් පවතින මූල්‍යන අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාව ඉහළ නංවයි.

**රටේ පොලී අනුපාතික ව්‍යුහය තනි ඉලක්කමක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, විවිධ විශ්වාස කළ නොහැකි පාර්ශ්ව විසින් ප්‍රවර්ධනය කරනු ලබන දීමනා සහ අවස්ථා පිළිබඳව මහජනතාව වඩාත් සුපරීක්ෂාකාරී විය යුතුය.** ඉතිරිකිරීම් මත පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීමත් සමඟ, ඉතුරුම් සඳහා අඩු ප්‍රතිලාභ ලැබීම හේතුවෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ ඇතැම් සමාජ කණ්ඩායම් වඩාත් ඉහළ ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි පැවසෙන අවදානම් සහගත විකල්ප වෙත යොමු වේ. සාමාන්‍යයෙන් අඩු පොලී අනුපාතික පරිසරය තුළ නීතිවිරෝධී තැන්පතු ලබාගන්නා ආයතන නැවත නැගී සිටිමින් සක්‍රිය වනු දක්නට ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එවැනි ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම් පිළිබඳ නිරන්තරයෙන් අවවාද නිකුත් කළ ද, මෙවැනි ආයතන අතිශය ආකර්ෂණශීලී ප්‍රතිලාභ ලබා දෙන බවට පොරොන්දු වෙමින් තැන්පත්කරුවන් පොළඹවා ගැනීමට උත්සාහ කරයි. තවද, ශ්‍රී ලංකාවේ තහනම් කොට ඇති පිරමීඩ යෝජනා ක්‍රම, සුවිශේෂී ප්‍රතිලාභ පෙරොන්දු වන බහු මට්ටමේ අලෙවිකරණ (multi level marketing) ස්වරූපයෙන් හෝ ජාල අලෙවිකරණ අවස්ථා (network marketing opportunities) ලෙස ක්‍රියාත්මක වීමේ ප්‍රවණතාවක් ඇත. එවැනි ක්‍රම මත ආයෝජනය කිරීම ඉතා අවදානම් සහගත බැවින්, එවැනි තහනම් යෝජනා ක්‍රම සහ නීති විරෝධී ආයතන පිළිබඳව මහජනතාව විමසිලිමත් විය යුතුය. තහනම් කරන ලද යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමෙන් වැළකී සිටින අතරතුර, විකල්ප ආයෝජන අවස්ථා භාවිතයේ දී අවශ්‍ය සියලු පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමටත්, අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු කිරීමටත් කටයුතු කළ යුතුය. මහජනතාවට ඔවුන්ගේ ගැටලු සහ විමසීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙත ද යොමු කළ හැකි අතර, නීතිවිරෝධී, විශ්වාස කිරීමට අපහසු ලෙස වඩාත් ඉහළ ප්‍රතිලාභ ලබා දෙන මූල්‍ය යෝජනා ක්‍රමවල වංචාවන්ට හසු වීමෙන් වැළකී සිටීම සඳහා අවශ්‍ය සහාය ලබා ගත හැකිය.

**වසංගතය විසින් ඇති කරන ලද අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ ඩිජිටල් ගෙවුම් ක්‍රම භාවිතය ඉහළ ගිය ද, ශීඝ්‍රයෙන් වැඩි දියුණු වන තාක්ෂණය සඳහා මූල්‍ය අංශයේ පාර්ශ්වකරුවන්ගේ සූදානම සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා මහජනතාව අතර මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.** වසංගතය හේතුවෙන්, ඩිජිටල් ගෙවීම් පද්ධති වෙත වැඩි පිරිසක් ආකර්ෂණය කර ගැනීමට මූල්‍ය අංශයට අවස්ථා නිර්මාණය විය. ගෙවීම් පද්ධති ඩිජිටල්කරණය කිරීම මගින් පාරිභෝගිකයාට, ව්‍යාපාරිකයාට මෙන්ම, මූල්‍ය ආයතනයට ද විවිධ මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන ප්‍රතිලාභ සැපයෙයි. ගෙවීම් ඩිජිටල්කරණ ක්‍රියාවලියේ ආරම්භක ප්‍රාග්ධන ආයෝජනය සාපේක්ෂව ඉහළ වුවත්, කාසි, නෝට්ටු හා චෙක්පත් පදනම් කරගත් ගනුදෙනු හා සසඳන විට, වේගවත්භාවය සහ වැඩි දියුණු කළ විනිවිදභාවය සමඟ ගනුදෙනු සහ පරිපාලන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පවතී. පසු ගිය වසර කිහිපය මුළුල්ලේ ජංගම දුරකථන භාවිතය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බැවින්, ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම, විධිමත් මූල්‍ය පද්ධතියට මහජනතාව පුළුල් ලෙස ආකර්ෂණය වීම හරහා රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමට උපකාරී වන අතර, එමගින් සියලු දෙනාටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ ආර්ථික වර්ධන අපේක්ෂා ඉහළ නැංවෙනු ඇත. ගෝලීය වශයෙන් තාක්ෂණික වර්ධනය වේගවත් වීමත් සමඟ සමාජ මාධ්‍ය, විවෘත බැංකු ආකෘති ආදිය හරහා නව ගෙවීම් ක්‍රම වැඩිදියුණු වෙමින් පවතී. මේ සම්බන්ධයෙන්, බැංකු පද්ධතියට බ්ලොක්චේන් තාක්ෂණය (blockchain technology) යොදා ගැනීම සහ මුදල් පද්ධතියට අතථ්‍ය මුදල් (virtual currencies) හඳුන්වාදීම පිළිබඳව ගැඹුරින් සලකා බලමින් සිටියි. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය තුළින් මෙම අංශයෙහි වැඩිදියුණුව සඳහා අවස්ථාව නිර්මාණය කර ඇත. ජංගම දුරකථන හරහා ගෙවීම් සිදු කිරීමේ යෙදවුම්, ක්ෂණික ප්‍රතිචාර (QR) කේත ආශ්‍රිත ගනුදෙනු, විකුණුම් ස්ථානයේ සිදු කරන ගනුදෙනු (Point of Sales transactions) මෙන්ම, විද්‍යුත් වාණිජ්‍යය හඳුන්වා දීමත් සමඟ, ශ්‍රී ලංකාව විසින් ගෙවීම් පද්ධති ඩිජිටල්කරණය තුළ සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළ ද, ආර්ථිකයේ

කුඩා ප්‍රමාණයේ ගනුදෙනු බොහොමයක් කාසි, නෝට්ටු සහ චෙක්පත් ආදී වූ ක්‍රමවලින් සිදු වේ. මෙම පසුබිම යටතේ, ඩිජිටල් ගෙවීම් ක්‍රම වෙත මහජනතාව ආකර්ෂණය කර ගැනීම සඳහා මූල්‍ය අංශය විසින් ශ්‍රී ලංකාවේ පුළුල් ලෙස භාවිත වන ජංගම දුරකථන තවදුරටත් ප්‍රයෝජනයට ගත යුතුය. තරුණ පරපුර නව්‍යකරණ ගෙවීම් ක්‍රම ශීඝ්‍රයෙන් ග්‍රහණය කළ ද, ඒ පිළිබඳ වූ විශ්වාසය අඩු වීම සහ ආරක්ෂාව සම්බන්ධ සැලකිලිමත් වීම වැනි සාධක හේතුවෙන්, ජනගහනයෙන් වැඩි කොටසක් මෙම නවීන පද්ධති භාවිත කිරීමට පෙළඹී නොමැත. එබැවින්, මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සහ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා රටේ ඩිජිටල් ගෙවීම් භාවිතය ඉහළ නැංවීම ඔස්සේ තාක්ෂණික වැඩිදියුණුවීම්වල උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ.

**ශ්‍රී ලංකාව තුළ පාරිසරික ගැටලු මගින් සාර්ව ආර්ථිකයට ඇති කරනු ලබන සැලකිය යුතු බලපෑම ක්‍රමයෙන් ඉහළ යෑම මගින් තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති රාමුවක ඇති වැදගත්කම වඩාත් තහවුරු කෙරේ.** දේශගුණික විපර්යාස, වන විනාශය, භූමිය නිසරු වීම, දිරාපත් නොවන සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ඇතුළු ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම, වන ජීවීන්ට ඇති තර්ජන, වෙරළ ඛාදනය, වායු දූෂණය සහ ජල මාර්ග දූෂණය වැනි පසුගිය වසර කිහිපය තුළ නිරන්තරයෙන් මතු වූ පාරිසරික ගැටලු කෙරෙහි සාමාන්‍යයෙන් අඩු අවධානයක් යොමු වන්නේ, පරිසර සංරක්ෂණය ආර්ථික වර්ධන පරමාර්ථ හා නිරන්තරයෙන්ම පරස්පර වන හෙයිනි. කෙසේ වුවද, නැවත නැවත සිදුවන ස්වාභාවික විපත් සහ දේශගුණික විපර්යාස හේතුවෙන්, දේශීය නිෂ්පාදනය, ආර්ථික කටයුතු, ගෙවුම් තුලනය මෙන්ම බලශක්ති සුරක්ෂිතතාවයට ද බලපෑම් එල්ල කෙරෙන අතර, මෑතකාලීනව ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙන අවදානම් සහගත තත්ත්වය ඉහළ ගොස් ඇත. අතිශයින්ම අයහපත් කාලගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන සෘජු ප්‍රතිවිපාකවලට, එනම් මරණ හා ආර්ථික අලාභවලට, රටවල් ගොදුරු වීමේ අවදානම තක්සේරු කෙරෙන ගෝලීය දේශගුණික අවදානම් දර්ශකය මගින්, 2016 සිට 2018 දක්වා අඛණ්ඩව තෙවසරක් දේශගුණික විපර්යාසයන්ගෙන් වඩාත්ම පීඩාවට පත් වූ රටවල් දහය අතරට ශ්‍රී ලංකාව ඇතුළත් කොට ඇත. දේශගුණික විපර්යාස නිසා නිරන්තරයෙන් හටගන්නා වූ ප්‍රබල ස්වාභාවික ව්‍යසන හේතුවෙන් ශ්‍රී ලංකාව මුහුණපාන අවදානම් තත්ත්වය කෘෂිකාර්මික අංශයට විශාල තර්ජනයක් එල්ල කරයි. එබැවින්, මෙකී දේශගුණය හා සම්බන්ධ අවදානම් සහගත තත්ත්වය කෘෂිකාර්මික ඵලදායීතාව මත සෘජු බලපෑමක් එල්ල කරන අතර, ආහාර සුරක්ෂිතතාවට ද තර්ජනයක් ඇති කරමින් විෂමතා ඉහළ නංවයි. මේ අතර, වියළි කාලගුණික තත්ත්ව යටතේ මෙරට බලශක්ති සුරක්ෂිතතාව තදබල අවදානමකට ලක්වන අතර, ජල විදුලි උත්පාදනය වෙනුවට ඉහළ පිරිවැයක් සහිත හා පාරිසරික වශයෙන් අහිතකර තාප විදුලි උත්පාදනය කළ යුතු වන හෙයින් නියං කාලවල දී විදේශීය අංශයේ පීඩනයකට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදු වේ. තවද, දේශගුණික වශයෙන් මතුවන අභියෝග නිසා, විශේෂයෙන් තාක්ෂණ හා නවෝත්පාදන සඳහා යෙදවිය යුතු සම්පත් ප්‍රතිසංස්කරණ හා ප්‍රතිස්ථාපන කටයුතු වෙත යෙදවීමට සිදු වීම සහ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සඳහා ඇති අරමුදල් සීමා වීම හේතුවෙන්, ආර්ථික කටයුතුවලට බාධා විය හැකිය. එබැවින්, දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම අවම කර ගැනීම උදෙසා පූර්වෝපායික සහ සියලු පැතිකඩ ආවරණය වන පරිදි ආපදා කළමනාකරණ සහ තිරසර සංවර්ධන රාමුවක් අත්‍යවශ්‍ය වේ. ආපදා නිසා මතුවන අහිතකර ප්‍රතිවිපාකවලට පිළියම් යෙදීම සඳහා දැනටමත් පියවර කිහිපයක් ගෙන ඇති අතර, දේශගුණය නිසා ආර්ථිකය මුහුණ දෙන අවදානම් අවම කරන අතරම, ප්‍රජාවට එවැනි අවදානම් දරා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ආපදා වැළැක්වීම, ඒ සඳහා සූදානම, ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රකෘතිමත් කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රතිසංස්කරණය පිළිබඳව අවධානය යොමු කෙරෙන ප්‍රතිපත්ති රාමුවක් තුළ මෙසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග තවදුරටත් ශක්තිමත් කළ යුතුය. තවද, රටේ ආපදා කළමනාකරණ තත්ත්වය වැඩි දියුණු කිරීම සහ තිරසාර වර්ධන මාවතක් ඔස්සේ ආර්ථිකය මෙහෙය වීම උදෙසා, සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ පාරිසරික බලපෑම් පිළිබඳ පුළුල් ඇගයීම් සඳහා විශේෂ අවධානයක් ලබා දීම, පරිසර දූෂණය කරන්නන්ගෙන් ඒ සඳහා දඩුවම් ගාස්තුවක් අය කිරීමේ ක්‍රමය, පරිසර හානි හා සම්බන්ධ බදු, හරිත මූල්‍ය උපකරණ ආදී වූ පරිසරය හා සම්බන්ධ වෙළඳපොළ උපකරණ දියුණු කිරීම සහ ප්‍රවර්ධනය, පරිසර සංරක්ෂණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම සහ පරිසරය සුරැකීම සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ඇති කිරීම, ආයතනික සහාය ඇතිව නියාමන සහ අධීක්ෂණය කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම ආදිය පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

**නිවැරදි සහ නියමිත කාලයට නිකුත් වන දත්ත, තොරතුරු පදනම් කර ගත් සමාජයන්හි ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.** උසස් තත්ත්වයේ දත්ත මගින් ප්‍රතිපත්ති සම්පාදකයින් හට සහ ආර්ථිකයේ පාර්ශ්වකරුවන් හට විකල්ප ඇගයීම් සිදු කිරීමට සහ

දැනුම්වත් තීරණවලට එළඹීමට අවස්ථාව සලසා දෙන අතර, දුර්වල සහ ප්‍රමාද වූ දත්ත නිවැරදි විනිශ්චයයන් මත පදනම් නොවූ මහජන මතයන් ඉදිරිපත් වීමට මෙන්ම, සමාජ ආර්ථික පිරිවැයක් ඇති කරමින් ප්‍රතිපත්තිමය දෝෂ සඳහා මග පාදන අතර, එමගින් ආර්ථික ප්‍රගතියට සහ ස්ථායීතාවයට බලපෑම් ඇති වේ. මෙවැනි ගැටලු අවම කිරීමට නියැදිවල නිවැරදි බව හා ප්‍රමාණවත් ආවරණයක් සහිත බව, සුපරීක්ෂාකාරී ලෙස දත්ත සම්පාදනය කිරීම සහ කඩිනමින් බෙදා හැරීම යන කරුණු වැදගත් වේ. මේ සඳහා ඉහළ විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් දත්ත සම්පාදන ක්‍රමවේද සහ සම්මතයන්ට අනුගත වීම අවශ්‍ය වේ. වසංගත තත්ත්වය මධ්‍යයේ රට වසා දැමීම, සංචරණය සීමා කිරීම සහ සාම්ප්‍රදායික නොවන ක්‍රම හරහා දත්ත එක්රැස් කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම සහ ප්‍රමාණවත් මෙවලම් නොමැති වීම හේතුවෙන් සාම්ප්‍රදායික දත්ත එක්රැස් කිරීමේ සහ සම්පාදනය කිරීමේ ක්‍රමවේද අභියෝගයට ලක් විය. වසංගත තත්ත්වය තුළ නිවසේ සිට වැඩ කිරීම, මංගත ක්‍රමවේද භාවිත කරමින් අවිධිමත් සේවා සැපයීම ආදී වූ නව ආර්ථික කටයුතු පිළිබඳ දත්ත එක්රැස් කිරීමට නොහැකි වීම දැනට පවතින දත්ත සම්පාදන ක්‍රම භාවිත කරමින් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම හා සම්බන්ධ ප්‍රධාන ගැටලුවකි. වෙනස්වන තත්ත්වයන්ට කඩිනමින් අනුගත වන අංශයක කාර්ය සාධනය තක්සේරු කිරීම සඳහා පූර්ව නිශ්චිත කාලපරාසයන්ට අනුව දත්ත ලබා ගන්නා සාම්ප්‍රදායිකව සැකසුනු ප්‍රවේශයන් ප්‍රමාණවත් නොවේ. එබැවින්, දත්ත එක්රැස් කිරීම සහ බෙදා හැරීම පිළිබඳ වගකිව යුතු රාජ්‍ය ආයතනවල ශක්‍යතා වැඩි දියුණු කිරීම ඉතා වැදගත් වන අතර, එවැනි අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය දැනුම, විශේෂ ප්‍රාගුණ්‍යය සහ තාක්ෂණය ආදියෙන් අදාළ කාර්ය මණ්ඩල සවිබල ගැන්වීම අත්‍යවශ්‍ය වේ. ලොව පුරා රටවල් ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ දර්ශක නිර්ණය කිරීම උදෙසා ඉතා කෙටි කාල පරාසයක් තුළ දත්ත ලබා ගැනීම සඳහා මංගත සමීක්ෂණ භාවිත කිරීමට නැඹුරු වී සිටියි. ආර්ථික සංඛ්‍යාන බෙදාහැරීමේ ප්‍රමාදයන් සහ පූර්ව නිශ්චිත කාලසීමාවක් තුළ දී තාවකාලික ඇස්තමේන්තු නිකුත් කිරීම සහ එම දත්ත පසුව විශාල ලෙස සංශෝධනය කිරීම හේතුවෙන් වෙළඳපොළ වෙත නිවැරදි නොවන අදහස් මුදා හැරීම නිසා වසංගත කාලය තුළ එවැනි ක්‍රමවේදවල වැදගත්කම ඉස්මතු විය. ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා, නිසි මූලාශ්‍ර, නිසි කළමනාකරණය සහ නිසි දත්ත විශ්ලේෂණය මගින් සහාය ලබා ගනිමින්, කාර්යක්ෂම දත්ත කළමනාකරණ ක්‍රියාදාම වැඩි දියුණු කිරීම ප්‍රතිපත්ති සම්පාදනයේ කේන්ද්‍රීය කොටසක් වශයෙන් සැලකිය හැකිය. කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) සහ ස්වයංක්‍රීයකරණය වැනි තීරණ ගැනීම සඳහා සහාය වන මෙවලම් භාවිත කිරීමේ හැකියාව ද බොහෝ දුරට තීරණය වනුයේ දත්තවල නිරවද්‍යතාවය සහ එම දත්ත නියමිත කාලයට ලැබේ ද යන්න මතය. උසස් තත්ත්වයේ හා නියමිත කාලයට ලැබෙන දත්තවල අවශ්‍යතාවය සහ දත්ත එක් රැස් කිරීම සඳහා මෙන්ම දත්ත බෙදාහැරීම සඳහා නව තාක්ෂණයන් භාවිත කිරීමේ වැදගත්කම මෙයින් නැවත අවධාරණය කෙරෙන අතර, එමගින් ආර්ථිකයේ පාර්ශ්වකරුවන් හට කඩිනම් සහ නිවැරදි තීරණ ගැනීමට සහ දැනුම්වත් නිගමනවලට එළඹීමට පහසුකම් සැපයේ.

**සාර්ව ආර්ථික ස්ථායීතාව වැඩිදියුණු කරන අතරම, ඉහළ, තිරසාර සහ සැමට ප්‍රතිලාභ හිමිවන වර්ධන මාවතක් ඔස්සේ ආර්ථිකය ඉදිරියට යැම තහවුරු කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්ති ගැළපුම්වල කඩිනම් අවශ්‍යතාව සහ සංකීර්ණභාවය ඉහතින් සංක්ෂිප්ත කරන ලද කරුණු මගින් අවධාරණය කෙරෙයි.** 2020 වසරේ දී විවිධ අංශ වෙතින් එල්ල වූ බාධක මධ්‍යයේ, රජයේ සහ මහ බැංකුවේ කඩිනම් ප්‍රතිපත්ති ප්‍රතිචාරවල සහාය ඇතිව, ශ්‍රී ලංකා ආර්ථිකය කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ සිය හැකියාව යළිත් වරක් පෙන්නුම් කළේය. කොවිඩ්-19 වසංගතය මෙන්ම, ජනතාවගේ බහුතර කැමැත්ත මත ශක්තිමත් රජයක් ස්ථාපිත කිරීම මගින් ආර්ථිකය දිගු කාලයක් මුළුල්ලේ මුහුණ දුන් අවදානම්වලට විසඳුම් යෙදීම සඳහා ප්‍රතිපත්ති යළි හැඩ ගැස්වීමට ඉඩ ප්‍රස්ථාව සැලසුණි. 2020 වසරේ දී මෙන්ම, කෙටි කාලීනව ආර්ථිකය දුෂ්කර මාවතක් ඔස්සේ සුපරීක්ෂාකාරීව ඉදිරියට යන අතරම, පෞද්ගලික අංශයේ ද සහාය ඇතිව ආර්ථිකයේ සමස්ත ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඇතුළු රජයේ අපේක්ෂිත සාර්ව ආර්ථික රාමුව ක්‍රියාත්මක කිරීම මගින් මැදි කාලීන ආර්ථික දක්ම ශක්තිමත් කෙරෙනු ඇතැයි අපේක්ෂිත අතර, එමගින්, සමස්තයක් වශයෙන් මුළු රටේම මෙන්ම, එහි සියලුම ජන කාණ්ඩයන්හට රජය බලාපොරොත්තු වන ලෙස සෞභාග්‍යය පිළිබඳ අරමුණු අත්පත් කර ගැනීමට හැකියාව උදා කර දෙනු ඇත.